# RAJAPAKSE & COMPANY



# රාජපක්ෂ
## ඇන්ඩ් කොම්පැනි
හෙවත්
# ඝාතක වංශය

රාජපක්ෂ
ඇන්ඩ් කොම්පැනි
හෙවත්
# ඝාතක වංශය

# MAIN INDIVIDUALS ARRESTED AND CHARGED



**SHIRANTHI RAJAPAKSE** - Imminent arrest of misappropriation of money Rs. 200 Mn. Relating to Carlton House and Siriliya Funds.

**GOTABHAYA RAJAPAKSE** - Indicted/Charged for Avant Garde fraud exceeding Rs. 3000 Mn.

**BASIL RAJAPAKSE** - Charged for misappropriation of funds/Money Laundering and purchase of property with illegal funds Rs. 800 Mn.

**NAMAL RAJAPAKSE** - Charged for misappropriation of money and Money Laundering relating to Gower & Company/N.R. Consultancy/Hello Corporation Rs. 290 Mn.

**YOSHITHA RAJAPAKSE** - Charged for purchasing property in grandaunt's name (Daisy Forrest) with illegal money Rs. 120 Mn.

**MAHINDANANDA ALUTHGAMAGE** - Charged for purchasing property in Colombo with illegal funds and non Declaration of Assets Rs. 600 Mn.

**JOHNSTON FERNANDO** - Charged for misappropriation of funds and non Declaration of Assets and Sathosa frauds Rs. 420 Mn.

**KEHELIYA RAMBUKWELLA** - Charged for misappropriate of funds and non Declaration of Assets Rs. 320 Mn.

**WIMAL WEERAWANSA & WIFE** - Charged for Passport fraud/misappropriate of funds and misuse of government vehicles Rs. 200 Mn.

**UDAYA GAMMANPILA** - Charged for forging Power of Attorney of an Australian citizen Rs. 320 Mn.

**SAJIN VASS GUNAWARDENA** - Charged for Misappropriation of funds/misuse of government vehicles/non Declaration of Assets Rs. 780 Mn.

**LALITH WEERATUNGE** *Secretary/President* - Charged for giving Rs.750 Mn of Telecom money for purchase of Sil Redi during Presidential campaign

**GAMINI SENERATH** *Chief of Staff, President's Office* - Imminent arrest for Money Laundering and acquiring illegal assets Rs. 2000 Mn.

**TIRAN ALLES** - Charged for misappropriation of Tsunami funds (Rs.600 Mn) given for building houses as Chairman RADA

**NALAKA GODAHEWA** *Chairman Securities & Exchange Commission* - Charged for misappropriation of funds Rs. 180 Mn.

**CHANUKA RATWATTE** *(Anuruddha Ratwatte's son)* - Charged for financial fraud of Primary Dealer Entrust Rs. 3000 Mn.

**DUMINDA SILVA** *(Close friend of Mahinda and Gotabhaya)* - Sentenced to death for murder of Bharatha Lakshman

# MORE ARRESTS TO FOLLOW


කොළඹදී පවත්වන්නට නියමිත ආගමික
සමුළුවකට සහභාගීවීමට පැමිණි ඇමරිකානු
ටෙලිවැන්ජලිස්ට් සභාවෙහි ප්‍රධානී හා නිකායික
නොවන ලෝක විපර්යාසකයින්ගේ පල්ලියේ
නිර්මාතෘ ක්‍රෙෆ්ලෝ ඒ. ඩොලර්
තවත්
දෙදෙනෙකු සමග පැමිණ හිටපු
හමුවේ යාඥාවක
5
ශිරන්ති රාජපක්ෂගේ
රත්තරන් ප්‍රාවාරම
2015
15
මොහාන් පීරිස් සමඟ
අධිකරණය කෙළසමින්
මහින්ද රාජපක්ෂ
කළ අසංවර වැඩ
කොටින්ගෙන් ඇල්ලූ
හමුදාවෙන්
මහින්දගේ ප්‍රචාරක දැන්වීම්වලින්
මිලියන 101ක මුදලක්
ස්වාධීන රූපවාහිනියට
අයවීමට තිබෙනවා
බැසිල් නිසා ඇමැතිවරු
අන්ත අසරණ වුණු
හැටි ගැන
16
අරලියගහ මන්දිරයේ
කුමාර සැප
පවුල
රාජපක්ෂ



අනේ මට වුණු වියෝ යා....




මහින්ද අලුත් පක්ෂයක් හදනවාලු...
ඒකාධිපතියාගේ හොරු රැළෙන් ඒ ගැන ප්‍රචාරණයක්

# RAJAPAKSE & COMPANY



# රාජපක්ෂ ඇන්ඩ් කොම්පැනි

හෙවත්

# ඝාතක වංශය

දැහැමි පුරවැසි පදනම



**ISBN** 978-955-7823-99-3

ප්‍රකාශනය- දැහැමි පුරවැසි පදනම

*dahamipurawasifoundation@gmail.com*

| | |
|---|---|
| පිදුම | 4 |
| පෙරවදන | 5 |
| හැඳින්වීම | 7 |
| රාජපක්ෂ ඉතිහාසය | 9 |
| මහින්ද රාජපක්ෂගේ දේශපාලන ක්‍රමෝපාය | 23 |
| ශිරන්ති වික්‍රමසිංහ රාජපක්ෂ | 32 |
| ලක්ෂමන් නාමල් රාජපක්ෂ | 44 |
| යෝෂිත කණිෂ්ක රාජපක්ෂ | 51 |
| බැසිල් රෝහණ රාජපක්ෂ | 55 |
| ගෝඨාභය නන්දසේන රාජපක්ෂ | 60 |
| රාජපක්ෂ මාෆියාව | 72 |
| මහින්ද රාජපක්ෂ ලංකාවේ දේශපාලන සංස්කෘතිය විනාශ කල හැටි | 76 |
| මහින්ද රාජපක්ෂගේ දූෂිත මැති ඇමතිවරු සහ දිස්ත්‍රික් මට්ටමේ දේශපාලන මැරයින් | 78 |
| ආගම තුලින් දේශපාලන බලය තහවුරු කර ගත් හැටි | 96 |
| Rajapakse & Company | 103 |
| මහා පරිමාණ ව්‍යාපෘතීන් හරහා සිදු කළ මංකොල්ලය | 125 |




# පිදුම

ශ්‍රී ලංකා ඉතිහාසයේ "වනචර දශකය" නමින් හඳුන්වන මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ රාජපක්ෂ නඩය රට පාලනය කල 2005 - 2015 කාල පරිච්ඡේදය ලංකා දේශපාලන ඉතිහාසයේ ඉතාමත්ම තීරණාත්මක කාල පරිච්ඡේදයකි.

මහින්ද රාජපක්ෂ ප්‍රමඛ රාජපක්ෂ පවුල දේශපාලන බලය අත්කර  ගැනීමෙන් පසුව එම දේශපාලන බලය උපයෝගී කරගෙන මෙරට ජනතාවට අයත් රජයේ මුදල් රුපියල් බිලියන ගණනින් සොරකම් කර ගැනීමට තම පවුලේ සාමාජිකයනට සහ ගජ මිතුරනට අවස්ථාව සලසා දුනි. මුළුමහත් සමාජයම භීතියට පත් කරමින් රාජපක්ෂ ජුන්ටාව මහජනතාව ගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සුනු විසුනු කොට, තමන්ට එරෙහි වූ ජනමාධ්‍යවේදීන්, සිවිල් සමාජීය ක්‍රියාකාරකයින් සිය ගණනක් අතුරුදහන් කරනු ලැබීය. මෙම ඒකාධිපති පවුල්වාදී රාජපක්ෂ ජුන්ටාව බිඳ දැමීම පහසු කාර්යයක් නොවීය.

2015 ජනවාරි 08 දින සිදු කල දේදුනු විප්ලවයෙන් එම ඉතාමත් අසීරුව තිබූ කාර්ය ඉටු කිරීමට ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කල සියලුම දේශපාලන පක්ෂවල නායකයන්ට හා සිවිල් සංවිධානවල හා එහි නායකයන්ට මෙම ග්‍රන්ථය උපහාරයක් වේවා.



# පෙරවදන

මහින්ද රාජපක්ෂ මහතා පිළිබඳව මෙබඳු ග්‍රන්ථයක් එළි දැක්වීම කුමන කරුණක් නිසා සිදුවූවාද යන්න පිළිබඳව පාඨකයන් තුල මහත් කුතුසක් ඇතිවන බව නොඅනුමය.

1970 ලාබාලම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වූ මහින්ද 2005 දී ලංකාවේ විධායක ජනාධිපති ධූරයට පත්වීම දක්වා ඔහුගේ දේශපාලන ක්‍රියාකාරකම් හා ඔහු දේශපාලනයට ඇතුලත්වීමට පෙර ඔහුගේ ක්‍රියාකාරකම් හා ඔහුගේ පවුල් පසුබිම පිළිබඳව සැකෙවින් දැක්වීම මෙම ග්‍රන්ථය රචනා කිරීමේ එක් අරමුණක් විය.

මහින්ද රාජපක්ෂ මෙරට දේශපාලන ඉතිහාසයේ සුවිශේෂ පුද්ගලයකු වන්නේ කෙසේද? ඔහුගේ ක්‍රියාකලාපය තුලින් ලංකාවේ දේශපාලන සංස්කෘතියේ ඇති වූ ප්‍රබල වෙනස්කම් හා එම වෙනස්කම් නිසා සමස්ත ශ්‍රී ලාංකික සමාජයට ඉන් ඇතිවූ බලපෑම පිළිබඳව විමර්ශනශීලීව විශ්ලේෂණය කිරීම මෙම ග්‍රන්ථයේ ප්‍රධාන අරමුණයි.

මහින්ද රාජපක්ෂ 1970 පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තේරීපත් වී 2005 දී ශ්‍රී ලංකාවේ ජනාධිපති ධූරයට පත් විය. 2015 දී ජනාධිපතිවරණයෙන් පරාජය වී 2015 පාර්ලිමේන්තු මැතිවරණයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් නැවත සාමාන්‍ය මන්ත්‍රීවරයකු වශයෙන් පාර්ලිමේන්තුවට පිවිසීය. මහින්ද ගේ ඉදිරි දේශපාලන පැවැත්ම කුමන ආකාරයකට ගෙන යාම සඳහා ඔහු අනුගමනය කරමින් සිටින කූට ක්‍රියාදාමය හෙළි කිරීම ද මෙම ග්‍රන්ථයේ තවත් එක් අරමුණක්.

පසුගිය දසක හතරහමාරක කාලයක් තුල මහින්ද ඔහුටම ආවේනික වූ දේශපාලන ගමනක යෙදුනු පුද්ගලයා වශයෙන් හැඳින්වීම නිවැරදි යැයි සිතමි.

නිදහස ලැබීමෙන් පසුව ඇතිවූ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය තුල ඩී.එස්.සේනානායක, ඩඩ්ලි සේනානායක, සර් ජෝන් කොතලාවල, එස්.ඩබ්.ආර්.ඩී.

*ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, සර් ජෝන් කොතලාවල, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක*



බණ්ඩාරනායක, සිරිමාවෝ බණ්ඩාරනායක, ජේ.ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස, ඩී.බී. විජේතුංග, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග යන ලංකාවේ අගමැති හා ජනාධිපති ධුර දැරූ සියලු මහජන නායකයන්ට වඩා සුවිශේෂ චරිත ලක්ෂණයන් මහින්ද රාජපක්ෂ මහතා සතුව පැවති බව ඔහුගේ දේශපාලන ක්‍රියවලිය සියුම් ලෙස විග්‍රහ කිරීමේ දී පැහැදිලිවන කරුණකි.

අද ඔහු දේශපාලන වශයෙන් අනාථ වී සිටියද ඔහුගේ දේශපාලන ඉතිහාසය හා ක්‍රියාකාරකම් විශ්ලේෂණය කර බලන විට මෙරට පහල වූ සියලුම රාජ්‍ය නායකයන්ට වඩා ඉතා සියුම්, ශෛකධිරාටික දේශපාලන දක්මකින් යුතුව ක්‍රියා කල වංචාකාරීම පුද්ගලයා වශයෙන් ඔහුව හැඳින්විය හැකිය.

ඔහුගේ ඉලක්කය කරා යාමට කුමන අන්දමේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කල යුතු ද යන්න එම ක්‍රමෝපායන් රටේත් ජනතාවගේත් සුබ සිද්ධියට කුමන ආකාරයකින් බලපෑවත් තම අභිමතාර්ථය ඉටු කර ගැනීම පමණක් සිතා ඉතාම ආත්මාර්ථකාමීව කටයුතු කල පුද්ගලයකු ලෙස මහින්ද ක්‍රියාකර ඇති බව ඔහුගේ 45 අවුරුද්දක දේශපාලන ක්‍රියාකාරකම් වලින් හොඳින්ම ඔප්පු වේයි.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිවීමෙන් පසුව ගතවූ දසකයකට ආසන්න කාලයක් තුල ශ්‍රී ලාංකික ජන සමාජයේ ඇතිවූ සියලුම විපර්යාසයන්ට මහින්දගේ රාජ්‍ය පාලන ක්‍රියාවලිය ඉතා සෘජු ලෙසට බලපෑ බව ඉතා පැහැදිලි කරුණකි.

මහින්ද රාජපක්ෂ 2005 -2015 කාලය තුල ශ්‍රී ලාංකික ජන සමාජයට කොතරම් අශිලාචාර, පාදඩ දේශපාලන සංස්කෘතියක් බිහි කරනු ලැබුවේ ද කිවහොත් එම පාදඩ දේශපාලනය සමාජයේ සියලු කොටස් තුල කිඳා බැස ඉන් ගොඩ ඒමට නොහැකි තරමට ඔත්පල වී ඇත. මහින්ද බිහි කරනු ලැබූ එම පාදඩ දේශපාලන සංස්කෘතිය සමාජය තුල පැතිරවීමට ඔහු අනුගමනය කළ ක්‍රියා මාර්ගය සාධක සහිතව සමාජය ඉදිරියේ තැබීම මෙම ග්‍රන්ථයේ තවත් අරමුණකි.

මහින්ද රාජපක්ෂ සහෝදර සමාගම සහ පුත්‍ර සමාගම විසින් ලාංකීය ජන සමාජයට කර ඇති විනාශය මිනිස්ඝාතන, මහජන දේපල සොරකම්කිරීම, මත්ද්‍රව්‍ය හා මත්කුඩු ජාවාරම ඇතිකිරීම, ප්‍රජාතන්ත්‍රවාදය හා මානව අයිතීන් පාගා දැමීම, ඇතුලු මුලු මහත් සමාජයම පාදඩ දේශපාලනයට නතු කිරීම, අධිකරණය පොලීසිය දේශපාලනීකරණය කිරීම, ආදී සියලුම කරුණු මෙම ග්‍රන්ථය මගින් සාදක සහිතව සමාජ ගත කිරීමට අප අදහස් කලේ අද දවස ගැන පමණක් කල්පනා නොකර නූපන් පරපුරවෙනුවෙන් අපගේ යුතුකම ඉටු කිරීමට බව නිහතමානීව සටහන් කරනු කැමැත්තෙමු.

*-සංස්කාරක*



*සිරිමාවෝ බණ්ඩාරනායක, ජේ.ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස, ඩී.බී. විජේතුංග, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග*



# හැඳින්වීම

මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ ඔහුගේ පවුලේ සාමාජිකයින් හා ගජමිතුරන් පිළිබඳ සත්‍ය තොරතුරු ඇතුලත් මෙම ග්‍රන්ථය ***"රාජපක්ෂ ඇන්ඩ් කොම්පැනි හෙවත් සාටක වංශය"*** නමින් හඳුන්වනු ලැබුවේ විශේෂ හේතුවක් නිසාය.

මහින්ද රාජපක්ෂ ගේ නියම නම පර්සි මහේන්ද්‍ර රාජපක්ෂයි. නමුත් ඔහු කිසි දිනක පර්සි මහේන්ද්‍ර නාමය භාවිතා කර නැත. ඔහුගේ නාම යෝජනා පත්‍රවල සඳහන්ව ඇත්තේ පර්සි මහේන්ද්‍ර රාජපක්ෂ යනුවෙනි. මහින්ද මෙම ප්‍රශ්ණයට කදිම පිළිතුරක් ඔහුගේ චරිතාපදාන ග්‍රන්ථවල සඳහන් කර ඇත එනම් ගමේ ජනතාව ඔහු ඇමතුවේ "මහින්ද" නමින් බවයි. එයට ගරු කිරීමක් වශයෙන් මහින්ද රාජපක්ෂ යනුවෙන් දේශපාලන කටයුතු සඳහා භාවිතා කල බව තවදුරටත් දන්වා ඇත.

මහින්ද පිළිබඳව කිසිදු චරිතාපදානයක් හෝ ග්‍රන්ථයක් ඔහු ජනාධිපති තනතුරට පත්වන තුරු පලවී නැත. ජනාධිපති තනතුරට පත් වූ පසුව එළි දක්වන ලද චරිතාපදානවල බොහෝමයක් කරුණු ඔහු විසින් ප්‍රබන්ධ කරන ලද කතාන්තර විනා සත්‍ය තොරතුරු නොවේ. එමනිසා මෙම ග්‍රන්ථයෙන් මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ පරපුර පිලිබඳ සත්‍ය තොරතුරු ජනතාවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමු.



# 1
# රාජපක්ෂ ඉතිහාසය

ඈත අතීතයේ හෙවත් 1800 ගණන් වල වීරකැටිය ප්‍රදේශයේ තිබුනේ වලව් කිහිපයක් පමණකි. අග්ගරහැරේ වලව්ව, ඉත්තදෙමලිය වලව්ව, රළුවේ වලව්ව සහ බුද්ධියාගම වලව්ව යනු ඉන් කිහිපයකි. මේ අතරින් බුද්ධියාගම වලව්වට අධිපති වූයේ දොන් කොනස්ටන්ටයින් ද සිල්වා වනිගචින්තාමනී මොහොට්ටාල හෙවත් "සපුගොඩ රාළ" නම් වූ ප්‍රභූවරයෙකි. මෙම වලව්වේ ආවතේව කම් කලේ පැල්මඩුල්ලේ සිට වීරකැටියට පැමිණ සිටි මාටින් රාජපක්ෂ නමැත්තෙකි. ඔහු මැදමූලන පදිංචි ව සිටිමින් බුද්ධියාගම වලව්වට සේවය කරමින් සිටියේය. 1874 දී සපුගොඩ රාළ මියගිය අතර, ඔහුගේ දේපල වලට උරුමකම් කීමට කිසිවෙකු සිටියේ නැත. ඒ අතර මාටින් රාජපක්ෂ එහි තිබූ සියලු වටිනා දේපල තම මැදමූලන නිවසට ගෙන ගියේය. පසුව රජය මැදිහත් වී බුද්ධියාගම වලව්වට අයත් දේපල නිරවුල් කිරීම සඳහා බූදල් නඩුවක් පැවරුවත් එම දේපල වලට උරුමය පෑමට සපුගොඩ රාළ ගේ ඥාතීන් කිසිවෙකු ඉදිරිපත් නොවූහ. උසාවියට ඉදිරිපත් වූ එකම පුද්ගලයා වූ මාටින් රාජපක්ෂ වෙත උසාවි නඩු තීන්දුවක්



*2005 - 2015 රාජපක්ෂ වනචර දශකයේ දී මහජන මුදල් බිලියන ගණනකින් කොල්ල කෑ රාජපක්ෂ පවුලේ "මැදමූලන පැරණි නිවස" මැදමූලන වලව්ව ලෙස හැඳින්වුවද මෙය වලව්වක් නොව සාමාන්‍ය සිංහල උලු සෙවිලි කළ කුඩා නිවසකි.*

මගින් සපුගොඩ රාළට අයත් සියලු දේපල හිමිවිය. මේ බුද්ධියාගම වලව්ව අද එහි නැත. 1885 දී තනන ලද උඩුකිරිවිල වැවට ඒ වලව්ව තිබූ භූමි භාගය යට විය.

මාටින් රාජපක්ෂ හට ගොවිතැන් පිළිබඳවත් හරකුන් සම්බන්ධයෙනුත් තිබූ දැනුමත් ඔහු ඉංග්‍රීසි ආණ්ඩුව සමග පැවැත්වූ ඇයි හොඳැයියත් හේතු කොට ගෙන "විදාන ආරච්චි" (ගම් 4කට ප්‍රධානියා) තනතුර ඉංග්‍රීසි ආණ්ඩුවෙන් ප්‍රධානය කෙරිණි. එතැන් සිට මැදමූලන ගෙදර " මැදමූලන වලව්ව" බවට පත්විය. බුද්ධියාගම වලව්ව වෙනුවට මැද මූලන වලව්ව බිහි වූයේ එලෙසය.

## රාජපක්ෂවරුන්ගේ දේශපාලන ආගමනය

මෙම පවුලේ මුලින්ම දේශපාලනයට ආවේ දොන් මැතිව් රාජපක්ෂ (ඩී.එම්. රාජපක්ෂ) මහතාය. ඩී.එම්. රාජපක්ෂට දොන් අල්විස් රාජපක්ෂ (ඩී.ඒ. රාජපක්ෂ) නමින් තවත් සහෝදරයෙක් ද සහෝදරියක් ද සිටියහ.

ඩී.එම්. රාජපක්ෂ මහතාගේ දේශපාලන සම්ප්‍රාප්තියද අපූරු කතාවකි. ලංකාවට ඡන්ද බලය ලැබීමෙන් පසුව ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ 1931 දී පිහිටුවන ලද ප්‍රථම රාජ්‍ය මන්ත්‍රන සභාවට හම්බන්තොට ආසනය සඳහා අපේක්ෂකයෝ දෙදෙනෙක් තරග වැදුනහ. ඉන් ජයග්‍රහණය කලේ එවකට හම්බන්තොට සුප්‍රකට නීතිඥයෙකු වූ වින්ස්ටන්ට් ස්ටුවර්ට් ද සිල්වා වික්‍රමනායක මහතාය. එකල ලංකා ජාතික සංගමයෙන් තරගයට ඉදිරිපත් වූ ඒ මහතා ඡන්ද 15984ක් ලබා ජයග්‍රහණය කලේය. ඩී.ඇම්. රාජපක්ෂ මහතා වික්‍රමනායක නීතිඥ මහතාගේ ලිපිකරු තනතුරක් දරමින් සිටියේය. වික්‍රමනායක නීතිඥ මහතා විසින් ඔහුගේ ගනුදෙනු කාරියක් වූ ටී.කේ. ඩූල් නමැති මහත්මියකට ගෙවිය යුතු මුදලක් සාවද්‍ය ලෙස තමන් පරිහරණයට ලබාගත් බවට ඩූල් මහත්මිය අධිකාරණයට පෙත්සමක් ඉදිරිපත් කළාය. පෙත්සම විභාග කල ශ්‍රේෂ්ඨාධිකරණය වික්‍රමනායකගේ නීතිඥ වෘත්තිය හයමසකට අත්හිටුවන ලදි. මෙම පෙත්සම පිටුපස සිට එම කුමන්ත්‍රණය මෙහෙය වන ලද්දේ රාජපක්ෂ ලියන මහත්තයා බව තතු දන්නා පැරැන්නෝ කියති.

එම කුමන්ත්‍රණයේ ප්‍රතිඵලය අපට දැකගන්නට හැකිවන්නේ 1936 මැතිවරණයේදීය. එම මැතිවරණයයේදී ඩී.එම්. රාජපක්ෂ මහතා නීතිඥ වික්‍රමනායක මහතාට එරෙහිව හම්බන්තොට ආසනයට තරග වැදී වික්‍රමනායක මහතා පරාජයට පත් කළේය.

එහෙත් ඩී.එම්. රාජපක්ෂ මහතාට එතරම් දිගු කලක් මන්ත්‍රී පදවියේ කටයුතු කරන්නට අවකාශ ලැබුනේ නැත. ඔහු පාර්ලිමේන්තු සභා ගර්භය තුළ කථාවක් පවත්වමින් සිටියදී හෘදයාබාධයක් වැළඳී අභාවයට පත්විය. ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ මෙවැන්නක් සිදුවූ පළමු වතාව එය විය. "රුහුනේ සිංහයා" නමින් විරුදාවලිය ලබාසිටි ඩී.එම්. රාජපක්ෂගේ අභාවයෙන් පසුව ඩී.එම් ගේ සොහොයුරු ඩී.ඒ. රාජපක්ෂ තම සහෝදරයාගේ පුරප්පාඩුවට නිතරගයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත්විය. මහින්ද රාජපක්ෂ මහතා අද වේදිකාවල සහ රූපවාහිනී නාලිකාවල දරු දූරියන් වට කරගෙන තම ඉතිහාස කතාව කියද්දි කියන්නේ තම පියා කුඹුරේ සිට වක්කඩින් අත පය සෝදා ගෙන තම නාම යෝජනා පත්‍රයට අත්සන් කල බවකි. එම සිද්ධිය තම මතකයේ ඇති බවද ඔහු කියයි. මෙය සිදුවූයේ 1945 මැයි 18 වැනි දින ඩී.එම්. මිය යාමෙන් පසුවය. ඩී.ඒ. ගේ පත්වීම කෙරුණේ ඒ ආසන්නයේ නම් ඒ වනවිට මහින්ද ඉපදී සිටින්නට හැකියාවක් නැත. මන්ද මහින්ද ඉපදී ඇත්තේ 1945 නොවැම්බර් 18දා බැවිනි. මහින්ද රාජපක්ෂ යනු අසාමාන්‍ය දරුවකු නම් මිස මේ කතාව අමූලික මුසාවාදයකි. කලිසම් කබා අඳින්නට පුරුදු වී සිටි ඩී.එම්. පළමු වරට රෙද්ද බැනියම ඇන්දේ රාජ්‍ය මන්ත්‍රණ සභාවට යාමටය. ඩී.එම්. ගේ බලවත්

විරෝධය මත ඔහුට රෙද්ද බැනියම ඇන්දුවේ පසුගිය භීෂණ සමයේ ජවිපෙ විසින් මරා දමන ලද බණ්ඩාර මහත්තයාගේ පියාය.

## රාජපක්ෂවරුන්ගේ කුරහන් සටාකයේ ඇත්ත කතාව

මැදමුලන රාජපක්ෂවරුන් සියල්ලන්ම දුඹුරු වර්ණ සාටකයක් පැළඳීම සම්ප්‍රදායක් කොටගත් පවුලකි. ඩී.එම්. රාජපක්ෂගේ සිට මෙම කුරහන් පාට සාටකය පැළඳීම සිරිතක් විය. එකල දේශපාලන පක්ෂවලට පක්ෂ ලකුණක් නොවූ අතර, ඡන්ද අපේක්ෂකයන්ට පාට අනුව ඡන්ද පෙට්ටි ලබාදී තිබුනි. ඡන්ද දායකයන් තමා කැමති අපේක්ෂකයාගේ පාට දක්වෙන ඡන්ද පෙට්ටියට ඡන්දය දැමිය යුතු විය.

ඩී.එම්. රාජපක්ෂ රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඡන්දය ඉල්ලන අවස්ථාවේ දී හම්බන්තොට කච්චේරියට ගොස් දිසාපති හමු වී තමාගේ පක්ෂයට පාටක් (වර්ණයක්) ලබාදෙන ලෙස ඉල්ලා ඇත. ඒ වන විට සියලුම ප්‍රධාන පාට අපේක්ෂකයන්ට දී අවසාන වී තිබුනි.



*ඩී.එම්. රාජපක්ෂ*

ඩී.එම්. රාජපක්ෂ ඇමතූ සුදු ජාතික පී.ජේ. හඩ්සන් දිසාපතිවරයා සිය දුඹුරු වර්ණ සපත්තුව පෙන්වා උඹ මේ පාට ගණින් කියා ප්‍රකාශ කර ඇත.
*-(ලෙනාර්ඩ් වුල්ෆ් සමග ගමනක් ග්‍රන්ථයේ 115 පිටුව)*

කූඨ දේශපාලන බුද්ධියක් තිබූ ඩී.එම්. රාජපක්ෂ වීරකැටියට යන විට කුරහන් පාට සාටකයක් පැළඳගෙන ගොස් - ගිරුවාපත්තුව කුරක්කන් වලට ප්‍රසිද්ධ නිසා තමා කුරක්කන් පාට තෝරා ගත් බව තමාගේ පාක්ෂිකයන්ට පවසා ඇත. ඇත්ත වශයෙන්ම සිදු වූයේ කුරක්කන් පාර තෝරා ගැනීම නොව සුදු ඒජන්තවරයාගේ සපත්තුවේ පාට තම පක්ෂයේ වර්ණය ලෙස තෝරා ගැනීමයි.

රාජපක්ෂ වන්දි හට්ටයින් එම සිදුවීම ගිරුවායේ ජනතාවගේ ප්‍රධාන ආහාරයක් හා වගාවක් වන කුරක්කන් වලට ආදේශ කරනු ලැබුවේ රාජපක්ෂවරුන් ජනතාවට දුන් වැරදි තොරතුරු අනුවයි.



*ඩී.ඒ. රාජපක්ෂ*

මහින්ද රාජපක්ෂ මෙම කුරක්කන් සාටකය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ වෙනත් කිසිදු අපේක්ෂකයකුට පැළඳීම තහනම් කර තිබුණි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගී ආ දේශපාලඥයකු මෙම කුරක්කන් සාටකය පැළඳීම නිසා ඔහුට සදාකාලිකව දේශපාලනයෙන් සමුගැනීමට සිදුවිය.

ඩී.ඒ. රාජපක්ෂ ඩී.එම්. තරම් තීක්ෂණ පුද්ගලයෙකු නොවීය. ඩී.එම්. හැමවිටම තම දරුවන්ගෙ අනාගත අභිවෘද්ධිය ගැන සැලකුවේය. ඩී.එම්. මියගිය පසුව ඔහුගේ බිරිඳට තම දරුවන්ගේ අනාගතය පිළිබඳ බියක් ඇතිවිය. දරුවන්ගේ

බාප්පා වූ ඩී.ඒ. ගේ පවුලෙන් තම පවුලට අසාධාරණයක් වෙතැයි ඇය අනුමාන කළාය. ඒ අනුව ඇය තම උපරිම උත්සාහය දරුවේ දරුවන්ගේ අධ්‍යාපනය ශක්තිමත් කිරීමටය. ඒ නිසා ඇයගේ දරුවන් කොළඹ ගෙන අවුත් රාජකීය විද්‍යාලය වැනි ප්‍රධාන පෙළේ විදුහල්වලට ඇතුළත් කර අධ්‍යාපනය ලබා දුන්නාය.

ඩී.ඒ. ගේ දරුවන් අධ්‍යාපනයෙහි එතරම් සමත්කමක් දැක්වූවෝ නොවෙති. ඒ නිසාම පසු කලෙක මෙම පවුල් දෙක අතර ඇති වූ සීතල යුද්ධයකට එක් හේතුවක් වූයේ මහින්ද ඇතුළු ඩී.ඒ. ගේ පවුලේ ඇති වූ හීනමානයයි.

1947 මැතිවරණය වන විට හම්බන්තොට දිස්ත්‍රික්කය ආසන දෙකකට බෙදී තිබිණි. ඉන් එකක් බෙලිඅත්ත වූ අතර අනෙක හම්බන්තොට විය. බෙලිඅත්ත ආසනයට ඩී.ඒ. රාජපක්ෂ තරඟ වැදුනු අතර, හම්බන්තොට ආසනය තරඟ කලේ ඩී.එම්. රාජපක්ෂගේ පුත්‍රයෙකු වූ ලක්ෂමන් රාජපක්ෂය. එතැන් සිට දිගටම හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කළේ රාජපක්ෂ පවුල විසිනි. 1960 ජූලි මැතිවරණයේ දී හම්බන්තොට ආසන තුනක් වූ අතර මුල්කිරිගල ආසනය ඩී.එම්. රාජපක්ෂ ගේ එක් පුත්‍රයකු වූ ලක්ෂමන් රාජපක්ෂ විසින් ද බෙලිඅත්ත ආසනය ඔවුන් දෙදෙනා ගේ ලොකු තාත්තා වූ ඩී.ඒ රාජපජෂ විසින් ද දිනා ගත්හ. 1965 මැතිවරණයේ දී ජෝර්ජ් රාජපක්ෂ මුල්කිරිගල ආසනය දිනා ගත් අතර, ලක්ෂමන් රාජපක්ෂ තිස්සමහාරාම ආසනයට මහජන එක්සත් පෙරමුණෙන් තරඟ කර පරාජය විය. ඔහු පසුව පිලිප් ගුණවර්ධන සමග එක්සත් ජාතික පක්ෂය සමග එකතු විය. බෙලිඅත්ත ආසනයෙන් එම මැතිවරණයේ දී ඩී.ඒ. රාජපක්ෂ පරාජයට පත්විය.

1970 මැතිවරණයේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායිකා සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආසන තුනට තරඟය සඳහා ඉදිරිපත් කරන ලද්දේ මුල්කිරිගල ජෝර්ජ් රාජපක්ෂය. තිස්සමහාරාමට ටෙනිසන් එදිරිසූරිය සහ බෙලිඅත්තට මහින්ද රාජපක්ෂ **(නිල ඡන්ද ලේඛණ වල සඳහන් වූයේ පර්සි මහේන්ද්‍ර රාජපක්ෂ යනුවෙනි)** යන තිදෙනාය. එම මැතිවරණයේදී ලක්ෂමන් රාජපක්ෂ මහතා තිස්සමහාරාම ආසනයට ස්වාධීන අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් ව පරාජයට පත්විය. ඒ වනවිට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ජෝර්ජ් රාජපක්ෂ මහතාට අතිශයින් ප්‍රිය කළාය. ඒ ඔහුගේ මහත්මා දේශපාලනය නිසාය. 1970 සමගි පෙරමුණු රජයේ ධීවර අමාත්‍යවරයා වූයේ ජෝර්ජ් රාජපක්ෂය.

## මහින්ද ගේ දේශපාලන ආගමනය

මේ වනවිට රාජපක්ෂ පවුල් අතර බලවත් විරසකයක් ඇතිවී තිබිණි. එම විරසකයට හේතුව අන් කවරක් වක් නොව හම්බන්තොට දිස්ත්‍රික්කයේ දේශපාලන බලයයි. 1976 දී ජෝර්ජ් රාජපක්ෂ මහතා අභාවප්‍රාප්ත විය. මෙම පුරප්පාඩුව සඳහා තම සොහොයුරු බැසිල් රාජපක්ෂ හඳුන්වා දීමට මහින්ද උත්සාහ කළ ද සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය එම අවස්ථාව නැවත ලබා දුන්නේ ඩී.ම්. රාජපක්ෂ මහතාගේ පුත්‍රයකු වූ ලක්ෂමන් රාජපක්ෂ මහතාටය. 1976 අගෝස්තු 27 දින පැවති අතුරු මැතිවරණයෙන් ලක්ෂමන් රාජපක්ෂ මහතා ජයග්‍රහණය කළේය.



*මහින්ද 1970 දී මැතිවරණයට ඉදිරිපත් කළ පලමු පෝස්ටරය*

1977 මහ මැතිවරණයේදී කෙසේ හෝ ශ්‍රී.ල.නි.පක්ෂ අපේක්ෂකයා ලෙස මුල්කිරිගලට ආ බැසිල් රාජපක්ෂ ඡන්ද 4984කින් එජාප

අපේක්ෂකයාට පරාජය වෙද්දී බෙලිඅත්තෙන් තරඟ වැදුනු මහින්ද (මහේන්ද්‍ර) ඡන්ද 6393ක අන්ත පරාජයක් ලැබුවේය. 1982 අතුරු මැතිවරණයේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂිකාව ලෙස සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ගේ ආශිර්වාදය ඇතිව තරඟයට පිවිසෙන්නේ ජෝර්ජ් රාජපක්ෂ මහතාගේ දියණිය වූ නිරූපමා රාජපක්ෂය. ඒ වනවිට ඇය නීති විද්‍යාලයේ ඉගෙනුම ලබමින් සිටි ශිෂ්‍යාවකි. එම අවස්ථාවේදී මහින්දගේ සොහොයුරු බැසිල් රාජපක්ෂ තම ඥාතිවරියට එරෙහිව එක්සත් ජාතික පක්ෂයට උපකාර කළ අතර, බෙලිඅත්ත ආසනයෙන් නැවත වරක් මහින්ද රාජපක්ෂ ඡන්ද 5894කින් දොස්තර රංජිත් අතපත්තු මහතාට පරාජය විය.

1982 මුල්කිරිගල ජයග්‍රහණය කළ එජාපයේ ආනන්ද කුලරත්න මහතාට එරෙහිව ඡන්ද පෙත්සමක් ඉදිරිපත් වූ අතර, ඉන් පරාජයට පත්වීම නිසා නැවත අතුරු මැතිවරණයක් පැවැත්වීමට සිදුවිය. එම අවස්ථාව වනවිට නිරූපමා කපා දමා එම ස්ථානය තම සහෝදරයා වූ චමල් රාජපක්ෂ වෙත ලබා දෙන්නට මහින්දට හැකියාව ලැබිණි.

## මහින්ද මිනීමරුවෙකි?

මෙම මුල්කිරිගල මැතිවරණයේ දී සිදුවූ සිද්ධියක් හේතු කොට ගෙන මහින්ද රාජපක්ෂ වෙත ද්විත්ම මිනීමැරුම් චෝදනාවක් එල්ල විය. ඒ අනුව මහින්ද බන්ධනාගාර ගත කෙරිනි. 1985 දී සිදුවූ මහින්ද ගේ මවගේ අවමගුලට පවා ඔහු සහභාගි වූයේ බන්ධනාගාර නිළධාරීන් ගේ රැකවල් මධ්‍යයේය. සිද්ධිය ඇසින් දුටු සාක්ෂිකරුවන් දෙදෙනෙක් අතුරුදහන් කරවීය. අවසානයේ සාක්ෂි නොමැතිවීම හේතුවෙන් නඩුව අහක ගියේය. මහින්ද ඩබල් කැබ් රථයක බොනට්ටුව මත දිගා වී වෙඩි තැබීමෙන් මෙම ද්විත්ව ඝාතනය සිදු කරනු ලැබූ බව හිටපු අමාත්‍ය දොස්තර රංජිත් අතපත්තු මහතා පවසා ඇත. අද මහින්දගේ පුරජේරුව වර්ණනා කරන ලේඛකයෝ මහින්ද ජනතාව වෙනුවෙන් හිරේ පවා ගිය බව කියති. ඇත්තටම ඔහු හිරේ ගියේ ජනතාව වෙනුවෙන් නොව ද්විත්ව මිනීමරුමක් හේතුවෙනි.


*මහින්ද තංගල්ල නිරගෙදර සිට*

1984 මැතිවරණයෙන් චමල් පරාජය විය. එහෙත් නිරූපමා රාජපක්ෂ දිගින් දිගටම දේශපාලන බිමේ රැඳී සිටියාය. මහින්ද රාජපක්ෂ ගේ දිගුකාලීන දේශපාලන ව්‍යාපෘතියේ පවුල් බලය තහවුරු කිරීම ආරම්භ කළේ එලෙසය. මේ අතර 1982 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකඩ විය. එම අවස්ථාවේ දී පක්ෂයෙන් කැඩී ගිය මෛත්‍රී අනුර කණ්ඩායම සමග බැසිල් ද ශ්‍රීලනිපයෙන් ඉවත්ව ගියේය. මාස කීපයකට පසු නැවත ඒ එකිනෙකා ශ්‍රීලනිපයට ආ අතර මැතිනිය අනුර පක්ෂයට ගෙන එවකට ජ්‍යෙෂ්ඨයෙකු වූ මෛත්‍රීපාල සේනානායක ට වඩා ඉහළ තනතුරකට උසස්වීමක් දුන්නාය. ඇය බැසිල් රාජපක්ෂ නැවත ශ්‍රීලනිපයට බඳවා ගත්තේ නැත.

බැසිල් එක්සත් ජාතික පක්ෂයේ ගාමිණී දිසානායක මහතාට සමීප වූ අතර 1982 සැප්තැම්බරයේ කොළඹ දී මාධ්‍ය සාකච්ඡාවක් පවත්වයි. එහිදී ඔහු කියන්නේ තමන් එජාපයට ගියේ රාජපක්ෂවරුන් එතෙක් ගිරුවා පත්තුවට කිසිම සේවයක් නොකළ නිසා බවයි. ගාමිණී බැසිල්ට මහවැලි ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් පවරන අතර ඒ සඳහා ඔහුට HASMA CORPARATION නම් සමාගමක්ද තනා දෙයි.

මේ වන විට හම්බන්තොට දිස්ත්‍රික්කයේ දේශපාලන බලය සියතට ගැනීමට මහින්ද රාජපක්ෂ මහතා සමත්ව සිටියේය. ඔහු ඩී.ඒ. රාජපක්ෂගේ දරුවන්ට මිස අන් කිසිවකුට දේශපාලනය කරන්නට ඉඩ තබන්නේ නැත. වෙනකක් තබා තම මහප්පාගේ දූ පුතුන්ට වත් දේශපාලන බිමට එන්නට මහින්ද ඉඩ දුන්නේ නැත.

## මහින්දගේ දේශපාලන ගොදුරු

මහින්ද ගේ එක් දේශපාලන ගොදුරක් වුයේ තම ඥාති සහෝදරයාගේ දියණිය වූ නිරූපමාය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ පවා නිරූපමා බලවත් චරිතයක් බවට පත්වීම වළක්වන ලද්දේ මහින්ද විසිනි. අවසාන වශයෙන් මෙතෙක් ඇය විසින් දරමින් සිටි මුල්කිරිගල ආසන සංවිධායක ධූරයෙන්ද නිරූපමා ඉවත් කෙරුණේ මහින්දගේ බලපෑම පරිදිය.



*ජෝර්ජ්, නිරූපමා, ලක්ෂ්මන්*

නිරූපමා ගේ සහෝදරයා වූ ශ්‍යාමිලාල් රාජපක්ෂ එංගලන්තයේ ඉගෙන බැරිස්ටර් වරයෙකු ලෙස සමත්ව ලංකාවට පැමිණියේය. පසුව දකුණු පළාත් සභා මැතිවරණයට තරඟ කොට හම්බන්තොට දිස්ත්‍රික්කට විශිෂ්ඨ ජයග්‍රහණයක් ලබාගත්තේය. ඒ අනුව ඔහුට පළාත් සභාවේ තනතුරක් ලබාදීමට නියමිත විය. එහෙත් එතැනදී මහින්ද හරස් විය. බැරිස්ටර් වරයාට නොදුන් ඇමතිකම මහින්ද ගේ බලපෑම පිට ලැබුනේ පාසල් අධ්‍යාපනයවත් හරිහැටි නොතිබූ ලිවීමට කියවීමටවත් හැකියාවක් නැති මලපොතේ අකුරක් බැරි මිනීමැරුම් සම්බන්ධ අපරාධ චෝදනා රාශියක් තිබූ එම්.කේ. රංජිත් හෙවත් චණ්ඩි මල්ලිටය. ඒ අනුව "චණ්ඩි මල්ලි ඇමතිතුමා" මහින්ද රාජපක්ෂ නායකයා ගේ ආශිර්වාදයෙන් දකුණු පළාත් සභාවේ අමාත්‍ය තනතුරකට පත් වූ අතර මේ ගැන සිතා කම්පා වූ ශ්‍යාමිලාල් රාජපක්ෂ නැවත එංගලන්තය බලා පිටත් විය. මහින්දගේ සමස්ත දේශපාලන ක්‍රියාවලිය තුල අධ්‍යාපනයට සහ හැකියාවට ඉඩක් ලබා නොදීම ගැන මීට වඩා වෙනත් උදාහරණ අවශ්‍ය නැත.

මහින්ද රාජපක්ෂ මහතාගේ තවත් දේශපාලන ගොදුරක් වූයේ ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත රණවීර මහතාය. ඒ මහතා 1970 වන විට නෙටොල්පිටිය ගම් කාර්ය සභාවේ සභාපතිවරයා විය. ඔහු ඒ වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂ හම්බන්තොට මධ්‍ය සංවිධානයේ සභාපතිවරයා ද විය. එහෙත් අබිරහස් ලෙස ඔහු 1971 කැරැල්ල සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැණිනි. අවසානයේ ඔහු ජනතා විමුක්ති පෙරමුණටම ගොස් නතර විය. එම කුමන්ත්‍රණයට රාජපක්ෂ (ඉ)වලව්වේ ඇති සම්බන්ධය කවුරුත් දනිති.

1970 මහ මැතිවරණයෙන් තිස්සමහාරාම ආසනය දිනා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ ටෙනිසන් එදිරිසූරිය මහතාද මහින්ද රාජපක්ෂ මහතාගේ උදහසට ලක් වූවෙකි. 1970 ආණ්ඩුවේ රාජපක්ෂ

බලය හේතුවෙන් එදිරිසූරිය මහතාට කිසිම වැඩක් කරන්නට ඉඩක් ලබා නොදීමට මහින්ද රාජපක්ෂ මහතා වගබලා ගත්තේය. 1994 දී දකුණු පළාත් සභා මැතිවරණයෙන් දිනුවත් පළපුරුදු නීතිඥයකු සහ කෘතහස්ත දේශපාලනඥයකු වූ එදිරිසූරිය මහතාට එම පළාත් සභාවේ අමාත්‍ය තනතුරක් පිරිනැමීම වැළැක්වූයේ මහින්ද රාජපක්ෂ ය. අතිශය කලකිරීමෙන් යුක්තව කල් ගත කල ඒ මහතා 2004 දෙසැම්බර් 26 දා සුනාමි රළ පහරට හසුව මිය ගියේය.

1991 පළාත් පාලන මැතිවරණයේ දී බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට තරඟ කර වැඩිම මනාපය ලබාගත් ගුණරත්න මහතාට එම ප්‍රාදේශීය සභාවේ සභාපතිත්වය පිරිනැමීම වළක්වන ලද්දේ මහින්ද රාජපක්ෂ මහතාය. ඒ වෙනුවට පත් කෙරුණේ රාජපක්ෂ මහතාගේ සුවච කීකරු ගෝලයකු වූ සොමවංශය. කලකිරීම නිසා ශ්‍රීලනීපයෙන් ඉවත් වූ ගුණරත්න මහතා ඊළඟ පළාත් සභා මැතිවරණයට සූදානම් වෙමින් සිටියදී බෙලිඅත්ත නගරයේ දී ප්‍රසිද්ධියේ වෙඩි තබා ඝාතනය කෙරිණි. එම ඝාතනයේ වගකීම පැවරුනේ මහින්ද රාජපක්ෂ මහතාගේ කිට්ටුවන්තයකු වූ එම්.කේ. රංජිත් හෙවත් චණ්ඩි මල්ලිටය.

## මහින්ද ගේ දේශපාලන කුමන්ත්‍රණ

1993-94 මැතිවරණ වලදී මහින්ද රාජපක්ෂට මුදලින් උපකාර කළේ මැණික් ව්‍යාපාරකයෙකු වූ පල්ලෙරොටේ හිච්චි මහත්මයාය. එයට ප්‍රතිඋපකාරයක් ලෙස ඔහුගේ පුත්‍රයා වූ අජිත් රාජපක්ෂ තරුණයාට 1997 අම්බලන්තොට ප්‍රාදේශීය සභාවට තරඟ කරන්නට අවස්ථාව දුන්නේය. එම තරඟයෙන් ඔහු වැඩිම මනාප ලබාගෙන අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති තනතුරට පත්විය. 1999 දකුණු පළාත් සභා මැතිවරණයටද තරඟ කළ අජිත් රාජපක්ෂ මහතා ජයග්‍රහණය කළේය. ඒ වනවිට වයස අවුරුදු 21පමණ වූ අජිත් රාජපක්ෂ මහතා පළමු පළාත් සභා රැස්වීමට ගියේ මහින්ද රාජපක්ෂ මෙන්ම කුරහන් පාට සාටකයක් කරේ දමාගෙනය. මෙම අවස්ථාවට සහභාගි වූ මහින්ද රාජපක්ෂ මහතා එය දුටු කල බෙහෙවින් කෝප විය. අජිත් රාජපක්ෂ මහතා තමා අසලට කැඳවූ මහින්ද වහාම සාටකය ගලවන ලෙස අජිත් රාජපක්ෂට තර්ජනය කළේය. "කුරහන් සටාකය අයිති මැදමූලන රාජපක්ෂලාට පමණකැයි" මහින්ද ඔහුට තර්ජනය කළේය. අජිත් රාජපක්ෂ එදා සිට අද වනතුරුත් දේශපාලනය තුල අල්ලා ගෙන සිටියේ බෙහෙවින් අමාරු තත්වයකය. දකුණු පළාත් සභාවේ සභා නායක වරයා වූ ඒ මහතා පසුව එක්සත් ජාතික පක්ෂය සමග එක්විය.

## මහින්ද දේශපාලන කුහකයෙකි

1991 අගුණකොලපැලැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපති තනතුරට පත්වූයේ මහින්ද අමරවීර නම් තරුණයා ය. ඔහු ක්‍රමයෙන් ජනප්‍රියත්වයට පත්වෙමින් සිටියදී 1993 දකුණු පළාත් සභාවට නාමයෝජනා ඉල්ලා සිටියේය. එයට මහින්ද නොයෙක් අයුරින් වළ කපමින් සිටියදී අමරවීර කළේ හිමින් සීරුවේ මංගල සමරවීර මහතා සමග සම්බන්ධ වී බණ්ඩාරනායක මැතිණිය හමුවී නාමයෝජනා ලබා ගැනීමයි.

නීතිඥ සිරි අන්ද්‍රා හැන්නදි මහතා ලලිත්-ගාමිණී දෙපළගේ ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණේ සිට ශ්‍රීලනිපයට ආවේය. එහෙත් ඔහුට දේශපාලනයෙන් ඉදිරියට යාමට මහින්ද හරස්වීමෙන් පසු ඔහු නැවත ආපසු හැරී එජාපයට ගියේය.

මේ මහින්ද රාජපක්ෂ මහතාගේ දේශපාලන ගිලටිනයට හසුවී ගොදුරු බවට පත්වූ කැපී පෙනෙන කිහිප දෙනෙකු පමණි. මීට අමතරව දේශපාලනය සඳහටම තිත්ත කරවනු ලැබූ සිය ගණනක් ශ්‍රීලනිප පාක්ෂිකයෝ ගිරුවාපත්තුවේ සිටිති.

## මහින්ද කුලවාදියෙකි

මහින්ද රාජපක්ෂ මහතා කවර වෙස් මුහුණක් පැළඳ සිටිය ද පවුල්වාදියෙකු මෙන්ම උග්‍ර කුලවාදියෙකු ද වෙයි. ඔහු ගොවිගම කුලය මිස අන් කිසිම කුලයකට අයත් කෙනෙකුට ඉහළට එන්නට ඉඩ නොදෙයි. තම ජයග්‍රහණය සඳහා පීඩිත කුලවලට අයත් ජනතාවගේ ඡන්දය ගරා ගැනීම පිණිස එම කුලවලට අයත් නායකයන් කිහිප දෙනෙකු තමන් වටේ තබා ගන්නා මහින්ද කිසි විටෙකත් ඔවුනට දේශපාලන බිමට පිවිසීමට ඉඩ නොදෙයි.

අම්බලන්තොට ආශ්‍රිතව රජක කුලයතට අයත් ජන සමූහයක් වෙති. ඒ ඡන්ද ගරා ගැනීම සඳහා එම කුලයට අයත් ගුරුවරයකු මහින්ද තම ආධාර කරුවකු ලෙස තබාගෙන සිටියි. ඔහුට විවිධ වරප්‍රසාද ලබා දුන්නත් දේශපාලනයට එන්නට මහින්ද ඉඩ තබන්නේ නැත. එහෙත් දැන් එම පරපුරේ එක් තරුණයකු එක්සත් ජාතික පක්ෂය යටතේ තරග කර දකුණු පළාත් සභාවට තේරී පත්ව සිටීම මහින්ද සලකන්නේ අභියෝගයක් ලෙසයි.

## මහින්ද ගේ පාසැල් සමය

මහින්ද රාජපක්ෂ ළමයා පාසල් ගියේ ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයටය. ඔහු රිච්මන්ඩ් විද්‍යාලයට යන්නේ නිදහස් අධ්‍යාපනයේ පියා වූ ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා විසින් ඉදිරිපත් කළ නිදහස් අධ්‍යාපන පනතට රාජ්‍ය මන්ත්‍රණ සභාව තුළදී සහාය පළ කිරීම හේතුවෙන් ඩී.එම්. රාජපක්ෂ මහතාට කරන ලද උපහාරයක් ලෙස පිහිටුවන ලද වීරකැටිය මධ්‍ය මහා විද්‍යාලය අතේ දුරින් තිබියදීය. නිදහස් අධ්‍යාපනයෙන් පසුව ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද මුල්ම මධ්‍ය විද්‍යාලයට නොයවා මහින්ද යවනු ලැබුවේ ගාල්ල රිච්මන්ඩ් විදුහලටය. අද නිදහස් අධ්‍යාපනයේ මහා භාරකාරයා ලෙස මහින්දගේ වන්දිභට්ටයන් විසින් වර්ණනා කරන්නේ මේ මහින්ද ය.

එහෙත් මහින්ද ළමයාට අපොස සාමාන්‍ය පෙළ විභාගය සමත්වීමට නොහැකි විය. ඔහු අංක ගණිතය විෂය අසමත් වූ නිසා පවුලේ ඥාතීහු මහින්ද කොළඹ යැවීමට තීරණය කළහ. එහිදී මහින්දට උපකාර කිරීමට ඉදිරිපත් වූයේ ඔහුගේ පවුලේ ඥාතිවරයකු වූ කපුගම අරියජෝති හාමුදුරුවන්ය. උන්වහන්සේ තමන් වහන්සේගේ හිතවතෙකු වූ මාපලගම විපුලසාර නාහාමියන්ගේ උපකාරයෙන් මහින්ද රාජපක්ෂ නාලන්ද විදුහලට ඇතුළත් කළහ. එහිදී මහින්දට නේවාසිකාගාරයේ නවතින්නට සිදුවිය. ඔහුගේ අල්ලපු ඇඳේ සිටියේ පසුව එජාප මහජන නියෝජිතයකු වූ එච්.ආර්. පියසිරිය. මහින්ද එච්.ආර්. පියසිරිට නොයෙකුත් අඩම්තේට්ටම් කිරීමට පටන් ගත් නිසා නාලන්දා විදහල්පතිවරයා මහින්ද ගේ දෙමාපියන් කැඳවා මහින්ද ළමයා පාසලෙන් ඉවත් කර ගන්නා ලෙස ඉල්ලා සිටියා ය. ඒ අනුව නාලන්දයෙන් ඉවත් වූ මහින්ද ඇතුළත් කෙරෙන්නේ තර්ස්ටන් විද්‍යාලයටය. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ ගණිත ප්‍රශ්න පත්‍රය පැවති දිනට පෙර දවසේ රාත්‍රිය පුරාම ගණන් හදවා යන්තම් ගණිතය සමත් කරවා ගත් මහින්දට සාමාන්‍ය පෙළ විභාගය සමත් කරවීමට හැකි විය.

මහින්දගේ අපොස සමත්වීම පිළිබඳව තවත් රසවත් කතාවක් තිබේ. ඒ අනුව කියැවෙන්නේ මේ කාලය වනවිට පොලිස් පරීක්ෂක වරයෙකුව සිටි මහින්ද ගේ අයියා වූ චමල් රාජපක්ෂ අම්පාරේ විභාග මධ්‍යස්ථානයක දී මහින්ද ගේ නමින් විභාගයට පෙනී සිටි බවයි. කෙසේ නමුත් මෙහි ඇත්ත නැත්ත දන්නේ මහින්ද සහ චමල් පමණි.



*මහින්ද විදුදය සරසවියේ පුස්තකාලයේ සුළු සේවකයකු ලෙස සේවය කලා විනා ඔහු සහකාර පුස්තකාලාධිපති නොවීය.*

## මහින්ද ගේ පළමු රැකියාව

මේ වන විට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය ලෙස හඳුන්වන විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා වූයේ හේමචන්ද්‍ර ගුණසේකර මහතාය. ඒ මහතා මහින්ද ගේ මවගේ ඥාති සහෝදරයෙකි. එනම් මහින්ද ගේ මාමා කෙනෙකි. උසස් පෙළ විභාගය අසමත්ව ගමට ගොස් රස්තියාදු ගහමින් සිටි තරුණ මහින්දට ගුණසේකර මහතා විශ්ව විද්‍යාලයේ පුස්තකාලයේ අනියම් පුස්තකාල සහායක තනතුරක් ලබා දුන්නේය. මහින්ද ගැන ලියැවෙන පොත්වල සඳහන් පරිදි එය පුස්තකාලයාධිපති තනතුර නොවේ. එහිදී ආචාර්ය ඇපාසිංහ සහ මහින්ද විජේසේකර යන අය මහින්ද රාජපක්‍ෂට උපකාර කළහ.

මෙම කාලපරිච්ඡේදය තුළ විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ පුස්තකාලාධිපති තනතුර දැරුවේ ඩබ්ලිව්. බී. දොරකුඹුර මහතාය. මහින්ද ඔහු යටතේ පුස්තකාලයේ සුලු සේවකයෙකු ලෙස කටයුතු කලේය. ඔහුට දක්වන ලද සහයෝගයට ප්‍රතිඋපකාරයක් වශයෙන් මහින්ද 2005 ජනාධිපති වීමෙන් පසුව දොරකුඹුර මහතා පකිස්ථානයේ තනාපති වරයා වශයෙන් පත් කලේය.

මහින්ද රාජපක්‍ෂ තරුණයා 1970 මහ මැතිවරණයට තරඟ කළේ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රැකියාව කරමින් සිටිද්දීය. එය සිදුවූයේ මෙසේය. 65 මැතිවරණයෙන් පරාජයට පත් වූ ඩී.ඒ. රාජපක්‍ෂ මහතා 1968දී මිය ගිය පසු 70 මැතිවරණයට තරඟ කරන ලෙස බණ්ඩාරනායක මැතිණිය ඉල්ලා සිටියේ චමල් රාජපක්‍ෂ ගෙනි. එවකට ඔහු පොලිස් සේවයේ යෙදී සිටි නිසා මහින්ද ගේ මව මැතිනියගෙන් ඉල්ලා සිටියේ ලොකු පුතාට දැනටමත් සවීර රැකියාවක් ඇති නිසා ඒ වනවිට අනියම් රැකියාවක් කරමින් සිටි මහින්දට එම අවස්ථාව දෙන ලෙසයි.

70 මැතිවරණයෙන් ජයග්‍රහණය කර ආණ්ඩු පක්‍ෂයේ මන්ත්‍රී පදවියක් ලබා ගත් මහින්ද රාජපක්‍ෂ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට ආපසු පැමිණි අවස්ථාවක විශ්ව විද්‍යාලයේ සිටි සිසුහු සුපුරුදු "හූ" පූජාවකින් ඔහු පිළිගත්හ. මෙයට උරණ වූ මහින්ද කේන්තියෙන් පුපුරමින් විශ්ව විද්‍යාල බිමෙන් පිට වී ගොස් නොබෝ වේලාවකින් විශ්ව විද්‍යාලයට කඩා වැදුනු මහරගම ප්‍රදේශයේ මැර පිරිසක් හූ කී සිසුන් සොයමින් පහර දෙන්නට විය.

විශ්ව විද්‍යාලයේ දී තමන්ට උපකාර කළ මහාචාර්ය ඇපාසිංහයන්ට මහින්ද ප්‍රති උපකාරයක් කර තිබේ. 1970 ආණ්ඩුවේ ඉඩම් ඇමති හෙක්ටර් කොබ්බෑකඩුව මහතා ඉඩම් සීමා පනත ගෙන එන්නට පෙර ඒ බව මහින්ද ආචාර්යතුමාට රහසේ දැන්වූයේය. ඒ අනුව තම පවුලට අයත් ඉඩම් වල අයිතිය පවුලේ සාමාජිකයන් අතර කඩිනමින් ලියා දී ඉඩකඩම් ටික බේරාගන්නට මහාචාර්ය

ඇපාසිංහ සමත්විය. මේ උපකාරය වෙනුවෙන් ඇපාසිංහ මහතා වීරකැටිය ප්‍රදේශයෙන් පොල් අක්කර 50ක ඉඩමක් මහින්දට පවරා දුන් අතර තංගල්ල නගරයේ ඩී.ඒ. රාජපක්‍ෂ පිළිරුව සෑදීමට අවශ්‍ය ඉඩමද පරිත්‍යාග කළේය. මෙම ආචාර්ය ඇපාසිංහට"හෙල්පින් හම්බන්තොට" අරමුදලේ ද සාමාජිකත්වය පිරිනමන ලද්දේ මහින්ද රාජපක්‍ෂ විසිනි. මහින්ද රාජපක්‍ෂ මහතා සහ අගවිනිසුරු සරත් එන්. සිල්වා මහතා අතර ඇත්තේ ද ඉතා කිට්ටු සබඳතාවයකි. මහින්ද විවාහ වන්නට පෙර මනාලිය බලන්නට ගියේ සරත් සිල්වා සමගය(Helping Hambantota). සරත් සිල්වා ගේ තඩු තීන්දු සම්බන්ධයෙන් අද ජාත්‍යන්තර වශයෙන් පවා ආන්දෝලනයක් ඇති වී තිබේ. ඒ ගැනවත් මහින්ද රාජපක්‍ෂ මහතා තම ප්‍රතිපත්තිය ප්‍රකාශ නොකරයි. මිතුරන් දෙදෙනා එකිනෙකට උපකාර නොකරන්නේ යැයි කිවහැක්කේ කාටද?

## මහින්ද ගේ මැර දේශපාලන ගතිය

මහින්ද රාජපක්‍ෂගේ මැර හමුදාව ආරම්භ වන්නේ 80 දශකයේදීය. එකල විතාරන්දෙනියේ උක්කුවා නමින් හඳුන්වන ලද සුප්‍රකට මිනීමරුවා මහින්දගේ ආරක්‍ෂකයකු ලෙස සේවය කළේය. උක්කුවා කුලී මිනීමරුවකු ලෙස මෙන්ම සොරෙකු ලෙසත් ප්‍රසිද්ධියට පත්ව සිටියේය. පසුව පොලිස් වෙඩි පහරට ලක්ව මරණයට පත්විය.



*කුරාම් ශේක් / සම්පත් විසින් දූෂණය කර, මරණීය තුවාල ලැබූ කුරාම්ගේ පෙම්වතිය වික්ටෝරියා. / කුරාම් මරා දැමූ මිනීමරු සම්පත් මහින්ද සමඟ.*

උක්කුවාගෙන් පසුව මහින්දගේ මැර බලකාය මෙහෙයවන ලද්දේ පැලවත්තේ හිච්චා සහ දම්මුල්ලේ චණ්ඩි මල්ලි යන දෙදෙනාය. ඔවුහු ස්ත්‍රී දූෂණ, මංකොල්ල සහ මිනීමැරුම් ගැන බෙලිඅත්ත ප්‍රදේශයේ නම් දැරූවන්ය. මේ දෙදෙනා තම කණ්ඩායම මෙහෙයවමින් පළාතම භීතියෙන් මුසපත් කරවමින් සිටින අතර, ක්‍රම ක්‍රමයෙන් ප්‍රාදේශීය දේශපාලන බලයට ද අත පෙවූහ. මහින්ද රාජපක්‍ෂගේ අනුග්‍රහයෙන් චණ්ඩි මල්ලිට දකුණු පළාත් සභාවේ ඇමති පදවියක්ද ලැබිණි.



*ඩී.වී. උපුල් / ඩී. වී. රංජිත් (චන්ඩි මල්ලි) / එරාජ් ප්‍රනාන්දු පිස්තෝලය අතැතිව*

1987-89 භීෂණ සමයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බොහෝ දේ සිදු විය. ජනතා විමුක්ති පෙරමුණේ තුවක්කුකරුවෝ වාමාංශික පක්ෂවලට හිතවත් වූවන් සහ එක්සත් ජාතික පාක්ෂිකයන් හොය හොයා මරද්දී හමුදා ඇඳුමින් සැරසුනු සමහර ආයුධ සන්නද්ධ කණ්ඩායම් ප්‍රබල ශ්‍රී ලංකා නිදහස් පාක්ෂික තරුණයන් ද පැහැර ගෙන ගොස් මරා දමනු ලැබූහ. එම සමයෙහි විවිධාකාර කණ්ඩායම් අත අවි ආයුධ තිබූ අතර පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලුම දේශපාලනඥයන් ගේ ආරක්ෂාවට තමනට අභිමත පුද්ගලයන් හමුදා සහ පොලීසියට බඳවාගෙන අදාල දේශපාලනඥයන්ගේ ආරක්ෂක කණ්ඩායම් ලෙස අනුයුක්ත කර තිබිණි.

## මහින්ද ගේ මිනීමරු මිතුරෝ (Mahinda's Killer Squad)

1999 ජනවාරි 22 වැනිදා පවත්වනු ලැබූ වයඹ පළාත් සභා මැතිවරණයේ දී හලාවත නගරයේ මැතිවරණ භීෂණය සෘජුවම මෙහෙයවනු ලැබුවේ මහින්ද රාජපක්ෂ අමාත්‍යවරයා සමග දකුණේ සිට හලාවත වෙත ගිය පිරිස්ය. ඔවුහු එහි මැතිවරණය කඩාකප්පල් කර දැමුවා පමණක් නොව එහි සාමාන්‍ය ජනතාවට ඉතා දරුණු අන්දමින් පහරදීම සහ වෙඩි තැබීමද සිදු කළහ. වයඹ මැතිවරණයේ භීෂණය නිරූපනය කරමින් ලොව පුරා ප්‍රචාරය වූ ඡායාරූප වල පෙනී සිටින බොහෝ දෙනෙක් මහින්ද ගේ හම්බන්තොට මැර හමුදාවේ සාමාජිකයෝය.

2001 මැතිවරණයේ දී බෙලිඅත්ත, මිද්දෙණිය, රන්න, අඟුණකොළපැලැස්ස, කටුවන, විතාරන්දෙණිය ආදී ප්‍රදේශවල පැවැති භීෂණය මෙහෙයවන ලද්දේ මහින්ද රාජපක්ෂ ඇමතිතුමාගේ පරිවාර මැර හමුදාව විසිනි. ගෙවල් ගිනි තැබීම, පහරදීම, මංකොල්ලකෑම්, වෙඩි තැබීම් පමණක් නොව ස්ත්‍රී දූෂණද සිය ගණනක් සිදුවිය. එක් අවස්ථාවක එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂක සජිත් ප්‍රේමදාස මහතා ඝාතනය කිරීමටද උත්සාහයක් දැරූ අතර ඒ සඳහා තැබූ වෙඩිල්ලෙන් සජිත් ප්‍රේමදාස මහත්මිය බේරුනේ අනූ නවයෙනි.

## චණ්ඩි මල්ලි මරා දැමීම

කොළඹ රහස් පොලිස් මූලස්ථානයට මාසික වාර්තා කිරීම සඳහා පැමිණි රාජපක්ෂ මහතාගේ ප්‍රධාන ගෝලයෙකු වූ චණ්ඩි මල්ලි ගිනි මද්දහනේ සිය ගණනක් මිනිසුන්ගේ දෑස් ඉදිරිපිට නාඳුනන තුවක්කු කරුවකු විසින් වෙඩි තබා ඝාතනය කරනු ලැබිණි. එහෙත් තවමත් ඒ ඝාතකයා කවුරුන්දැයි සොයාගෙන නැති අතර, චණ්ඩි මල්ලි ඝාතනය කෙරුණේ ඔහු සහ මහින්ද රාජපක්ෂ අතර ඇති දැඩි සම්බන්ධතාවය පිළිබඳ තොරතුරු හෙළිදරව් වීමෙන් පසුවය.

පුවක්දණ්ඩාවේ කළුවා කලක් මහින්ද රාජපක්ෂ මහතාගේ රියදුරු ලෙස කටයුතු කළේය. එකල ගම් වැසියන් ඔහු හඳුන්වනු ලැබුවේ "රාජපක්ෂ කළුවා" නම් අන්වර්ථ නාමයෙනි. මහින්දගේ දේශපාලන බලයෙන් අසරණ ගම්වැසියන්ට තාඩන පීඩන කළ කළුවා අවාසනාවන්ත ලෙස රිය අනතුරකින් මරණයට පත්විය.

මහින්ද රාජපක්ෂ සමග ඇසුරටවන් මැර කණ්ඩායම සමන්විත වන්නේ ආමි ජිනේ, අමරෙ සහ වම්බොට්ටා ගෙනි. ඒ පිරිසේ සිටි සෙල්ලෙ කළුවා නැමැත්තා මෑතකදී පොලීසියෙන් තබන ලද වෙඩිල්ලක් වැදී මියගිය අතර වම්බොට්ටා තවමත් සිටින්නේ රිමාන්ඩ් හිරගෙදරය.

පාතාල ලෝකයේ එකිනෙකට විරුද්ධ පාතාල සාමාජිකයන් වෙන වෙනම ඇසුර කිරීම ගැන මහින්ද රාජපක්ෂ මහතාට හොඳ පළපුරුද්දක් ඇති බව අත්අඩංගුවට ගනු ලැබූ වම්බොට්ටා පොලීසියට දෙන ලද කට උත්තරයෙන් පැහැදිලි වේ. ඔහු කියන අන්දමට චණ්ඩි මල්ලි මරා දැමුයේ රත්නවීර නම් තවත් මැර නායකයෙකි. ඔහු ද පල්ලත්තර ජගත් නම් වූ ඔහුගේ සගයා ද වෙනත් අතෙකින් මහින්දගේම ගෝල බාලයන්ය.

# මහින්ද ගේ දේශපාලන ගමන

මහින්ද රාජපක්ෂ වූ කලී 1970 සිට අද දක්වා අවුරුදු 45ක් දේශපාලනය කළ පුද්ගලයෙකි. එහෙත් ඔහු ඒ මුලු කාලය තුළ කෙදිනකවත් ස්ථිර ප්‍රතිපත්තියක් වෙනුවෙන් පෙනී සිටි අයෙකු නොවීය. 1970 සිට දේශපාලන භූමියට ආ මහින්ද රාජපක්ෂ අත්වැල් බැඳගෙන සිටියේ අනුර බණ්ඩාරනායක මහතා සමඟය. එය කෙතරම් තදබල සබඳතාවයක් ද යත්, වරක් පාර්ලිමේන්තුවෙන් මාස 6ක නිවාඩුවක් ලබාගෙන අනුර සමග එංගලන්තයේ ගත කරන්නට යාමට තරම් වූ සමීප ලෙන්ගතුකමක් විය.

1970 මැයි 27 දින පවත්වන ලද මහ මැතිවරණයෙන් මහින්ද රාජපක්ෂ බෙලිඅත්ත මන්ත්‍රීවරයා ලෙස පාර්ලිමේන්තුවට තේරී පත්වෙයි. අනුර බණ්ඩාරනායක මහතා සමග හාද වූ මහින්ද 1971 ජනවාරි මස 6 දින සිට මාස 6ක කාලයක් පාර්ලිමේන්තුවෙන් නිවාඩු ලබාගෙන ලන්ඩන් බලා යයි. ඔවුන් නැවත පැමිණෙන්නේ 1971 අප්‍රේල් කැරැල්ලත් හමාර වී 1972 ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් වන්නට සැරසෙමින් සිටියදීය. මේ අතරතුර බෙලිඅත්තේ ජනතාව "අපේ මන්ත්‍රීතුමා සොයා දෙන්නැයි" කියමින් පුවත්පත් දැන්වීමක්ද පළ කරවා තිබිණි. 1970-77 සමයෙහිද තානායම් වලදී තරුණියන්ට පත්වීම් ලබාදීම ගැන මහින්ද ප්‍රසිද්ධියක් උසුලයි. "මහින්ද ගෙන් පත්වීමක් ලබාගත් තරුණියකට කසාද බඳින්නට බැරිය" යැයි එකල ප්‍රකට කතාවක් ද පැතිර තිබිණි.

ජනාධිපති මැතිවරණය අවසන් වීමත් සමගම ජනාධිපතිවරණය මෙහෙය වූ පිරිසෙන් බොහෝ දෙනෙකු නැක්සලයිට් කුමන්ත්‍රණ චෝදනාවක් මත අත්අඩංගුවට ගෙන රඳවා තබාගන්නා ලදි. ඒ අය අතර විජය කුමාරතුංග, රත්නසිරි වික්‍රමනායක, ඔසී අබේගුණසේකර, ෆීලික්ස් පෙරේරා, මර්වින් සිල්වා, දේව බණ්ඩාර සේනාරත්න, මහින්ද විජේසේකර යන අයද වූහ. මේ සම්බන්ධයෙන් වත් එවකට පක්ෂයේ තරුණ නායකයකු වූ මහින්ද රාජපක්ෂ කට ඇරියේ නැත.



*විජය කුමාරතුංග, රත්නසිරි වික්‍රමනායක, ඔසී අබේගුණසේකර, මර්වින් සිල්වා, මහින්ද විජේසේකර*

එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව සමයේ පවත්වන ලද පාද යාත්‍රා, ජනසෝසා සහ ජනඅත්වැල ආදී උද්ඝෝෂණවල නිර්මාතෘවරයා මහින්ද බව කියන්නට ඔහු ගැන කතා ලියූ පත්තර කාරයෝ උත්සාහ කළහ. ඇත්ත වශයෙන්ම ඒ කිසිවක් මහින්ද ගේ නිර්මාණයන් නොවේ. "මහින්ද චින්තන" නමින් ඉදිරිපත් කරන ප්‍රතිපත්ති ප්‍රකාශනය සේම ඒ සියල්ලද අනුන්ගෙන් ණයට ඉල්ලා ගත් දේය. මේ සියලු උද්ඝෝෂණ වල නිර්මාතෘවරයා ප්‍රවීණ මාධ්‍යවේදීයෙකි. කෙසේ නමුත් වෙනත් කුසල් බලයකින් මහින්දට ඒවායෙහි අයිතියට හිමිකම් කියන්නට හැකියාව ලැබී ඇත. මහින්දගේ මානව හිමිකම ආරක්ෂක භූමිකාව පසුපස සිටියේ ද ඔහුය. අද ඔහු මහින්ද අසල නැත.

## ප්‍රතිපත්තියක් නැති මහින්ද

රටේ දේශපාලනයෙහි තීරණාත්මක අවස්ථාවන් පැමිණි අවස්ථාවලදී මහින්ද රාජපක්ෂ මහතා කිසිම පැහැදිලි ස්ථාවරයක පිහිටා සිටියේ නැත. අඩුම තරමින් පැහැදිලිව තම ස්ථාවරය මේ යැයි ජනමාධ්‍යයට කරුණු කීවේ වත් නැත. එහි හොඳම උදාහරණය වන්නේ 1994 මැතිවරණයෙන් පසුව ආ කැබිනට් මණ්ඩලයේ කම්කරු ඇමතිවරයා ලෙස රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුවට ගෙන එන්නට උත්සාහ කළ "කම්කරු ප්‍රඥප්තිය" සම්බන්ධ සිද්ධියයි. කම්කරු ප්‍රඥප්තිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ආසන්න වන විට ජනාධිපතිනියගේ නියමයෙන් එය අත්හිටුවන්නට මහින්ද සිදුවිය. එහෙත් ඒ පිළිබඳව කිසිම වචනයක් නොකියා මහින්ද පලා ගියේය. එක්සත් ජාතික පක්ෂයේ සාම ක්‍රියාවලිය ගැන මහින්දට ස්ථාවරයක් තිබුණේ නැත. එය හොඳද නරකදැයි වත් කියන්නට කට ඇරියේ නැත. සටන් විරාම ගිවිසුම ගැන "මහින්ද චින්තන"යේ වචනයක් වත් නැත. එල්.ටී.ටී.ඊ.ය ඉදිරිපත් කල අන්තර්වාර පාලන අධිකාරිය පිළිබඳ යෝජනාව සම්බන්ධයෙන් ද මහින්ද අනුගමනය කළේ නිහඬ පිලිවෙතකි. ඉන්පසුව ආ සුනාමි සහන මණ්ඩලය සම්බන්ධයෙන් වුවත් මහින්දට මතයක් ස්ථාවරයක් තිබුනේ නැත.

## මහින්ද චන්ද්‍රිකාට වෛර කළේය

මහින්ද රාජපක්ෂ මහතාට හැමදාම තිබුනේ බලය ලබා ගැනීම ගැන අදහසක් පමණකි. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය එංගලන්තයේ සිට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කැඳවාගෙන එන විට එයට එක හෙළා එරෙහි වූ අනුර සමග මහින්ද එයට අකමැති විය. ඒ සඳහා කළ හැකි සියලුම සතුරුකම් කළේය. චන්ද්‍රිකා ශ්‍රීලනිපයට ගත්තොත් අනුර යූඇන්පියට යාවී යැයි මැතිනියට කියමින් චන්ද්‍රිකාගේ ආගමනය වලක්වාලන්නට කටයුතු කළ මහින්ද අනුර සමග යූඇන්පියට ගියේ නැත. අනුර යවා මහින්ද පක්ෂය තුලම රැඳී සිටියේය. අනුර වටේ ගොස් නැවත ශ්‍රීලනිපයට එනවිට ශ්‍රීලනිපය මහින්ද ඩැහැගෙනය. මේ සමාන වන්නේ 82කදී අනුර මෛත්‍රී බිඳී යාමෙන් පසුවය. මෛත්‍රීපාලගේ දේශපාලන අනාගතය අවසන් කිරීමට බණ්ඩාරනායකවරුන්ට හැකිවීමේ සිද්ධියටය. බණ්ඩාරනායකවරු මෙසේ ලණුදීමට සමතුන්ය. මෙවර ඒ සමත්කම පෙන්වා ඇත්තේ බණ්ඩාරනායකලා ගෙන්ම එම උපාය ඉගෙනගත් රාජපක්ෂවරුන්ය.

1994 මහ මැතිවරණය ආසන්න වෙද්දී පොදුජන එක්සත් පෙරමුණේ අග්‍රමාත්‍ය අපේක්ෂිකාව ලෙස චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ඉදිරිපත් කරවීමට එරෙහිව කුමන්ත්‍රණයක් සංවිධානය කළේ මහින්දය. නුගේගොඩ නාවල පාරේ නන්දා මාවතේ පිහිටි චමල් රාජපක්ෂ මහතාගේ නිවසේ දී මන්ත්‍රිවරු 37 දෙනෙකු රැස්වී චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට අගමැති අපේක්ෂකකම නොදෙන්නට කළ හැකි සියලු දෙ කරන්නට තීරණය කරන ලදි.



*උඹ මට වේ.... කියනවා....*

1992 මාර්තු මස 16 වැනි දින කොළඹ සිට කතරගම දක්වා ගමන් කළ පාද යාත්‍රාවට චන්ද්‍රිකා මැතිනිය සහභාගි කරවා ගැනීම වැළැක්වීමට මහින්ද උත්සාහ කලද එය

සාර්ථක නොවීය. මාර්තු 25 වැනි දා සවස මාතර දී පැවති ජනරැලිය අමතන්නට චන්ද්‍රිකා මහත්මියට ඉඩ නොදී ඇය එම වේදිකාවෙන් බැස්ස වූයේ මහින්ද රාජපක්ෂ විසිනි. එදා චන්ද්‍රිකා මහත්මිය වේදාකවේ සිටිනු දුටු මහින්දට යක්ෂාරූඪ විය. ඔහු අමු තිත්ත කුණුහරුපයෙන් චන්ද්‍රිකාට බැන්නේය. එම කුණුහරුප මාලාව අසා සිටින්නට නොහැකි වූ තැන ඇය වේදිකාවෙන් බැස ගියාය.

පාද යාත්‍රාවෙන් පසු මාතර පැවති මංගල සමරවීර මහතා සංවිධානය කළ කළු විරෝධතා රැස්වීමේ දී මහින්ද රාජපක්ෂට කතාවක් වෙන් කර තිබුනේ නැත. හදිසියේ හම්බන්තොටින් ගෙනා මැර පිරිසකුත් සමග එතැනට කඩා වැදුනු මහින්ද තමන්ට කතාවක් නොදුන්නොත් චන්ද්‍රිකාගේ කතාවට තම පිරිස ලවා හූ කියවා රැස්වීම කඩාකප්පල් කරන බවට තර්ජනය කළේය. අසරණ වූ මංගලට සිදුවූයේ මහින්දට කතාවක් දීමටය. මහින්ද රාජපක්ෂගේ දේශපාලනය එසේ නොගැඹුරු වුවත් ප්‍රතිපත්ති විරහිත වූ එකකි. ඒ නිසාම ඕනෑම තක්කඩියෙකුට මහින්ද ඕනෑම පාරක දක්කා ගෙන යා හැකිය. ඡන්දය ලැබෙන්නේ නම් ඕනෑම බලවේගයක ටැක්සියක් බවට පත්වීමට මහින්ද රාජපක්ෂ අමුඩය තර කරගෙන ඉදිරිපත් වේ.

*'යුද්දේ දිනුවේ මමයි... හැමදාමත් රජා මමයි...'*



# 2
# මහින්ද රාජපක්ෂගේ දේශපාලන ක්‍රමෝපාය

මැර දේශපාලනයෙන් අත්පොත් තැබූ මහින්ද එම දේශපාලන භාවිතය ඔහුගේ 46 අවුරුද්දක දේශපාලන ගමනේ දී ද භාවිතයට ගත් බව ඔහුගේ දේශපාලන ක්‍රියාවලිය සියුම්ව නිරීක්ෂණය කිරීමේ දී පැහැදිලිවේ. බෙලිඅත්ත ආසනයේ සුප්‍රසිද්ධ මිනීමරුවන් වන ජුලම්පිටියේ අමරේ, වම්බොට්ටා, චණ්ඩිමල්ලි, පල්ලත්තර හින්නි මහත්තයා මහින්දගේ ප්‍රධානම දේශපාලන ආධාරකරුවන් විය. ආරම්භයේ සිටම මහින්ද ශීලාචාර ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රතිපත්ති අනුගමනය කල පුද්ගලයකු නොවීය. මෙම අශීලාචාර ආරම්භය ඔහුගේ මුලු දේශපාලන ජීවිතය පුරාම දක්නට ලැබුනු අතර ජනාධිපති ධූරය ලබා ගැනීම දක්වා එම මැර දේශපාලන සංස්කෘතිය අනුගමනය කලේය. ජනාධිපතිවීමෙන් පසුව එම අශීලාචාර මැර දේශපාලන ප්‍රතිපත්ති අනුව රට පාලනය කිරීම නිසා තවත් අවුරුදු ගණනාවකට නිවැරදි කල නොහැකි පාදඩ දේශපාලන සංස්කෘතියක් ලංකාවේ ඇති විය. මහින්දගේ දේශපාලන සංස්කෘතිය තවදුරටත් විග්‍රහ කර බලන විට ඔහු ඉතා සියුම් අන්දමින් මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මක කල බව අවබෝධ වේ.

## මහින්ද ගේ අශීලාචාර දේශපාලනය

ජාතික දේශපාලනයේ සිට ප්‍රාදේශීය දේශපාලන ව්‍යුහය සකස් කිරීමේ දී මහින්ද නිතරම සිය අවසානය යොමු කලේ උගත්, බුද්ධිමත්, ශීලාචාර පුද්ගලයින් සිය දේශපාලන කටයුතු වලට සම්බන්ධ කර ගැනීමට නොවේ. මහින්ද ගේ දේශපාලන දැක්ම අනුව පලාත් නායකයින් දිස්ත්‍රික් නායකයින් හා ප්‍රාදේශීය නායකයන් ඔහු තෝරාගනු ලැබුවේ දේශපාලන පරිචය අනුව නොව හොරකම් මැරකම් වලට එම පුද්ගලයන් දැක්වූ දක්ෂතාවය මතය. මහින්දගේ ඉතාම සමීප දේශපාලන සඟයින් ගේ නම් ලැයිස්තුවලට අනුව මර්වින් සිල්වා, දුමින්ද සිල්වා, කුමාර වෙල්ගම, මහින්දානන්ද අලුත්ගමගේ, රෝහිත අබේගුණවර්ධන, අරුන්දික ප්‍රනාන්දු, ජොන්ස්ටන් ප්‍රනාන්දු, ලක්ෂමන් වසන්ත, විමල් වීරවංශ, ජගත් පුෂ්පකුමාර, ගාමිණී ලොකුගේ යන සියලුම දේශපාලනඥයන් උසස් අධ්‍යාපනයක් නොලද සමාජ විරෝධී ව්‍යාපාර වලින් අසාධාරණ ලෙද ධනය උපයාගත් එමෙන්ම මිනීමැරම් වලට, කුඩු, එතනෝල් ජාවාරම්වලට සම්බන්ධ වී ඇති පුද්ගලයන්ය.

කරුණා අම්මාන්, පිල්ලෙයාන් වැනි මිනීමරු කොටි ත්‍රස්තවාදීන්ට ශ්‍රී.ල.නි.ප. වැනි ජාතිමාමක, දේශමාමක පක්ෂයක උපසභාපති පදවි ලබා දී කැබිනට් ඇමති ධූර, මහ ඇමති ධූර ලබාදීම



*මර්වින් සිල්වා, දුමින්ද සිල්වා, කුමාර වෙල්ගම, මහින්දානන්ද අලුත්ගමගේ, රෝහිත අබේගුණවර්ධන, අරුන්දික ප්‍රනාන්දු, ජොන්ස්ටන් ප්‍රනාන්දු, ලක්ෂ්මන් වසන්ත, විමල් වීරවංශ, ජගත් පුෂ්පකුමාර, ගාමිණී ලොකුගේ, ලන්සා, චොකා මල්ලී, ඩී.වී. උපුල්, සම්පත්, කරුණා, පිල්ලයාන්, කේ.පී., උදය ගම්මන්පිල, ප්‍රසන්න රණතුංග*

දක්වා මහින්ද මෙහෙය වූයේ ඔහුගේ පාදඩ දේශපාලන සංස්කෘතියේ අභාෂය නිසාය. තමාගේ බලය ආරක්ෂා කර ගැනීමට කුමන හෝ පාවාදීමක් කිරිමට මහින්ද බිය නොවීය. මහින්දගේ මුලු දේශපාලන භාවිතයම තම පවුල, ඥාතීන් සහ ගජ මිතුරන්ගේ වාසිය සඳහා යොදා ගත්තා විනා රටේත් ජාතියේත් උන්නතියට යොදා ගත්තේ නැත.

## සහෝදර සමාගම බිහි කිරීම (Rajapakse & Brothers)

ජනාධිපතිවීමෙන් අනතුරුව පළමුවෙන්ම කරනු ලැබුවේ සිය පවුලේ සහෝදරයින් රජයේ ඉතාම ඉහල තනතුරුවලට පත් කර ගැනීමයි.අ.පො.ස. සා.පෙල හරියට සමත් නැති ගෝඨාභය රාජපක්ෂ රටේ ඉහළම අමාත්‍යාංශය වන ආරක්ෂ අමාත්‍යාංශයේ ලේකම් ධූරයට පත් කළේය. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අධි ශ්‍රේණියේ තනතුරක් වන ආරක්ෂක අංශයේ ලේකම් ධූරයට තම සෙහොයුරා පත් කර ගැනීමේ දී මෙතෙක් රාජ්‍ය නායකයින් අනුගමනය කල සම්ප්‍රදායන් අනුග





*සහෝදර සමාගම: බැසිල්, චමල්, ගෝඨ*

මනය කිරීමට මහින්ද කටයුතු නොකලේ එක් අතකින් ශීලාචාර දේශපාලනය පිළිබඳ ඔහු තුළ විශ්වාසයක් නොතිබීමත් අනිත් අතින් බලකාමය තුලින් සියලුම පිළිගත් නීතිරීති සම්ප්‍රදායන් බිඳ දමමින් සිය පවුලට එම බලතල ලබා ගැනීමට තිබූ ආශාව නිසාය. බැසිල් රාජපක්‍ෂ වැනි නූගත් දේශපාලන අත්දැකීම් නැති පුද්ගලයකුට ආර්ථික කටයුතු වැනි ප්‍රබල අමාත්‍යාංශයක් ලබා දීමෙන් මහින්ද අදහස් කලේ තම පවුලට රටේසාරය උරාබීමට අවස්ථාවක් ලබාදීමයි.

## සහෝදර සමාගමේ දූෂණ

ලංකාවේ පමණක් නොව ලොව පුරාම Mr. 10% නමින් ප්‍රසිද්ධ බැසිල් රාජපක්‍ෂ කරන ලද දූෂණ ක්‍රියා පිලිබඳව වෙනම පරිච්ඡේදයක් ලියැවෙන නිසා ඔහුගේ හොරකම් පිළිබඳ විස්තර එහි ඇතුලත් කිරීමට බලාපොරොත්තු වෙමි. චමල් රාජපක්‍ෂ පිළිබඳව මෙතරම් අප්‍රසන්න දේශපාලන ඉතිහාසයක් නැති නමුත් ඔහුද සුපිරිසිදු දේශපාලනඥයකු නොවේ. චමල් රාජපක්‍ෂ වරාය ඇමති ධූරය දරන ලද කාල වකවානුව තුලදී සිදු වූ දූෂණ හා මූල්‍ය අක්‍රමිකතා රාශියකි. මහින්ද, ගෝඨාභය, බැසිල් හා නාමල් රාජපක්‍ෂවරුන් කරන ලද මූල්‍ය වංචා මිනීමැරුම් හා සසඳා බලන විට චමල් රාජපක්‍ෂ විසින් කරන ලද මූල්‍ය වංචා හා අල්ලස් ගැනීම අහස පොලොව හා සමානය. චමල් රාජපක්‍ෂට ඇති ප්‍රධානම චෝදනාවක් වන්නේ වරායට ක්‍රේන් මිළයට ගැනීමේ දී විශාල කොමිස් මුදලක් ලබා ගැනීමයි. ඊට අමතරව චමල් ගේ භාර්යාව වරායේ රැකියා ලබා දී විශාල වශයෙන් අල්ලස් ලබා ගත් බව ප්‍රසිද්ධ රහසකි. ඊට අමතරව තම පුත්‍රයා වන ශෂේන්‍ද්‍ර රාජපක්‍ෂ කතරගම දේවාලයේ ප්‍රධාන බස්නායක ධූරය දරූ කාලයේ කතරගම දේවාලයට ලැබෙන පූජා භාණ්ඩ, හාල්, ඇතුලු අනෙකුත් ආහාර ද්‍රව්‍ය ලොරි ගණනින් මාස් පතා ගෙන යන බව කතරගම දේවාලයේ සියලුම කපු මහතුන් ඇතුලු කතරගම ජනතාව හොඳින්ම දන්නා කරුණකි. ජනාධිපතිවරණයට දින දෙකකට පෙර කතරගම දේවාලයට ලැබී තිබූ පිත්තල පහන් ලොරි 3ක් චමල් රාජපක්‍ෂ ගේ බිරිඳ විසින් ගෙන යන ලද බව ප්‍රසිද්ධ කාරණයකි. කෙසේ වෙතත් රාජපක්‍ෂ පවුලේ අනෙක් සහෝදරයන් හා පුතුන් කරන ලද මූල්‍ය වංචා තරම් දූෂණ වංචා වලට චමල් හවුල් වී නැති බව කිව යුතුය.



## මහින්ද රාජපක්ෂ සිය අධිකාරී පාලන ක්‍රමය ගෙන යාම සඳහා ඉතා සූක්ෂම වැඩ පිළිවෙලක් අනුගමනය කළේය.

1. පළමුවෙන්ම පාර්ලිමේන්තු බලය ලබා ගැනීම සඳහා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් මිලට ගැනීම එක්සත් ජාතික පක්ෂයේ දූෂණයට යොමු වූ මන්ත්‍රීවරුන් තෝරා ඔවුන් විසින් කරන ලද යම් යම් දූෂණ ක්‍රියා පිළිබඳව ලිපි ගොනු සකස් කර නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවට එම මන්ත්‍රීන්ට පණිවුඩ යැවීම මහින්දගේ ප්‍රධානම වැඩ පිළිවෙලකි. 2002 - 2004 කාලයේ එ.ජා.ප. රජයේ සිටි දූෂිත ඇමතිවරුන් වන රෝහිත බෝගොල්ලාගම, කෙහෙළිය රඹුක්වැල්ල වැනි මන්ත්‍රීවරුන් මේ අයුරින් බිලි බා ගත් මන්ත්‍රීවරුන් දෙදෙනෙකි.

2. පක්ෂ අතරේ අවුල් ඇතිකොට එකිනෙකා බේද කර එම පක්ෂවල මන්ත්‍රීන් සන්ධානයට එක් කර ගැනීම. ජනතා විමුක්ති පෙරමුනේ ඉතා ක්‍රියාකාරී මන්ත්‍රීවරුන් වූ විමල් වීරවංශ ප්‍රමුඛ මන්ත්‍රීවරුන් 9 දෙනෙකු සන්ධානයට එක් කර ගත්තේ විශාල වශයෙන් ඔවුනට වරදාන හා මුදල් ලබා දීමෙන් බව පසු කාලයක අනාවරණය විය. විමල් වීරවංශ වැනි වාචාලයකු තමාගේ අනාගත පාදඩ දේශපාලන ව්‍යාපාරයට ඉතා අගනා පුද්ගලයකු බව මහින්දගේ කපටි දේශපාලන බුද්ධියට අවබෝධ වී තිබිණ.

## අනුර බණ්ඩාරනායක නොමරා මැරීම

3. 2004 වර්ෂයේ දී අගමැති ධූරයට අනුර බණ්ඩාරනායක පත් කිරීමට සියලුම කටයුතු කර තිබියදී අගමැති ධූරය කොල්ල කෑමට තරම් කුඩා බුද්ධියක් මහින්දට තිබිණ. පක්ෂයේ ජ්‍යොෂ්ඨයන් ලවා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනපතිනියට බලපෑම් එල්ල කොට අනුර බණ්ඩාරනායකද මුලා කොට අගමැති ධූරයට පත් වූ මහින්ද ඉන් පසුව 2005 ජනාධිපතිවරණයේ දී චන්ද්‍රිකා ජනපතිනියට විශාල වශයෙන් පක්ෂපාති වූ ප්‍රාදේශීය දේශපාලන නායකයින් ගේ බලපෑම එල්ල කිරීමට ඉතා සූක්ෂම වැඩ පිළිවෙලක් ගෙන ගිය අතර, අවසානයේ දී ජනාධිපති අපේක්ෂක ධූරය මහින්දට දීමට කුමාරතුංග ජනාධිපතිනියට සිදුවිය. මහින්දට ජනපති අපේක්ෂකත්වය දුන්නේ ඔහු ජයග්‍රහණය කල හොත් අනුර බණ්ඩාරනායක මහතාට අගමැති ධූරය ලබා දෙන බවට මහින්ද පොරොන්දු වූ බැවිනි. එහෙත් මහින්ද ජනාධිපති ධූරය ලබා ගෙන අගමැති ධූරය රත්නසිරි වික්‍රමනායක මහතාට පිරිනැමීය. මෙම කරුණු නිසාම හිත් වේදනාවට පත් අනුර බණ්ඩාරනායක මහතා අකාලයේ මිය ගියේය. මහින්ද හා අනුර ඉතා දීර්ඝ කාලයක් මිතුරන් ලෙස ආශ්‍රය කලද මහින්දගේ ඇති දුර්දාන්ත ගතිගුණ හා පවුල් බලය තර කර ගැනීමට තිබූ ආශාව නිසා අනුර වැනි මහත්මා දේශපාලන ප්‍රතිපත්ති අනුගමනය කල ගුණගරුක දේශපාලනඥයකුගේ සේවය අප රටට අහිමි විය.



*අනුරගේ පිටිපස්සට පිහියෙන් ඇන්න මහින්ද*

අනුර බණ්ඩාරනායක සුරාවට ගිජු වූ පුද්ගලයකු බවට පත් කරන ලද්දේ මහින්ද රාජපක්ෂ බව ප්‍රසිද්ධ රහසකි. අනුර බණ්ඩාරනායක අනාගතයේ දී ලංකාවේ ජනාධිපතිවීමට සුදුස්සකු බව අවබෝධ කර ගත් මහින්ද රාජපක්ෂ අනුරගේ දුර්වලතාවයෙන් ප්‍රයෝජන ගෙන ඔහු සුරාවට ඇබ්බැහි කොට අකාලයේ මිය යැමට සැලැස්වීම මහින්දගේ කපටි දේශපාලන ඥාණය විදහා දක්වන එක් අවස්ථාවකි. ශ්‍රී.ල.නි.පය තුල තමාට තරඟයක් දිය හැකි එකම පුද්ගලයා අනුර බණ්ඩාරනායක බව වටහාගෙන සිටි මහින්ද අනුර අකාලයේ මරු තුරුලට යැවීමට ඉතා සැලසුම් සහගත ලෙස ක්‍රියා කල බව ජ්‍යෙෂ්ඨ ශ්‍රී.ල.නි.ප පාක්ෂිකයන් ගේ මතයයි.

4. ජනතා විමුක්ති පෙරමුණ භේදබින්න කොට විමල් වීරවංශ ඇතුලු කණ්ඩායමක් රජයට බඳවා ගෙන ඇමති තනතුරු හා අනෙකුත් වරදාන දීමෙන් අනතුරුව ජාතික හෙල උරුමය ශ්‍රී.ල.නි.ප., ලං.ස.ස.ප. ආදී සුළු පක්ෂත් ඇමති වරදාන ලබාදීමෙන් රජයට එක් කර ගෙන ප්‍රධාන ප්‍රතිවාදියා වූ එ.ජා.පක්ෂය බිඳ දමා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රී 42ක් පමණ සන්ධාන ආණ්ඩුවට එක් කර ගැනීමට මහින්ද සමත් විය. මෙම පාදඩ දේශපාලන සංස්කෘතිය බිහි කිරීමේ නිර්මාතෘවරයා වූයේ මහින්ද රාජපක්ෂයයි. මන්ත්‍රීවරුන්ට රුපියල් මිලියන 500 දක්වා අල්ලස් ලබා දී මහින්දගේ සන්ධාන ආණ්ඩුව පවත්වා ගෙන ගිය බව පැහැදිලි කරුණකි.

යුද්ධය නිම කිරීමට මහින්ද රාජපක්ෂ ගේ දෑත ශක්තිමත් කිරීමට එක් වූ බව සන්ධාන ආණ්ඩුවට එක් වූ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ උදෘත පාඨය විය. සියයට අධික කැබිනට් මණ්ඩලයක් පත් කර තමාගේ බලය ආරක්ෂා කර ගැනීමට මහින්ද සමත් විය.

5 2005 ජනාධිපතිවරණය මහින්ද ජය ගත්තේ රනිල් වික්‍රමසිංහ මහතාට වඩා වැඩි ඡන්ද 185,000කිනි. මහින්ද කෙතරම් දේශපාලන උප්පරවැට්ටි කාරයෙකු ද යන්න මෙම ජනාධිපතිවරණයේ දී මනාව පැහැදිලි විය. මහින්දගේ අවසාන තුරුම්පුව වූයේ උතුරු - නැගෙනහිර ඡන්දය දීම වැලැක්වීමයි. තම සොහොයුරු බැසිල් රාජපක්ෂ හා ටිරාන් අලස් ලවා මිනීමරු ප්‍රභාකරන්ට රුපියල් මිලියන 800 අල්ලසක් ලබා දී ජනාධිපතිවරණයේ දී උතුරු - නැගෙනහිර ජනතාවට ඡන්දය දීමට නොහැකිවන ලෙස ප්‍රභාකරන් ලවා වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට තරම් මහින්දට කපටි දේශපාලන නුවණක් තිබිණ. යම් හෙයකින් උතුරු නැගෙනහිර ජනතාවට ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාවක් තිබුණේ නම් රනිල් වික්‍රමසිංහ මහතා වැඩි ඡන්ද (500,000) ජනාධිපති වරණයෙන් ජය ගැනීමට ඉඩ තිබිණ.

6. මහින්ද ගේ පාදඩ දේශපාලන වැඩ පිළිවෙල ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය, ලංකා සම සමාජ පක්ෂය, ජාතික නිදහස් පෙරමුණ, ජාතික හෙළ උරුමය ආදී සන්ධානයේ අනෙකුත් දේශපාලන නායකයින් ද අන්ධයන් සේ අනුගමනය කලේ මහින්ද ඔවුන් සියලු දෙනාම දූෂණයට පෙළඹවීමෙනි. අවශ්‍ය තරම් මහජන මුදල් ගසා කෑමට ඉඩදී සන්ධානයේ සිටි දේශපාලනඥයන් ඔහුගේ එහෙයියන් බවට පත් කර ගැනීමට මහින්ද ඉතා සූක්ෂම ලෙස වැඩ පිළිවෙල සකස් කර තිබුණි.

7. ජනතා දේශපාලනයේ සිටි සියලුම මන්ත්‍රීවරුන්ට ඇමතිපදවි, නියෝජ්‍ය ඇමති පදවි අනෙකුත් ව්‍යාපෘති ඇමති පදවි ලබා දී සියලුම සන්ධාන මන්ත්‍රීන් මහින්දගේ වහලුන් ලෙස තබා ගැනීම තුලින් ඔවුන් මහින්ද විසින් නටවන රූකඩයන් බවට පත්විය.

# මහින්ද රාජපක්ෂ සබඳතා පැවැත්වූ මිනීමරුවන් හා ඔවුන් කරන ලද අපරාධ



*මහින්ද කරුණා සමග තවත් මිනීමැරුමකට කුරුමානම් අල්ලයි.*

## කරුණා අම්මාන්

ඊලාම් කොටි සංවිධානයේ දෙවැනි නායකයා වූ කරුණා අම්මාන් රනිල් වික්‍රමසිංහ ගේ දේශපාලන උපක්‍රමයක් අනුව ප්‍රභාකරන් ගෙන් වෙන් කරවා ගත් නමුදු රනිල් ගේ ආණ්ඩුව අවුරුදු දෙකකින් කඩා වැටුනු පසුව මහින්ද රාජපක්ෂ අගමැති වීමෙන් අනතුරුව කරුණා අතරමං නොවී ආරක්ෂා වූයේ මහින්ද රාජපක්ෂ ගේ පිහිටෙනි. ව්‍යාජ ගමන් බලපත්‍රයක් ලබා දී කරුණා එංගලන්තයට යවා ආරක්ෂාව ඇතුව සිටීමට කටයුතු සැලැස්වූයේ මහින්ද රාජපක්ෂ මහතාය. සිය දහස් ගණන් අහිංසක සිංහල ජනතාව ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ දහස් ගණනක් මරා දැමීමට අණ දුන්නේ නැගෙනහිර පලාත භාරව සිටි කරුණා අම්මාන් ය. ප්‍රේමදාස යුගයේ නිරායුධ පොලිස් භටයන් 650ක් අමු අමුවේ මරා දැමුවේ කරුණා අම්මාන්ගේ නියෝග අනුවය.

සිංහල ජාතියේ පරම හතුරකු වූ කරුණාට ශ්‍රී.ල.නි.ප උප සභාපති තනතුර සහ කැබිනට් අමාත්‍ය ධූරයක් පිරිනැමීමට පවා දේශප්‍රේමී මහින්ද රාජපක්ෂ කාරුණික විය.

## පිල්ලෙයාන්

නැගෙනහිර පලාතේ කරුණා සමග කරට කර සිටිමින් දහස් ගණන් බාල වයස්කාර දමිළ දරුවන් කොටි සංවිධානයට බඳවා ගෙන කුඩා දරුවන් ලවා අති භයානක මිනිස් ඝාතන කිරීමට ප්‍රධානව ක්‍රියා කල (ශිවනේෂතුරේ) පිල්ලෙයාන්ට නැගෙනහිර පළාතේ මහ ඇමති ධූරය පිරිනැමීමට මහින්ද රාජපක්ෂ කටයුතු කළේ ජාතිය බිල්ලට දී සිය දේශපාලන බලය තහවුරුකර ගැනීම පිණිසය. ශ්‍රී මහ බෝධිය අසල සිය ගණනක් සිල් මෑණිවරුන් හා අහිංසක සිංහල ජනතාව මරා දැමීමට සැලසුම් කරන ලද්දේ කරුණා හා පිල්ලෙයාන් බව පසුව අනාවරණය විය. ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ මන්ත්‍රිවරුන් ඝාතනය කිරීම පිළිබඳව පිල්ලෙයාන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අත් අඩංගුවට ගෙන ඇත. මෙම මිනිමැරුම් පිළිබඳව රාජපක්ෂවරුන්ගේ සබඳතාවයන්ද යථා කාලයේදී අනාවරණය වනු ඇත.



*ළමා සොල්දාදුවන් දහස් ගණනින් බිල්ලට ගත් පිල්ලෙයාන් මහින්ද සමග තවත් එසේ ඝාතනවලට උපදෙස් දෙමින්.*

මහින්ද රාජපක්ෂ ගේ දේශපාලන විරුද්ධවාදීන් ඝාතනය කිරීමට කොටි ත්‍රස්තවාදීන් යොදා ගැනීම සඳහා කරුණා අම්මාන් සහ පිල්ලෙයාන් යොදා ගත් බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරන ලද පරීක්ෂණ වලින් කරුණු අනාවරණය වෙමින් පවතී. උතුරේ පුවත්පත කලාවේදීන් හා රාජ්‍ය නොවන සංවිධානයන් හි තරුණ පිරිස් රාශියක් ඝාතනය කොට එය කොටි සංවිධානය විසින් ඝාතනය කරන ලද බවට ප්‍රචාරය කරන ලද නමුදු මෙම ඝාතන වලට

පූර්ණ දායකත්වය දරන ලද්දේ මහින්ද රාජපක්ෂගේ අනුගාමිකයන් වූ කරුණා හා පිල්ලෙයාන් යන කොටි ත්‍රස්තවාදීන් දෙදෙනාය. නැගෙනහිර පළාතේ මුස්ලිම් ජාතිකයින් සිය ගණන් පල්ලිය තුලදීම බෝම්බ ගසා වෙඩි තබා මරා දැමීමටද කරුණා හා පිල්ලෙයාන් සම්බන්ද බවට කරුණු තහවුරු වී ඇත. උතුරු නැගෙනහිර පලාත්වල ශ්‍රී.ල.නි.ප බලය පතුරුවා ගැනීමට කරුණා හා පිල්ලෙයාන් යොදවා ගත් බවට අද ඔප්පු වී ඇත.

## කේ.පී. හෙවත් කේ පද්මනාදන්

වේලුපිල්ලේ ප්‍රභාකරන් ඝාතනය කොට කොටි සංවිධානය පරාජය කිරීමෙන් පසුව එහි නායකයා බවට පත් වූයේ කේ.පී. හෙවත් කුමරන් පද්මනාදන්ය. කොටින් අවසන් සටනේ යෙදෙන විට මැලේසියාවේ සිට රාජපක්ෂවරුන් සමග දුරකථන සාකච්ඡා මගින් ප්‍රභාකරන් බේරා ගැනීමට කටයුතු කල ප්‍රධාන පුද්ගලයා වූ කේ.පී. යුද්ධයේ අවසානයත් සමග මැලේසියාවේ සිට ලංකාවට ගෙන එන ලදී. කොටි සංවිධනයේ අන්තර් ජාතික සම්බන්ධතාවයන් ගොඩ නගමින් කොටින්ට අවශ්‍ය යුධ උපකරණ සැපයීමට අවශ්‍ය මූල්‍යමය සම්පත් යුරෝපයේ සිටින කොටි හිතවාදීන්ගෙන් ලබාගෙන අන්තර් ජාතික කොටි සංවිධාන ජාලය පිහිටුවීමේ මූලිකයා වූයේ කේ.පී. ය. යුරෝ ඩොලර් කෝටි ගණනින් ආධාර වශයෙන් ලබා ගෙන කොටි සංවිධානයට අවශ්‍ය සියලුම තුවක්කු, බෝම්බ, අධිබලැති මෝටාර්, යුධ ටැංකි හා ගුවන් යානා නාශක රොකට් ආදී සියල්ලම සපයන ලද්දේ කේ.පී. විසිනි.



*දහස් සංඛ්‍යාත සිංහල, දෙමල, මුස්ලිම් ජනතාව මරා දැමීමට අවි ආයුධ සැපයූ කේ.පී. ට මහින්ද රජසැප දුන්වගයි.*

තිස් අවුරුදු යුද්ධයකට අවශ්‍ය සියලුම මූල්‍යමය ආධාර සැපයූ ප්‍රධාන පුද්ගලයා රාජපක්ෂ රජය විසින් මැලේසියාවේ දී අත් අඩංගුවට ගෙන ලංකාවට ගෙනවිත් කිසිදු අධිකරණ ක්‍රියාමාර්ග යකට යොමු නොකලේය. රජයේ හමුදා භටයන් සිය ගණනක් යොදවා ආරක්ෂාව ලබා දී අති සුඛෝපභෝගී රාජ්‍ය අමුත්තන් සඳහා වූ නිවසක රාජ්‍ය ගෞරව සහ ආරක්ෂාව ඇතිව අවුරුදු කිහිපයක් රැකවරණය ලබා දී අවසානයේදී උතුරු පළාතේ රජයේ ඉඩම් අක්කර දහස් ගණනක් පිරිනමා රාජ්‍ය නොවන සංවිධානයක් පවත්වා ගෙන යාමට අවශ්‍ය සියලු පහසුකම් මහින්ද රාජපක්ෂ විසින් ලබාදුනි.

සිංහල, දෙමළ, මුස්ලිම් සිය දහස් ගණනක ගේ ජීවිත අහිමි කොට මිළ කල නොහැකි තරම් දේපල විනාශ කොට මුලු ලංකාවම මළ ගෙයක් බවට පත් කල දේශද්‍රෝහි, ජාතිද්‍රෝහි, මිනීමරු කොටි නායකයකු වන කේ.පී. ට විරුද්ධව නඩු පැවරීමට කිසිදු පිලිගත් සාක්ෂියක් නොමැති බවට ශ්‍රී ලංකා රජයේ නීතිපති වරයා ප්‍රකාශ කිරීම ලෝක ඉතිහාසයේ අසන්නට ලැබුනු ඉතාම නින්දා සහගත, හාස්‍යජනක සිදුවීමක් ලෙස සඳහන් කල හැකිය. රාජපක්ෂ විසින් පත් කරන ලද යුවන්ජන් විජේතිලක නමැති නීතිපතිවරයා ශ්‍රී ලාංකීය අධිකරණ ඉතිහාසයේ ඉතාම අපකීර්තිමත් නීතිපතිවරයා වශයෙන් ඉතිහාස ගත වන අතර, ඔහුගේ සොහොනට පවා ගෙන වදින ජාතික අපරාධයක් සිදුකල ජාතිද්‍රෝහි දේශද්‍රෝහි නරුමයකු වශයෙන් ඉතිහාසයට එක්වනු ඇත. ඇවන්ගාඩ් හා කේ.පී. සිද්ධියට අදාලව තීන්දුව ප්‍රකාශයට පත් කිරිම සඳහා රුපියල් මිලියන ගණන් සන්තෝෂමක් මොහුට ලැබුනු බවද වෙබ් අඩවි වල වාර්තා විය.

## කොටි සංවිධානයේ ඩොලර් කෝටි ගණන් රාජපක්ෂවරුන්ට

කේ.පී. ට මෙම සියලුම සහන ලබාදීමට රාජපක්ෂවරුන් තීරණය කලේ කොටි සංවිධානය සතුව පැවති අතිවිශාල මුදල් සම්භාරය නිසාය. කොටි සංවිධානය සතුව වාණිජ නැව් 18ක් පැවති බවට කරුණු අනාවරණය වී තිබුණි. ඊට අමතරව රත්‍රං ටොන් ගණන් සහ ඩොලර් බිලියන ගණන් විදේශීය බැංකුවල තැන්පත් කර තිබුණි. මෙම සියලු දේපල හා මුදල් රාජපක්ෂවරුන්ට හිමි කර ගැනීමේ පරම චේතනාව ඇතිව කේ.පී. ට රජ සැප ලබාදී එම වත්කම් රාජපක්ෂවරුන් කොල්ල කා ඇති බව අද අනාවරණය වෙමින් පවතී.

මහින්ද, බැසිල්, ගෝඨාභය, නාමල්, යෝෂිත සහ රාජපක්ෂ පරම්පරාවේ, ජාතිද්‍රෝහීන් තම තමන්ගේ වස්තු තණ්හාව නිසා මුලුමහත් ජාතියම විනාශ කල කේ.පී. ආරක්ෂා කර ගැනීමේ ඉතාම තුච්ඡ, ජඩ,. නින්දිත ක්‍රියාවලියක නිරත විය. මෙම අපරාධයට හවුල් රාජපක්ෂ පරපුරේ සියලුම සාමාජිකයන්ට අද දිට්ඨ ධම්මවේදනීය කර්මය පල දී ඇත. බුදු දහමේ නියාමය අනුව මෙම අපරාධ කිරීමෙන් ලබන ආත්මයේ බලු, කැනහිලුන් වශයෙන් උපදින බව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ප්‍රකාශ කර තිබුනි.

## බෙලිඅත්ත ආසනයේ මහින්දගේ මිනීමරුවෝ

### ජූලම්පිටියේ අමරේ

මිනිමැරුම් සහ අපරාධ නඩු 21 සම්බන්ධව අවශ්‍යාව සිටි සැකකරුවෙකු වන ජූලම්පිටියේ අමරේ තවමත් මහින්ද රාජපක්ෂ ගේ ඉතාම විශ්වාසවන්ත ආධාරකරුවෙකි. මහින්දගේ ආධාර උපකාර ලබමින් 13 අවුරුද්දක් උසාවියට ඉදිරිපත් නොවී කට්ටි පනිමින් සිටි ජූලම්පිටිය අමරේට සම්පූර්ණ අනුබලය හා ආරක්ෂාව ලබාදුන් මහින්ද රාජපක්ෂ වරක් ජූලම්පිටිය අමරේ තංගල්ල බන්ධානාගාරයේ විශාල කලබලයක් කල අවස්ථාවේ එය මැඩ පැවැත්වීමට හැකි වූයේ තමාට පමණක් බව ඔහුගේ චරිතාපදාන පොතක සඳහන් වේ.


*ජූලම්පිටියේ අමරේ*

ජූලම්පිටියේ අමරේ තංගල්ල බන්ධානාගාරයේ ආයුධ කාමරයට වැදී සිටි අතර, මහින්ද රාජපක්ෂ එහි ගොස් "අමරේ මේ ඇවිත් ඉන්නේ මහින්ද රාජපක්ෂ" කියූ පමණින් අමරේ එලියට ආ බව මහින්ද ගේම වචන වලින් එම කෘතියේ දක්වා ඇත. සියලුම පාර්ලිමේන්තු මැතිවරණ හා පළාත් සභා මැතිවරණ, ප්‍රාදේශීය සභා මැතිවරණ වලදී T56 තුවක්කු දෙකක් සහිතව මුලු හම්බන්තොට දිස්ත්‍රික්කය පුරාම සංචාරය කිරීමට ජූලම්පිටිය අමරේ මහින්ද රාජපක්ෂගෙන් විවෘත බලපත්‍රයක් ලබාගෙන තිබූ බව එම ප්‍රදේශය භාර පොලිස් නිලධාරීන් ප්‍රකාශ කර ඇත. උසාවිය මගින් විවෘත වරෙන්තු 30කට වඩා ලබා සිටියදී 2005 - 2010 ජනාධිපතිවරණ වලදී ජූලම්පිටිය අමරේ මහින්ද රාජපක්ෂගේ වේදිකාවල සිටිනු දක්නට ලැබිණ. තමාට දේශපාලන වාසියක් ලැබේ නම් තම අනුගාමිකයා මිනී මරුවකුද, ස්ත්‍රී දූෂකයෙකුද, බේබද්දකුද, අයි.ආර්.සි. කාරයකු ද යන්න ඔහුට අදාල නොවේ. මහින්දට අවශ්‍ය ඡන්ද ගොඩ වැඩි කර ගැනීමට ඔහුට ලබාදිය හැකි දායකත්වය කෙතරම් ද යන්නයි.

**හම්බියාස් අයිතිකරු දැස් බැඳ සුදු වෑන් රියකින් පැහැරගෙන විත් අරලියගහ මැදුරේ ලක්ෂ 300ක් කප්පම් ගත්තේ මහින්දමයි - මහින්දගේ සුදු වෑන් මිනීමරුවෙක් හෙළිකරයි.**
(ලංකා ඊ නිවුස් - 2015 මැයි 05, ප.ව. 4.10) මැදමූලන මහින්ද රාජපක්ෂ චීන ව්‍යාපෘති හරහා මහා

පරිමාණයෙන් මුදල් ගසා කෑමට පෙර බලයට ආ මුල් වකවානුවේ එනම් 2006 දී පමණ යුද්ධය පවතිද්දී රටේ ප්‍රධාන පෙලේ මුස්ලිම් සහ දෙමළ ව්‍යාපාරිකයන් සුදු වෑන් වලින් පැහැරගෙන අරලියගහ මැඳුරට ගෙනැවිත් කෝටි ගණනින් කප්පම් මුදල් රැගෙන ඇතැයි සාක්ෂි සහිතව ලංකා ඊ නිවුස් වෙත ලැබී තිබේ.

එවන් එක් ව්‍යාපාරිකයෙක් නම් ලංකාවේ නමගිය ඇඟලුම් ව්‍යාපාර ජාලයක් වන හමීඩියාස් අයිතිකාර මොහොමඩ් අමීන් මහතා ය. ඔහු සුදු වෑන් රියකින් පැහැරගෙන දෑස් බැඳ අරලියගහ මැඳුරට ගෙන්වා රුපියල් ලක්ෂ 300 ක් කප්පම් ලෙස ලබා ගෙන ඇත්තේ මහින්ද රාජපක්ෂ විසින් ම බව පැහැර ගැනීමට හවුල් වූ පුද්ගලයෙක් ලංකා ඊ නිව්ස් වෙත පාපොච්චාරණය කළේය.

කප්පම් නොගෙවූ ව්‍යාපාරිකයන් කොටි ලේබල් ගසා නැගෙනහිරට ගෙන ගොස් වද දී මරා දමා මළ සිරුර කටු කම්බි සහ ගල් බැඳ මුහුදේ ගිල්වා අතුරුදහන් කර ඇත. සමහරුන් කප්පම් ගෙවුවද මරා දමා තිබේ. ව්‍යාපාරිකයන් තෝරා ගෙන ඇත්තේ ද මහින්ද රාජපක්ෂ මුදල් ඇමති ලෙස බදු ගෙවා නැති ව්‍යාපාරිකයන්ගේ තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන ය.



*අබේරත්න*

මේ සඳහා කීර්ති ගජනායක නම් එකළ බුද්ධි අංශ ලොක්කාද හවුල් වී ඇති අතර අබේරත්න නම් බුද්ධි අංශ නිළධාරියා රාජපක්ෂලා වෙනුවෙන් පැහැර ගැනීම් සහ ඝාතන සිදු කළ පුද්ගලයන්ගෙන් ප්‍රධාන අයෙකි.

වැල්ලවත්තේ තෙල් මුදලාලි, කොළඹ සීනි මුදලාලි, ආදීහු මෙලෙස පැහැරගත් ව්‍යාපාරිකයන් අතර වෙති. වැල්ලවත්ත විදේශ මුදල් හුවමාරු මධ්‍යස්ථානයක් වූ ප්‍රසන්න එක්ස්චේන්ජ් නමැති ආයතනය මංකොල්ලා කා ඇත්තේ ද මෙම පිරිසම ය. මෙවැනි අත්දැකීම් වලට මුහුණු දුන් තවත් ව්‍යාපාරිකයන් රාශියක් වෙතත් රාජපක්ෂලා තවමත් නිදැල්ලේ සිටින බැවින් ඔවුන් බියපත්ව ඉදිරිපත් නොවෙති.



*සුදු සීයා*

අබේරත්න නමැති සුදුවෑන් මිනීමරුවා සෘජුවම මහින්ද රාජපක්ෂ සහ ගෝඨාභය රාජපක්ෂ විසින් මෙහෙයවා ඇති අතර මීට පෙර ලංකා ඊ නිවුස් සේයාරුවක් සමග හෙළිදරව් කල ෆේබියන් රොයිස්ටන් ක්‍රිස්ටෝපර් තුසෙන්ට් නමැති මිනීමරුවාද අබේරත්න ගේ මිනීමරු කණ්ඩායමේ අයෙකි.

2007 ජුනි 03 වැනි දා කොළඹ කොටුව දුම්රිය පොල ඉදිරිපිට දී පැහැරගෙන මරා දමන ලද රතු කුරුස සාමාජිකයන්ගේ ඝාතනයන් ද සිදු කරන ලද්දේ මේ දෙදෙනා එක්ව ය.

අබේරත්න සහ තුසෙන්ට් නමැති මිනීමරුවන් දෙදෙනාම කොළඹ අපරාධ පරීක්ෂණ දෙපර්තමේන්තුව මගින් අත් අඩංගුවට ගත්තද ගෝඨාභය රාජපක්ෂගේ නියෝග මත චෝදනා නැතැයි සඳහන් කරමින් නිදහස් කර යවා ඇත.



# 3

# ශිරන්ති වික්‍රමසිංහ රාජපක්ෂ

*මුදලට ගිජු වූ රූප සුන්දරී*

ශිරන්ති වික්‍රමසිංහ මහත්මිය පිලිබඳව සොයා බලන විට ඇයගේ උපන්දිනය පිලිබඳව නිසි තොරතුරු සොයා ගැනීම අපහසුය. ඇයගේ ජීවදත්ත පිටුවේ උපන් දිනය පිළිබඳව සඳහන් වී නැත. කෙසේ වුවද ඇය කොළඹ ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමයේ අ.පො.ස. (සා.පෙ.) දක්වා උගත් බවට තොරතුරු ඇත.

මහින්ද රාජපක්ෂ ශිරන්ති වික්‍රමසිංහ සමග විවාහ දිවියට එළැඹෙන්නේ 1983 වර්ෂයේ දීය. එම විවාහය සිදු කල ආකාරය පිළිබඳව සමාජයේ විවිධ ඕපාදූප පැතිර ගියද හිටපු අගවිනිසුරු සරත් නන්ද සිල්වා මහතා මහින්ද - ශිරන්ති විවාහ මංගල්‍යයේ ප්‍රධන චරිතයක් රඟ පෑ පුද්ගලයකු වශයෙන් ප්‍රසිද්ධය. එම සබඳතාවය නිසා 2004 සුනාමි ඛේදවාචකයේ දී මහින්ද රාජපක්ෂ රුපියල් මිලියන 800 මංකොල්ල කෑමේ සිද්ධිය යට ගසා 2005 දී ජනාධිපතිවරණයේ







*ශිරන්ති වික්‍රමසිංහ 1965 ලෝක රූ රැජිණ තරඟයට ඉදිරිපත් වු අවස්ථාව. (වම) 1965 ලක් රූ රැජිණ තරඟයට ඉදිරිපත් වු අවස්ථාව. (දකුණ)*








*මහින්ද පවුලේ අය සමඟ සතුටු සාමීචියක.*

*ශිරන්ති ජනාධිපති පරීක්ෂණ කොමිසමට. (ඉහල)*
*ශිරන්ති නාමල් සමඟ උසාවියට. (පහල)*

දී මහින්දට ඉදිරිපත්වීමට අවස්ථාව සළසා දීම කදිම සාක්ෂියකි. මහින්ද-ශිරන්ති විවාහයේ දී අනුර බණ්ඩාරනායක දෙවන මනමාලයා ලෙසද, සරත් සිල්වාගේ පුතා මල් කුමරු ලෙසද ජයාරූපවලට ඉදිරිපත් විය.

ශිරන්ති වික්‍රමසිංහ 1965 රූප රාජිණී තරඟයට ඉදිරිපත් වූ අතර ලංකා රූ රැජින ලෙස අභිෂේක ලැබුවාය. ඇයගේ පියා නාවික හමුදාවේ සාමාන්‍ය නිළයක් දැරූ අතර, සහෝදරයන් දෙනෙකු එම පවුලට අයත් විය.

## දියණියගේ මරණය

ශිරන්ති විවාහයෙන් පසුව මුලින්ම ගැහැණු දරුවකු බිහිකල අතර, එම ගැහැණු දරුවා ඉතා බිලිඳු අවධියේදීම මිය ගිය බව ප්‍රකට කරුණකි. මහින්ද - ශිරන්ති යුවලගේ කුළුදුල් දරුවාගේ මරණය පිලිබඳව විවිධ කතා එකල පැතිර ගියේය.

මින් එක කට කතාවක් වනුයේ ශිරන්ති සමග වූ බහින් බස් වීමකින් පසුව මහින්ද දරුවා පොළොවේ ගසා මරා දැමූ බවයි. මෙය ඉතා සහාසික කටකතාවක් විය හැකිය. දෙවන කතාව නම් මහින්ද දරුවා උඩ දමමින් සුරතල් කරමින් සිටින විට ඔහුගේ සරම උණා වැටීම නිසා දරුවා අත හැර සරම අල්ලා ගත් බවයි. කටකතාවල සත්‍ය අසත්‍යතාවය කෙසේ වුවද තමාට දියණියක් සිටි බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන ලද්දේ පොල්ගහවෙල ප්‍රදේශයේ ගැහැනු දරුවකු පාසල් බස් රථයේ ලෑලි කඩා වැටී මරු මුවට පත් වූ අවස්ථාවේදීය. දියණියකගේ වියෝව පිලිබඳව තමාට අත්දැකීම් තිබෙන බවට මහින්ද රාජපක්ෂ එම සිද්ධිය සිදුවූ අවස්ථාවේ දී ප්‍රකාශ කල බව පුවත්පත් වල පලවිය.

දැරියගේ අවාසනාවන්ත අභාවයෙන් පසුව ශිරන්ති පුතුන් තිදෙනෙකු බිහි කිරීමට සමත් වූවාය. නාමල්, යෝෂිත, රෝහිත යන නම් වලින් හැඳින්වූ එම පුතුන් තිදෙනා මහින්ද රාජපක්ෂ ජනාධිපති වීමෙන් අනතුරුව ඔටුනු පලන් කුමරුන් බවට පත්විය.

ශිරන්ති, ජනාධිපති ආර්යාව වීමෙන් අනතුරුව මෙරට ඉතිහාසයේ අනෙකුත් ජනාධිපති ආර්යාවන් තිදෙනාට වඩා ගිනස් වාර්තා තැබීමට සමත් ජනාධිපති ආර්යාවක් වූවාය.

# ශිරන්තිට එරෙහි චෝදනා සහ නඩු පැවරීම

## සිරිලිය ගිනුම

මහින්ද රාජපක්ෂ ගේ භාර්යාව වූ ශිරන්ති වික්‍රමසිංහ රාජපක්ෂ ආර්යාව මහින්දගේ පාලන සමය තුල කරන ලද විවිධ දූෂණ ක්‍රියා හා මිනීමැරුම් සම්බන්ධ කාරණා දැන් හෙලි වි ඇත. සිරිලිය ගිණුම නමින් ශිරන්ති පිහිටුවා ගෙන ඇති රාජ්‍ය නොවන සංවිධානය මගින් දූෂණ විශාල ප්‍රමාණයක් සිදු කර ඇති අතර, රාජ්‍ය දේපල අනිසි ලෙස භාවිතා කොට රුපියල් බිලියන ගණනින් මුදල් උපයා ගෙන ඇත. කොළඹ මරදාන සුදුවැල්ල මහජන බැංකු ශාඛාවේ සිරිලිය නමින් බැංකු ගිනුමක් පවත්වා ගෙන ගිය අතර මෙම සිරිලිය ගිනුම ආරම්භයේ සිටම ඉතා වංචාකාරී ලෙස පවත්වා ගෙන ගිය බවට දැන් කරුණු හෙලි වී ඇත. මෙම ගිනුමේ හිමිකාරියක් ලෙස ශිරන්ති රාජපක්ෂ ඇතුලු තිදෙනෙකුගේ නම් සඳහන් වී ඇත. ශිරන්තිගේ ජාතික හැඳුනුම්පත් අංකය ලෙස දක්වා ඇත්තේ 222222222X යන ව්‍යාජ හැඳුනුම්පත් අංකයකි. අනෙක් තැනැත්තියගේ ජාතික හැඳුනුම්පත් අංකය ලෙස දක්වා ඇත්තේ 111111111X. මෙවැනි ජාතික හැඳුනුම්පත් නිකුත් කර නොමැති බව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් වරයා රහස් පොලිසියට පවසා ඇත. පුදුමය නම් මෙම ගිනුම විවෘත කල සුදුවැල්ල මහජන බැංකුවේ කළමණාකාරවරයාට එරෙහිව කිසිඳු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීමයි.

ශිරන්ති රාජපක්ෂගෙන් සිරිලිය ගිනුම ගැන මහා පරිමාන මූල්‍ය වංචාවන් පිලිබඳව පරීක්ෂණ පවත්වන ජනාධිපති කොමිසම ශිරන්ති රාජපක්ෂගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීමට ඇය එම කාර්යාලය ගෙන්වීම වෙනුවට ඇය තමාගේ මස්සිනා වන කතානායක චමල් රාජපක්ෂ ගේ නිල නිවාසයට ගෙන්වා ගෙන ප්‍රකාශ සටහන් කර ගෙන ඇත. මෙම ක්‍රියාව නීතිය ඉදිරියේ සියල්ලටම සමානය යන සිද්ධාන්තය අමු අමුවේ උල්ලංඝනය කිරීමකි. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ පවා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ ඇති මහා පරිමාන මූල්‍ය වංචා විමර්ශන ජනාධිපති කොමිෂන් කාර්යාලයට ගෙන්වූ මෙම කොමිසම ශිරන්තිට මෙවැනි වරප්‍රසාදයක් ලබා දුන්නේ ඇයිදැයි ජනතාවට පැහැදිලි කල යුතුය.

එක්සත් ජාතීන් ගේ සංවිධානය විසින් සුනාමි ආධාර වැඩසටහන සඳහා පරිත්‍යාග කරන ලද සුඛෝපභෝගි ජීප්රථ දෙකක් ශිරන්ති රාජපක්ෂගේ සිරිලිය සංවිධානයට හා ඇගේ පෞද්ගලික පරිහරණයට යොදා ගෙන තිබූ බව අනාවරණය විය. එක් ජීප්රථයක් දික්වැල්ලේ දී අනතුරකට භාජනය වීමෙන් අනතුරුව හෙළි වී ඇති කරුණු අනුව මෙම ජීප් රථය 2004 සුනාමි ව්‍යසනය සඳහා එක්සත් ජාතීන් ගේ සංවිධානයේ නිළධාරීන් ගෙන්වා ඇති අතර, ශිරන්තිගේ සිරිලිය කටයුතු සඳහා යොදවා ගෙන ඇත. මෙම ජීප් රථය ලියාපදිංචි කර නැති අතර, මැදමූලන වීරකැටියේ රාජපක්ෂ පවුලේ වත්තක ගාල් කර තිබූ බව අනතුර සිදු කල රියදුරු පොලීසියට ප්‍රකාශ කර ඇත. මෙම ජීප්රථය අනතුරට භාජනය වීමෙන් අනතුරුව මහින්ද රාජපක්ෂ පාලනයක් යටතේ D.I.G. ගේ සිට අවසාන පොලිස් කට්ටා දක්වා ගල් ගසා මරන බවට නාමල් රාජපක්ෂ මුලසුනේ තබා ගෙන ප්‍රකාශ කල ටී.බී. උපුල් ගේ භාර්යාව විසින් බලහත්කාරයෙන් මහින්ද රාජපක්ෂ ගේ මැදමූලන වත්තට ගෙන ගොස් ඇත.

## තාජුඩීන් ගේ ජීප් රිය යොදා ගැනීම

සුප්‍රසිද්ධ රගර් ක්‍රීඩක තාජුදීන් පැහැර ගෙන ගොස් අමානුෂික ලෙස වද දී මරා ඔහුගේම මෝටර් රිය තුලට දමා ගිනි තැබීමේ සිද්ධියටද යොදා ගෙන ඇත්තේ ශිරන්ති රාජපක්ෂ එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් සිරිලිය ව්‍යාපෘතියට ලබා ගෙන ඇති ජීප් රියක් බව දැන් අනාවරණය වී ඇත.

තාජුදීන් පැහැර ගෙන ගොස් මරා දැමූ ආකාරය පිලිබඳව අවට නිවෙස්වල තිබූ CCTV දර්ශන අනුව ශිරන්ති ගේ ආරක්ෂාවට යොදවා තිබූ නාවික හමුදා නිළධාරීන් තිදෙනෙකු මෙම මිනිමැරුම සිදු කොට ඇති බව සාක්ෂි වලින් අනාවරණය වී ඇත. යෝෂිත රාජපක්ෂ ගේ පෙම්වතිය තාජුදීන්ගේ පැරණි පෙම්වතිය වූ අතර, එම සම්බන්ධය පිළිබඳව තාජුදීන් හා යෝෂිත රාජපක්ෂ අතර වු බහින්බස් වීම තාජුදීන් මරා දැමීමට හේතු වූ බවද, අනාවරණය වී ඇත. මෙහිදී මතුවන ගැටලුව වන්නේ යෝෂිත පුතාගේ විරුද්ධවාදියා වූ තාජුදීන් මරා දමන්නට ශිරන්තිගේ ආරක්ෂකයින් යොදවා ගත්තේ ඇයිද යන ප්‍රශ්ණයයි.



*තාජුඩීන් මරා දැමීමට යොදාගත් ඩිපෙන්ඩර් ජීප්රිය සමග ශිරන්ති.*

මෙම සිද්ධි මාලාව විකාශනය වන ආකාරය අනුව පැහැදිලිවන්නේ තාජුදීන් මරා දැමීමට ශිරන්ති රාජපක්ෂ ද හවුල් වී ඇති බවයි. ශිරන්තිගේ ජීප් රථය හා ඇගේ ආරක්ෂකයන් මෙම මිනීමැරුමට හවුල් වී ඇති බැවින්,මිනීමැරුමට අනුබලදීම සම්බන්ධයෙන් ශිරන්ති රාජපක්ෂද චූදිතයකු වීම නොවැලැක්විය හැකි කරුණකි.

මහින්ද හා රනිල් අයවැය විවාද කාලය තුලදී පාර්ලිමේන්තුවේ දී රහස් සාකච්ඡාවක් පැවැත්වූ බවද තාජුදීන් මිනීමැරුම් චෝදනා වලින් යෝෂිත, නාමල්, ශිරන්ති බේරා දෙන්නේ නම් තමන් ඕනෑම කොන්දේසියකට යටත්ව සම්පූර්ණයෙන් දේශපාලනයෙන් ඉවත්වන බව මහින්ද රනිල්ට පැවසූ බව පුවත්පත් වාර්තා පලවිය. මහින්ද ගේ මෙම යෝජනාවට රනිල් වික්‍රමසිංහ ගෙන් යහපත් ප්‍රතිචාරයක් නොලැබුනු බවද එම පුවත්පත් වාර්තාවල තවදුරටත් සඳහන් කර තිබුනි. මෙම ප්‍රවෘත්තිවල සත්‍ය අසත්‍යතාවය කෙසේ වුවද රාජපක්ෂ පවුල රටට සහ ජනතාවට කර ඇති අපරාධ වලට ස්වාභාව ධර්මයාගේ නීතිය අනුව සුදුසු දඬුවම් ලැබීම වැලැක්විය නොහැක.

## කාල්ටන් පෙර පාසල් හා ශිරන්තිගේ දූෂණ

කාල්ටන් පෙර පාසල ආරම්භ කරනු ලැබුවේ 1984 වර්ෂයේ දී තංගල්ලේ කාල්ටන් නමින් හැඳින් වූ නිවසේය. 1983 ශිරන්ති මහින්ද සමග විවාහ වූ අතර, මහින්ද රාජපක්ෂට පවුලට ජීවත්වීමට තරම් සැලකිය යුතු ආදායමක් නොතිබුනි. ඩී.ඒ. රාජපක්ෂ මිය යන විට ඔහුගේ වත්කම් ශත 28ක් බව ඩී.ඒ. රාජපක්ෂ මහතාගේ චරිතාපදාන වල සඳහන් වේ. උගසට සින්නවීමට ගිය මැදමූලන නිවස බේරා දුන්නේ සෑම් විජේසිංහ මහතා විසිනි. විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ පුස්තකාලයේ සුළු සේවකයකු ලෙස සුළු කාලයක් සේවය කල මහින්ද 1970 පාර්ලිමේන්තුවට පැමිණි නමුදු 1977 සිට 1992 දක්වා 12 අවුරුද්දක් පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරය අහිමි සුළු නඩුවලට පෙනී සිටි නීතිඥයකු පමණක් විය. දරුවන් තිදෙනෙකුට ඉගැන්වීමට හා ජීවත්වීමට



"සිරිලිය" සංවිධානය ව්‍යාපාරයක් කරගත් ශිරන්ති බහු ජාතික සමාගම්වලින් කප්පම් ලබාගත් අවස්ථාවක්.

සෑහෙන ආදායමක් නොතිබූ බැවින් ශිරන්ති පෙර පාසලක් පටන් ගෙන ආදායමක් ලබා ගත් අතර, මෙම පෙර පාසල ඇරඹීම සඳහා ලබා ගත් කාල්ටන් නිවස තංගල්ලේ සුප්‍රසිද්ධ ධනවත් පවුලක් වූ වික්‍රමසූරිය පවුලට අයත් නිවසකි. මෙම නිවස රාජපක්ෂ පවුල විසින් පසුව බලහත්කාරයෙන් අල්ලා ගත් බව පවුලේ ඉතාම කිට්ටු ඥාතිවරයකු විසින් දෙන ලද තොරතුරු අනුව පැහැදිලි වේ.

අද කාල්ටන් නිවස රාජපක්ෂ පවුල විසින් මාලිගාවක් බවට පත් කර ගෙන ඇත. ගෝඨාභය රාජපක්ෂ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ධූරයට පත්වීමෙන් පසුව එම අමාත්‍යාංශයේ මුදල් කෝටි ගණනක් කාල්ටන් නිවස අළුත්වැඩියාවට යොදවා ගෙන ඇත. තංගල්ලෙන් ඇරඹූ කාල්ටන් පෙර පාසල අද ලංකාව පුරා විහිදී යන පෙර පාසල් ජාලයක් බවට පත්ව ඇත. තංගල්ල, කොළඹ, වීරකැටිය, වලස්මුල්ල ආදී ප්‍රදේශවල කාල්ටන් පෙර පාසලේ ශාඛා පිහිටුවා ඇත.

## බන්දුල ගුණවර්ධන ශිරන්තිට සළකයි

අධ්‍යාපන අමාත්‍යාංශයට කොරියාවෙන් ලැබුණු පියානෝ 250ක් බන්දුල ගුණවර්ධන අධ්‍යාපන අමාත්‍යවරයා විසින් කාල්ටන් පෙර පාසල්වලට පරිත්‍යාග කල බවට පුවත්පත් වාර්තා පලවිය. එපමණක් නොවා රජයේ වටිනා ඉඩම් මහින්ද රාජපක්ෂ ගෝඨාභය රජයේ ඉඩම් කාල්ටන් පෙර පාසලට ලබා දී ඇත. ගල්කිස්ස කලාපූර පර්චස් 40ක ඉඩමක් නාගරික සංවර්ධන අධිකාරිය



හරහා කාල්ටන් පෙර පාසල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට ලබා දී තිබූ අතර, කලාපූරයේ පදිංචි කලාකරුවන්ගේ බලවත් විරෝධය නිසා ගොඩනැගිලි ඉදිකිරීම තාවකාලිකව අත්හිටුවා ඇත.

බොරැල්ල දුම්රිය නිවාස සංකීර්ණයට අයත් භූමි භාගයක්ද කාල්ටන් පෙර පාසල් ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් ලබා දී ඇත.

කාල්ටන් පෙර පාසල් හරහා ශිරන්ති රාජපක්ෂ විශාල ධන සම්භාරයක් උපයා ගැනීමට කදිම වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කලාය. කාල්ටන් පෙර පාසලේ ඉගෙන ගන්නා දරුවන් කොළඹ උසස් පාසල්වලට ඇතුලත් කිරීම හරහා ශිරන්ති කෝටි ගණන් මුදල් අයථා ලෙස උපයාගෙන ඇති බවට තොරතුරු අනාවරණය වෙමින් පවතී. දෙහිවල ප්‍රදේශයේ සුඛෝපභෝගී දෙමහල් නිවසක් ද ශිරන්ති රාජපක්ෂ විසින් ඉදි කර ඇති බව මෑතකදී FCID විසින් සොයා ගෙන ඇත.

## ශිරන්ති ගේ රත්‍රං ජාවාරම

උතුරේ යුද්ධය අවසන් වීමත් සමගම හමුදාව විසින් අල්ලා ගනු ලැබූ බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවල තැන්පත් කර තිබූ රත්‍රං කිලෝ දහස් ගණනක් හමුදාව විසින් රජයට භාර දෙන ලදී. නීත්‍යානුකූලව මෙම රත්‍රං මහ බැංකුව යටතේ තබා ගත යුතු නමුත් දූෂිත මහබැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මෙම රත්‍රං තොග මහින්ද රාජපක්ෂට භාර දී ඇත. මෙම රත්‍රං තොගයෙන්

කිලෝ 100ක් ජපානයේ ව්‍යාපාරිකයෙකුට විකුණා රුපියල් කෝටි 3000 ශිරන්ති ඇතුලු රාජපක්ෂ පවුල විසින් ලබා ගත් බව පුවත්පත් වල පළවිය. එම රත්‍රං තොගය අලෙවි කිරීමට අතරමැදියකු ලෙස ක්‍රියා කල පුද්ගලයකු මහින්ද රාජපක්ෂට යැවූ ලිපියක් පුවත්පත්වල පළවී තිබුණි.



විමල් - ශෂී හොර උප්පැන්න හා පාස්පෝට් නඩුවලට ගොස් ආපසු එමින්.



මිනීමරු නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධන

## ශිරන්තිට එරෙහිව DIG වාස් ගුණවර්ධන ගේ බිරිය පොලීසියට පැමිණිලි කරයි

ශිරන්ති රාජපක්ෂ ගේ තවත් රත්‍රං මගඩියක් සම්බන්ධයෙන් ෂියාම් ඝාතනයට වැරදිකරු වී පෝරකයට නියම වී ඇති හිටපු නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධනගේ බිරිඳ පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.එම පැමිණිල්ල්ට අනුව ශිරන්ති සහ හිටපු ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩක රෝයි ඩයස් ගේ බිරිඳ සමග කරන ලද රත්‍රං ජාවාරමක් පිළිබඳව පරීක්ෂණ කරන ලද්දේ වාස් ගුණවර්ධන විසිනි. මෙම හොර ජාවාරමට ශිරන්ති සම්පූර්ණයෙන්ම සම්බන්ධ නිසා මහින්ද රාජපක්ෂ වාස් ගුණවර්ධන කුරුණෑගල දිස්ත්‍රික්කය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස වහාම මාරු කළ බව වාස් ගේ බිරිඳ ගේ පැමිණිල්ලේ සඳහන් වේ.




මිනීමරු නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධනගේ බිරිඳ, ශිරන්ති රාජපක්ෂ ට එරෙහිව අල්ලස් කොමිසමට පැමිණිලි කිරීමට යමින්.

දැනට හෙළි වී ඇති රත්‍රං විකිණීමේ ජාවාරමට අමතරව ජනාධිපති සමග ගිය එතෙර සංචාර වලදී රාජ්‍ය ප්‍රභූ වරප්‍රසාද වලට මුවා වී තමන් සමග යන ගජ මිතුරියන් මාර්ගයෙන් ද මෙරටට රත්‍රං හොරෙන් ගෙනවිත් ඇති බව තතු දත් ආරංචි මගින් අනාවරණය වි ඇත. උතුරේ අහිංසක ජනතාවගේ රත්‍රං හොරකම් කොට විකුණා ඩොලර් කෝටි ගණන් විදේශ බැංකුවල තැන්පත් කර ඇති බවද කරුණු හෙළි වෙමින් පවතී. රාජපක්ෂ පවුලේ (මහින්ද, නාමල්, යෝෂිත, රෝහිත, ශිරන්ති) අය විසින් අයථා ලෙස උපයාගත් ඩොලර් බිලියන 18ක් ඩොලර් කෝටි 18000 (රුපියල් 18000000×140 ෂීසෙල්ස්, ඩුබායි, යුක්රේන්, හයිටි, ස්විස්ටර්ලන්තය) යන රටවල බැංකුවල තැන්පත් කර ඇති බව විදේශ ඇමති මංගල සමරවීර මහතා ඉතා වගකීමෙන් යුතුව ප්‍රකාශ කර ඇත. මෙම මුදල් මෙරටට ගෙන්වා ගැනීමට මහා බ්‍රිතාන්‍යය, ඉන්දියාව, ආදී රටවල විශේෂඥයන් ගේ ආධාරය ලබා දෙන බව එම රටවල් දැනටමත් ප්‍රකාශ කර ඇත.

## ජනාධිපති ආර්යා අංශය

මහින්ද රාජපක්ෂ ජනාධිපති වීමෙන් අනතුරුව ශිරන්ති ආර්යාව බවට පත් වූවා පමණක් නොව ජනාධිපති කාර්යාලය යටතේ ජනාධිපති ආර්ය අංශය නමින් වෙනම දෙපාර්තමේන්තුවක් පිහිටුවා ගෙන තිබූ බව එකල ලිපි ගොනු පරීක්‍ෂා කිරීමේ දී හෙළි වී ඇත.

මෙම ජනාධිපති ආර්යා අංශයට 60 දෙනෙකු ගෙන් යුත් ආරක්‍ෂක හමුදා බලකායක් බ්‍රිගේඩියර්වරයකු යටතේ පත්කර තිබුනි. මෙම ආරක්‍ෂක බලකායට සියලුම යාන වාහන ඉන්ධන, කාර්යාල, නිල නිවාස පරිපාලන කාර්ය මණ්ඩල ආදී සියල්ලම ජනාධිපති කාර්යාල වැය ශිර්ෂය යටතේ පාලනය විය. චාර්ටඩ් ගොඩනැගිල්ලේ වර්ග අඩි 3000 පමණ විශාල කාර්යාලයක අති නවීන උපකරණ හා අතිසුඛෝපභෝගි ගෘහ භාණ්ඩ (ඉතාලි) කාර්යාල උපකරණ සහ 20 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් ජනතා සේවය සඳහා නොව ශිරන්ති ආර්යාවගේ සහ නාමල් බබාගේ ආවතේවකම් කිරීමට යොදා ගෙන තිබුණි. රාජ්‍ය සම්පත් කිසිඳු හිරිකිතයක් නැතිව තමන් ගේ හා තම පවුලේ සාමාජිකයන් ගේ සුඛ විහරණය සඳහා පමණක් යොදා ගැනීම පිලිබඳව සාධාරණ පරීක්‍ෂණයක් පැවැත්වීම යහපාලනය අගය කරන ආණ්ඩුව විසින් ඉටු කල යුතු ඉතා වැදගත් හා ප්‍රමුඛ කාර්යයක් විය යුතුය.

ජනාධිපති කාර්යාලයේ වාර්තා අනුව මෙම ආර්ය අංශයට රාජපක්ෂ පවුලේ ළඟම ඥාතීන් වන නුගත් අමනයන් රැලක් පත් කර තිබුනි. ජනාධිපති කාර්යාල වාර්තාවලට අනුව ඔවුන් සඳහා මසකට රුපියල් 100,000සිට රුපියල් 200,000 පමණ මුදල් ගෙවා සුඛෝපභෝගි මෝටර් රථ, රියදුරන් සහ ඉන්ධන ලබා දී ඇත.

*මගේ දරුවෝ විතරයි දරුවෝ...*





*එමෙල්ඩා මාර්කෝස් II*

# ආර්යාවගේ භූමිකාව

-මහාචාර්ය සරත් විජේසූරිය

විධායක ජනපති පදවිය නිර්මාණය කළ බවට ජේ.ආර්. ජයවර්ධනට කවුරුත් කොපමණ විවේචන ඉදිරිපත් කළත් ඔහුගේ භාර්යාවට කිසිවෙකු දොසක් කියන්නේ නැත. අද කියෙන්නේත් නැත. ඊට හේතුව ඇය සිය සැමියාට මහජනයාගෙන් ලැබුණ බලය තමන්ට අවශ්‍ය අන්දමට පරිහරණය නොකිරීම බව කිව යුතු නැත. ඒ සැබැවින්ම එලීනා ජයවර්ධන මැතිනියගේ චරිතයේ ප්‍රශස්ත ගුණයකි. ඇය ධනවත් පවුලක ඉපදුණ පාරම්පරික කීර්තියක් උරුම කාන්තාවක බැවින් ඇයට ධනය හෝ කීර්තිය බලහත්කාරයෙන් පැහැර ගැනීමට අවශ්‍ය වූයේ නැත. එතුමිය සතු දේපළ දනට පිනට මෙන්ම මහජන යහපතට පරිත්‍යාග කිරීමෙන්ද විදහා දැක්වූයේ උසස් චරිතයක අගනා පුරුෂාර්ථයන්ය.

අවාසනාව වන්නේ ජේ.ආර්. ජයවර්ධනගේ අනුප්‍රාප්තිකයා වන ආර්. ප්‍රේමදාසට සිය නායකයාගේ ප්‍රතිපත්තියෙහි පිහිටා කටයුතු කිරීමට නොහැකිවීමයි. එහි වරද සම්පූර්ණයෙන්ම ප්‍රේමදාස ජනාධිපතිට පැවරීම අසාධාරණය. මන්ද ඔහුගේ භාර්යාව එලීනා ජයවර්ධන මැතිනියට වෙනස් පසුබිමක කෙනෙකු බැවිනි. නෙට්බෝල් ක්‍රීඩිකාවක වීම, ගායිකාවක වීම සහ අසුන් පැදීම යනාදී කටයුතු ඔස්සේ ඇය ස්වකීය ජීවිතයට තාරුණ්‍යය කැඳවා ගන්නට උත්සාහ කළාය. ප්‍රේමදාස මහජනයාගේ අප්‍රසාදයට ලක්වීමට එතුමාගේ භාර්යාවගේ ක්‍රියා කලාපය වඩාත් හේතු වූ බව සත්‍යයකි.

ඩී.බී. විජේතුංග තමන්ට සමීප කිසිවෙකුගේ බැබළීමට පදවිය හෝ එහි බලය ඉවහල් කර නොගත් අතර, ඒ බලයෙන් ඔහුගේ පවුලේ කිසිවෙකු බැබලෙන්නට උත්සුක වූයේ ද නැත. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ පාලන සමය තුළ ඇගේ දරු දෙදෙනාට විධායක බලය පරිහරණය කර නීති විද්‍යාලයට ඇතුළත් කර අධ්‍යාපනය ලබා දීමට කටයුතු කළේ ද නැත.

මහින්ද රාජපක්ෂ සිය බිරිඳට මෙන්ම දරු තිදෙනාට රාජ්‍ය බලය හිතු හිතු අන්දමට පරිහරණයට ඉඩ දුන්නේය. රාජ්‍ය ධනය හා රාජ්‍ය සම්පත් සහ දේපළ පරිහරණයට ඉඩ දුන්නේය. මේ රට පාලනය කළ කිසිවෙකු නොකළ අන්දමට රාජ්‍ය බලය ස්වකීය භුක්තියට සවි කර ගත්තේය. කැබිනට් අමාත්‍යවරුන්ට කළ නොහැකි දේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිගේ බිරිඳට සහ දරුවන්ට කළ හැකි වූ බව නොරහසකි.

මහින්ද විධායක ජනාධිපති පදවිය උසුලන විට, සම විධායක ජනාධිපති පදවියක් ඉසිලූ නාමල් රාජපක්ෂ අද පවසන්නේ තමන්ට සහ පියාට මොනවා කළත් අම්මාට සහ මල්ලිලාට නීතිය ක්‍රියාත්මක නොකරන ලෙසයි. නාමල් රාජපක්ෂ සිය මව දේශපාලනය නොකළ බව කියන්නේ අවසිහියෙන්ද?

දරුවෙකුට සිය මව ගැන හැඟීමක් තිබීම ස්වභාවිකය. නාමල් රාජපක්ෂට ඒ හැඟීම දස දහස් ගුණයකින් වැඩි අන්දමකින් තිබිය යුතුය. ඒ මන්ද? තමන්ට සහෝදරයන් දෙදෙනාටත් රටේ නීතිය කෙළෙසීමට රාජ්‍ය බලය අව භාවිතා කිරීමට රාජ්‍ය සම්පත් දේපළ භුක්ති විඳීමට "ආදර අම්මා" ඇස් කන් පියගෙන ඉඩ දී සිටියා පමනක් නොව සමහර කටයුතු වලට පිඹුරුපත් ද සකස් කළ බැවිනි.

යුද්ධය අවසන් වූ වහාම විශාල ධනස්කන්ධයක් වැය කරමින් සිදු කළ කටයුත්තකි. අයිෆා සම්මාන උළෙල එය පැවැත්වූයේ කාගේ උවමනාවටද? මේ නිරර්ථක ක්‍රියාව රජ දරුවන්ගේ අවල කෙළි පිණිස නොවන්නේද? තම දරුවන්ගේ මනදොළ සංසිඳවා ගැනීමට මේ කටයුතු වලට උඩගෙඩි දෙන අම්මා මොන ජාතියේ කෙනෙකු ද යන්න හිතා ගැනීමට නොහැකිය.

අගනුවර මාවත් වසා දමමින් මෝටර් රථ ධාවන තරඟ පැවැත්වීමට පියවර ගත්තේ කවුරුන්ද? ඒවාට වැය කළ ධනස්කන්දය තක්සේරු කිරීමට පවා නොහැකි බව අසන්නව ලැබෙන්නේය. රණවිරුවන්ට ඒවා සම්බන්ධයෙන් දරදිය අදින්නට සිදු වුණේ මහජනයාට අනේක විධ හිරිහැර කරමිනි. ඒවා මහින්ද වෙනුවෙන් නැගිටිමු. කියන හිටපු මැති ඇමතිවරුන් අනුමත කරනවාද?

දළදා මාළිගාව අබියස රේස් පැදීම අවශ්‍ය වුණේ කාට ද? ඉතිහාසයේ ප්‍රථම වරට දළදා මාළිග ාව අබියස නිරුවත් රැඟුම් නැටීමක් සිදු විය. මහනායක හිමිවරුන් ඊට අකමැත්ත පළ කලත් ඒ තිරශ්චීන කටයුත්ත සිදු විය. ඒ කාගේ බල මහිමයෙන් ද? මේ නිරර්ථක ක්‍රියාව රජ දරුවන්ගේ අවල කෙළි පිණිස නොවන්නේ ද?


*ශිරන්ති ජනාධිපති කොමිසමට නොගොස් තම මස්සිනා වන චමල් රාජපක්ෂගේ නිල නිවාසයට කටඋත්තර දීමට ගිය අවස්ථාව.*

තම දරුවන් ගේ මනදොළ සංසිඳුවා ගැනීමට මේ කටයුතුවලට උඩ ගොඩි දෙන අම්මා මොන ජාතියේ කෙනෙකු ද යන්න හිතා ගැනීමට නොහැකිය. ඇය බුද්ධිමත් කාන්තාවක් නම් ඇය බෞද්ධ කාන්තාවක් නොවන නිසාම දරුවන්ට අවවාදයක් දිය යුතුව තිබුණි. එබඳු විනයක් ඇයට තිබී නැත. කතෝලික පූජකවරයකු මේ ගැන කතා කරමින් පවසා සිටියේ මේ පහත් වැඩ ආගමික සංහිඳියාවට අනර්තකාරී බවයි. ඒ පූජකවරයා ඒ ක්‍රියා කලාපය විනිවිඳ දුටු බවය අපට හොඳින් වැටහුණේ.

සූරියවැව ක්‍රීඩාංගණය සුදු අලියෙකු බවය පවසන්නේ. ලංකාව නම් වූ කුඩා රටේ ටෙස්ට් තරඟ පැවැත්වීමට සුදුසු ක්‍රිකට් ක්‍රීඩාංගණ කීයක් තිබෙනවා ද? එසේ තිබිය දී මේ රටට ඔරොත්තු නොදෙන අන්දමට ණය වී ක්‍රීඩාංගණ ඉදි කළේ කුමට ද? ඒ රටේ දරුවන් ගේ යහපතටද? තම දරුවන්ට ක්‍රීඩා කිරීමට පාරවල් වසා දමා මහජනයාට හිරහැර පමුණුවා ජය පැන් බීමට

අවිනීත අන්දමට සමහර ක්‍රීඩාවන් භුක්තියට සවි කර ගැනීම ශීලාචාර ද? අසීමිත ලෙස රාජ්‍ය ආයතනවල සහ පෞද්ගලික ආයතනනවල ධනය ලබා ගෙන සංවිධානය කළ ක්‍රීඩා තරඟරජ දරුවන් ගේ විනෝදය පිණිසය. දරුවන්ට අභිමත අන්දමට පවත්වන ක්‍රීඩා තරඟ නැරඹීමට " ශිරන්ති මව" නොවරදවාම යැමෙන් ඇය ඒවා නොදැනුවත්ව අනුමත කළ බව විශද වන්නේය.

"තාරුණ්‍යයට හෙටක්" සහ "නිල් බලකාය" ගොඩ නැගුවේ නාමල් කුමරුන් උපයාගත් ධනයෙන් ද? රාජපක්ෂ පවුලට උරුම පාරම්පරික ධනයෙන් ද? මේ දේශපාලන ව්‍යාපෘති වලට අවශ්‍ය තරම් ධනය තිබුණි. යාන වාහන තිබුණි. ඉහළම මට්ටමින් කාර්යාල පහසුකම් තිබුණි. ඒවාට වැය කළේ රාජ්‍ය බලය ඉවහල් කරගෙන සාවද්‍ය සාපරාධී අන්දමට ලබා ගත් ධනයයි. මේ කටයුතු ගැන, ඒවායේ සිදුවන දේවල් ගැන ශිරන්ති මව නොදැන සිටියා නම් විශ්මයකි. රූපවාහිනී නාලිකාවක් සහ ගුවන් විදුලි නාලිකාවක් දරුවන්ට උරුම බව ශිරන්ති මව නොදන්නේ ද?



*මහින්දගේ දරුවන්ගේ නයිට් රේසිං*

නාමල් රාජපක්ෂ ඉහළින්ම විභාග සමත් කළ නීතිඥයෙකි. වැඩිම මනාප ලබා ගත් පාර්ලිමේන්තු මන්ත්‍රී වරයෙකි. මේ කටයුතු සිදුවුණේ ස්වාභාවික යුක්තියේ මූලධර්ම අනුව රටේ සියලු තරුණයන්ට පොදු සන්දර්භයක් තුළ ද? යෝෂිත රාජපක්ෂ නාවික හමුදාවේ නිලධාරියෙකු ලෙස විදේශීය පුහුණුවක් ලබා ගත්තේ ස්වාභාවික යුක්තියේ මූලධර්මවලට අනුව, රටේ සියලු තරුණයන්ට පොදු සන්දර්භයක් තුළ ද? මේ හැම කටයුත්තක් පිටුපසම ශිරන්ති මවගේ බලය නොතිබුණා යැයි සිහි මොළයක් ඇති කෙනෙකුට නම් කිව නොහැකිය.

මවක දරුවන්ගේ අනාගතය ගැන බලාපොරොත්තු ඇති කර ගැනීම ස්වාභාවිකය. එහෙත් රාජ්‍ය බලය හා රාජ්‍ය ධනය අවභාවිත කරමින් ගන්නා පියවර ශිෂ්ඨසම්පන්න නැත. තම සැමියා හැකිතාක් කල් විධායක ජනාධිපති පදවිය හොබවා කල් මැන පුත්‍රයාට ඒ පදවිය උරුම කර දීම ශිරන්ති මවගේ සිහිනය වූ බව පැහැදිලිය. ඒ නිසා ඇය එලීනා ජයවර්ධන මෙන් ජීවත්වීමට සූදානම් වූයේ නැත. ඇය අනාගත විධායක ජනාධිපති වෙනුවෙන් දේශපාලනයේ නිමග්න විය යුතුය යන අවබෝධයෙනි කටයුතු කළේ. බලය භාවිත කළේ.

කාල්ටන් පෙර පාසල සහ සිරිලිය සවිය වැඩ සටහන ආදිය රාජ්‍ය ධනයෙන් ශක්තිමත් කළේ අනාගත විධායක ජනාධිපතිට සේවය කිරීමට නොවේ ද? ලංකාවේ ඉහළම පාසල් වලට කාල්ටන් ඔස්සේ දරුවන් ඇතුලත් කිරීමට හැකිවන තත්වයක් නිර්මාණය කළේ දීර්ඝකාලීන සැලසුම් ඇතිව බව නොරහසකි. මේවා අහිංසක කටයුතු ලෙස අමතක කල හැකි ද?

මහින්ද රාජපක්ෂ සහ නාමල් රාජපක්ෂ පළිගැනීම් ගැන නිරතුරුව අද කටමැත දොඩවති. දේශපාලනයක් නොකළ පවුලේ සාමාජිකයන් ගෙන් පළිගන්නා බවට හිරිකිතයකින් තොරව දෙදෙනාම අනුකම්පාව ලැබීම පිණිස බොරු කියති. සැබැවින්ම අවුරුදු අටක් තිස්සේ රාජපක්ෂ පවුල මේ රටේ පුරවැසියන් කී දෙනෙකුගෙන් පළි ගෙන තිබේ ද? ඇතැමුන්ට රට තුළ ජීවත්වීමේ වරමක් අද නැත.

ශිරන්ති රාජපක්‍ෂ සිය සැමියා සතු බලය හොඳ හැටි පරිහරණය කළ බව රටට නොරහසකි. ඇය මූල්‍ය අපරාධ කොට්ඨාශයට කැඳවන්නේ බරපතල ගනුදෙනුවලට ඇය සම්බන්ධ නිසා බව හොඳින් අනාවරණය වීම ඔස්සේ සිදු විය හැකි දේ වළක්වා ගැනීමට දීර්ඝ කාලයක් තමන් සන්තකව තිබුණ බලය ඉවහල් කරගෙන අදාළ අංශවල කටයුතු වලට බලපෑම් කලත්, හෙළිව තිබෙන ඇතැම් දූෂණයන් සම්බන්ධ තතු නැත්තටම නැති කිරීමට නොහැකි වී තිබේ. ඇය කිසිඳු වරදක් කර නැතිනම් කිසිම දූෂණයකට සම්බන්ධ නැතිනම් නිර්භයව හැම පරීක්ෂණයකටම ඉදිරිපත් වී තම සැමියාට සහ සැමියාගේ ආණ්ඩුවට එල්ලවන චෝදනා නිෂ්ප්‍රභා කළ යුතු නොවන්නේ ද?



*CSN නාලිකා අධිපති යෝෂිත රාජපක්ෂට කලු සල්ලි, සුදු කරන හැටි උගන්වයි.*

එලීනා ජයවර්ධන මැතිණිය දේශපාලනයක නිමග්න නොවූ නිසා ඇයට මහ මග යන්නට ආරක්ෂක වළල්ලක් අවශ්‍ය වුණේ නැත. එතුමිය නිදහස් දිවි පෙවෙතක් ගත කළ නිසා ඇය මහජනතාවට කිසි අවස්ථාවක වරදකාරියක වුනේ නැත. එහෙත් පසුගිය කාලයේ අප අත් වින්දේ කුමක් ද? ශිරන්ති මැතිනිය මහමගට බහින්නට ලක ලෑස්ති වන විට පාරවල් වසා දමා රථවල් තර කිරීමය. ඇය දරුවන්ගේ ක්‍රීඩා තරඟ නැරඹීමට යන විටද, පාරවල් වසා දමා රථවල් තර කිරීම නිරතුරුව සිදු විය. ඇය රකින්නට විශාල ආරක්ෂක හමුදාවක් සිටි බව පැහැදිලි ය. ඒ අන් කිසිවකටත් නොව බලය විදහා දැක්වීමට නොවන්නේ ද? ඇගේ දිවි පෙවෙත තුළ විද්‍යාමාන වූ තවත් නොමනා ලක්ෂණයක් වන්නේ බලය පොදු ජනතාවට කරදකාරී වන අන්දමට අවිනීත ලෙස භුක්ති විඳීමයි. අදාල එක් නිදසුනක් පමණක් දක්වමි.

ලෝක ප්‍රකට යානි නම් වූ සංගීතඥයා ලංකාවට පැමිණි අවස්ථාවේ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය රසික ජනයාගෙන් පිරී ඉතිරී ගියේය. විශාල මිලක් ගෙවා ප්‍රවේශපත්‍ර ලබා ගත් රසිකයන්ට, නිල වශයෙන් ප්‍රසංගය ආරම්භ කල පසු පලමු අංශය දකිනන්ට ඔහේ බලා සිටින්නට සිදුවිය. ඊට හේතුව ආර්යාව පැමිණ අසුන් ගන්නා තෙක් ප්‍රසංගය පටන් නොගන්නා ලෙසට ඇගේ ආරක්ෂක සේනාව උපදෙස් දී තිබීමයි. එය අශිෂ්ඨය. ඊටත් වඩා වැඩියෙන් අශිෂ්ඨ ක්‍රියාව වන්නේ ඇය පැමිණ ටික වේලාවකට පසුව උස් තොප්පි පැළඳ ගත් වේටර්වරුන් පිරිසක් පැමිණ ඇයට සංග්‍රහ කිරීමට පටන් ගැනීමය. ප්‍රසංගයේ ආස්වාදය උපරිමයෙන් රසිකයන් විඳමින් සිටි අවස්ථාවේ රසිකයන්ට සිදුවුනේ ආර්යාවට සංග්‍රහ සත්කාර කරනු බලා සිටීමයි. ඒ වේලාව ඇය තේ පානය කරන වේලාව බවය අපට පසුව දැන ගන්නට ලැබුණේ. මවුන්ට් ලැවීනියා හෝටලයෙන් නියමිත වේලාවට තේ රැගෙන පැමිණ සංග්‍රහය නියම කර තිබෙන පරිදි වේලාවට සිදු කළේය. උත්ප්‍රාසය නම් තේ පානයෙන් පසුව ඇය ශාලාවෙන් පිටවී යෑමයි. ඇය පැමිණියේ කුමට ද? තේ පානය පිණිස ද? ඈ යානි දන්නේ නැත.

අනපේක්ෂිතව අසීමිත බලයක් ලැබුණ විට එය දරා ගන්නට නොහැකි කවරකු වුව කරන්නේ බල උමතුවෙන් සියල්ලන් පීඩාවට පත් කිරීමය. එවිට කිසිවකු නොපෙනේ. අවිද්‍යාවේ ගමන් කිරීමය සිදුවන්නේ. අවිද්‍යාව යනු නොදැනීමය. අවිද්‍යාවෙන් පෙලෙන කෙනෙකුට "බලය නම් නොමනා අවිය" පරිහරණයට අවසර ඇති විට දිස්වන්නේ උමතුවයි. කන්ද උඩ දේශණාවේ මේ ගැන රමණීය ඉගැන්වීමක් ඇත. එය මෙසේය.

"සිරුරට පහන ඇසය. එහෙයින් ඔබේ ඇස නීරෝගී නම්, ඔබේ මුළු සිරුර ආලෝකවත් වේ. ඔබේ ඇස රෝගී නම්, ඔබේ මුළු සිරුර ම අඳුරු වේ. ඔබ තුල ඇති ආලෝකය අඳුරු වී ගියහොත් එය කෙතරම් ඝන අන්ධකාරයක් ද?

අපේ රටේ දේශපාලනයේ නිමග්න පුද්ගලයන්ගේ ඉරණම, රාජයෝග ශා සම්බන්ධ ඉරණම, තීන්දු කරන්නේ බිරින්දෑවරුන් ගේ කේන්දරය බවට තිබෙන්නේ ප්‍රකට ප්‍රවාදයන්ය. ඉතා දූන උගත් පුද්ගලයන් පවා මේ මතයේ එල්බ සිටින බව සත්‍යයකි. දේශපාලනයේ නිමග්නව ඔහේ සිටි කෙනෙකු අතට රට පාලනයට බලය ලැබුණ විට, ඔහු මෙන්ම ඔහුගේ බිරිඳගේත් කේන්දරය පෙට්ටගමෙන් එළියට ගෙන දුම් අල්ලනු ඇත. මහින්ද රාජපක්ෂ අවිද්‍යාව නමැති අන්ධකාරයේ තදින් ගිළුණ පුද්ගලයකු බව රට වැසියන් නොව ලෝ වැසියන් ද දන්නා සත්‍යයකි. ඔහු ප්‍රඥාවන්ත නායකයකු වී නම්, ඔහුගේ බිරිඳ මෙන්ම දරුවන් ද රට වැසියන්ට පීඩා ගෙන දෙන අන්දමට උඩගු ජීවිත ගත කරන්නේ නැත. මහින්ද රාජපක්ෂ සතු ප්‍රධාන ලක්ෂණය කුමක්ද? නළු නිළියන් කලාකරුවන් ඔහුට මුසපත් වුණ ඒ ලක්ෂණය කුමක් ද? නිකොලායි මකියාවෙලී ගේ අදහසින් ඒ බව පැහැදිලි කිරීමට කැමැත්තෙමි.

"හය වැනි ඇලෙක්සන්ඩර් මිනිසුන් රවටන අන්දම ගැන විනා අන් කිසිවක් නොකළේය. ඒ සඳහා හැම විටම ඔහුට අවස්ථාවක් ද උදා වූයේය. ඔහු තරම් ප්‍රබල ප්‍රතිඥා දුන් වෙනත් මිනිහෙක් හෝ ඔහු තරම් වැඩි වැඩියෙන් පොරොන්දු ඇතිව නොයෙක් දේ වචනයෙන් තහවුරු කළ වෙනත් මිනිහෙක් හෝ කවදාවත් බිහි නොවුයේය. එසේම තමන්ගේ පොරොන්දු ඉතාම අඩුවෙන් ඉෂ්ඨ කළ වෙනත් මිනිහෙක් ද කවදාවත් ඇති නොවුයේය. එසේ වුව ද ලෝකයේ තත්ත්වය ඔහු ඉතා හොඳින් දූන සිටි හෙයින් ඔහුගේ කූටෝපක්‍රම හැම එකක්ම සම්පූර්ණයෙන්ම සාර්ථක විය.

*අනේ දෙවියනේ*



# 4
# ලක්ෂමන් නාමල් රාජපක්ෂ

රාජපක්ෂ පරපුර ගැන විමසා බලන විට පසුගිය දශකයක පමණ කාලයක් තුල මහින්ද රාජපක්ෂ තරමටම නාමල් රාජපක්ෂ ගැනද සමාජ කතිකාවතක් ඇතිවිය.

1986 අප්‍රියෙල් 10 වන දින උපත ලැබූ නාමල් කොළඹ ශාන්ත තෝමස් විදුහලෙන් අ.පො.ස. උ.පෙ. දක්වා අධ්‍යාපනය ලබා පසුව ලංකාවේ නීති විද්‍යාලයට ඇතුලු විය. ඔහුගේ නීති උපාධිය පිලිබඳව විවිධ චෝදනා එල්ල වී ඇත.

## නීතිඥ නාමල් රාජපක්ෂ

ලංකා නීති විද්‍යාලයේ අවසාන පරීක්ෂණය සඳහා ඉදිරිපත් වූ නාමල්ට වායු සමීකරණය කරන ලද කාමරයක්, ලැප්ටොප් පරිගණක, මොබයිල් දුරකථන ආදී සියලු පහසුකම් සැලසූ බවට චෝදනා එල්ල වී ඇත. එකල නීති විද්‍යාලයේ විදුහල්පති වරයා වු රුදිගු මහතා රාජපක්ෂ පවුලේ බත් බැලයකු විය. බුලත් හුරුල්ලක් දී නාමල් නිති විදුහලට පිළිගැනීමට පැමිණීමෙන් තහවුරු වන්නේ විදුහල්පති රුදිගු රාජපක්ෂවරුන්ට කොතරම් දීන අන්දමට සේවය කලාද යන්නයි. පසු කලෙක දී රුදිගු ජනාධිපති නීතිඥයකු ලෙස පත් කරන ලදී.



*හොර පෙරකදොරු නාමල් රාජපක්ෂ නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන් දා අගවිනිසුරු ශිරන්ති බණ්ඩාරනායක සමග ජී. එල්. පීරිස්. (ලෝකයේ පලමු වරට සිදු වී ඇති සිදුවීමක්.)*



*විදේශ කටයුතු ලේකම් ක්ෂෙනුකා සෙනෙවිරත්න (දැනට තායිලන්ත තානාපති) නාමල් සමඟ; විනෝද සාගරයක ගිලුනු මොහොතක්*



*ශ්‍රී ලංකන් එයාර් ලයින් සභාපති නිශාන්ත වික්‍රසිංහ හා ලලිත් වීරතුංග ලේකම්ගෙන් නාමල්ට ලැබුණු සහයිකාව වානගුරු සමග ගෙවුනු සොදුරු මොහොත.*



*රාජපක්ෂ වනචර දශකයේ අන්ත දූෂිතයෙකු වූ අජිත් නිවාඩ් කබ්රාල් විදේශ සංචාරයකට ගොස් කොච්චි සෙල්ලමේ යෙදුනු අවස්ථාවක්.*

## තුෂාර ජයරත්න හා නාමල්

නාමල් සමග නීති අවසාන විභාගයට පෙනී සිටි තුෂාර ජයරත්න නම් නිර්භීත සිසුවා නීති විභාගයේ දී නාමල්ට විශේෂ සැලකිල්ල දක්වීම ගැන නීති විදුහල්පතිට එරෙහිව පොලීසියට, අධිකරණ සේවා කොමිෂන් සභාවට, අගවිනිසුරු වරයාට හා මානව හිමිකම් කොමිසමට පැමිණිලි කලද නීතිපති දෙපාර්තමේන්තුව මහින්ද යටතේ තිබූ නිසා එම ආයතනවල එකදු වගකිවයුත්තකු තුෂාර ගේ පැමිණිලිවලට සාධාරණය ඉටු නොකළේය. නාමල්ට විරුද්ධව පැමිණිලි කිරීම නිසා ජයරත්න සිසුවාට එල්ල වූ මරණ තර්ජන හමුවේ නීති අවසාන පරීක්ෂණයටද පෙනි නොසිට ජීවිත ආරක්‍ෂාව පතා රටින් පිටවී යාමට සිදුවිය.



*හොර පෙරකදොරු නාමල් රාජපක්ෂ නිසා නීතිඥයකු වීමට අවස්ථාව නොලද තුෂාර ජයරත්නට තම මවුබිම හැරදා ජීවිත ආරක්ෂාවට පිටරට යාමට සිදුවිය.*

තාරුණ්‍යයට හෙටක් ගැන මත දොඩවන නාමල් ඉතාමත් දූෂිත ලෙස නීති අවසාන විභාගයට පෙනී නොසිට සමත් වුවද, අද ඔහු අමතන්නේ හොර පෙරකදෝරු යන අන්වර්ථ නාමයෙනි. නාමල් ගේ පියා වන මහින්ද රාජපක්‍ෂ ද ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායකට පින් සිදුවන්නට නීති විද්‍යාලයට ඇතුල්වීමට වරම් ලැබුවද නාමල් මෙන්ම අනුන් ලියූ උත්තර පත්‍ර ඉදිරිපත් කොට නීති විභාගය සමත් වූ හොර පෙරකදෝරුවෙකි.

## නිල් බලකාය හා නාමල්



*මහජන මුදල් බිලියන ගණනින් හොරකම් කර නීතිඥ සමාගම්, නිවාස, ඉඩම් මිලට ගැනීමේ පාපයට වන්දි ගෙවීම. (GOWER & Co.)*

නාමල් රාජපක්‍ෂට එරෙහිව ඇති ප්‍රධානම චෝදනාව වන්නේ නිල් බලකාය නමින් සංවිධානයක් පිහිටුවා ගෙන එමගින් තම පියාගේ හා තමාගේ දේශපාලන ප්‍රතිරූපය වර්ධනය කර ගැනිමට රාජ්‍ය දේපල අසීමිත ලෙස භාවිතා කිරීමයි. ලංකාවෙ සියලුම මැතිවරණ කොට්ඨාශ ආවරණය වන පරිදි නිල් බලකාය ශාඛා පිහිටුවා එමගින් විශාල තරුණ තරුණියන් රාශියක් මහින්ද ගේ දේශපාලන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා යොදවා ඇති බව සිදු කෙරෙන පරීක්‍ෂණ වලින් තහවුරු වී ඇත. ශ්‍රී.ල.නි.ප තරුණ සංවිධානයට බාහිරව පිහිටුවා ගත් නිල් බලකායේ සභාපති වුයේ නාමල් රාජපක්‍ෂයි. එදා තමන්ට හිතු මනාපයට නිළධාරීන් පත් කර ගෙන රජයේ අරමුදල් හා වාහන කාර්යාල

ආදී සියල්ලම නිල් බලකායේ ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්නා ලදි. මෙම නිල්බලකායට අරමුදල් සපයා දී ඇත්තේ රාජ්‍ය බැංකු, රජයේ සංස්ථා සහ නාමල් ගෙන් විශේෂ වරප්‍රසාද ලබා ගත් පෞද්ගලික ව්‍යාපාර වලිනි. විනිමය කොමිෂන් සභාවේ සභාපති ගොඩගේ රිමාන්ඩ් භාරයට පත්වූයේ නාමල් රාජපක්ෂගේ නිල් බලකායට රුපියල් ලක්ෂ 50 නිසි අවසරයකින් තොරව ලබාදීම නිසාය. ගොඩගේට අමතරව එහි ප්‍රධාන නිළධාරීන් දේපලද අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් භාරයට පත්විය.

## නිල් බලකාය තරුණියන්ට කරන ලද අපරාධ

රජයේ සියලුම රැකියා ලබාදීමේ දී නාමල් රාජපක්ෂ ගෙන් නිර්දේශ ලිපියක් අනිවාර්ය කර තිබුණි. රජයේ හෝ සංස්ථාවක රැකියාවක් බලපොරොත්තු වන තරුණ / තරුණියන් නාමල් ගේ කාර්යාල වල දහස් ගණනක් රොක් වී සිටීම සුලභ දසුනකි. නාමල් රාජපක්ෂ සහ ඔහුගේ ගජමිතුරන් අහිංසක තරුණියන් රාශියක් ලිංගික අපයෝජනයට ලක්කොට ඉන් අනතුරුවඔවුනට රැකියා ලබා දී ඇති බව ඔප්පු වී ඇත. නාමල් නිසා සමහර තරුණියන් රැකියාවට යාමට පෙර අම්මලා වී ඇති බවටද තොරතුරු ලැබී ඇත. අසරණ තරුණියන් සිය ශරීරය නාමල්ට පුදා රැකියාවක් ලබා ගැනීමට සිදුවීම කෙතරම් අවාසනාවන්ත සිදුවීමක් ද? ශිරන්ති රාජපක්ෂ අම්මා මේවා නොදැන සිටියි ද? මහින්ද රාජපක්ෂ තරුණියන් අනාථ කිරීමට කප් ගසා සිටින වනචරයකු බැවින් පුතාට තම අත් දැකීම් උපයෝගී කරගෙන උපදෙස් දෙන්නට ඇත.

## රති ක්‍රීඩාවට බස්



*රුපියල් කෝටි 30කට වඩා මහජන මුදල් වැයකර රජපක්ෂ නාම්බන්ට රතී කෙලියේ යෙදීමට මහින්ද රජපක්ෂ තාත්තා තෑගි කළ සුබෝපභෝගී බස් රථ.*

පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායකයින්ගේ පරිහරණය සඳහා යයි පෙන්වා ජර්මනියෙන් ගෙන්වා ගෙන ඇති සියලු පුබෝපභෝගී පහසුකම් වලින් යුත් (නිදන කාමර, විසිත්ත කාමර, නාන කාමර, වායු සමීකරණ) බස් රථ තුනක් නාමල්, ශෂීන්‍ද්‍ර ආදී තමන්ගේ නෑදෑ පරපුරේ රති ක්‍රීඩා සඳහා යොදා ගත් බව අද අනාවරණය වී ඇත. රුපියල් කෝටි 30ට වඩා රජයේ මුදල් වැය කොට ගෙන්වන ලද බස් රථ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ගාල් කර ඇත.

## රාජපක්ෂ සොහොන

ඩී.ඒ. රාජපක්ෂ සොහොනට රජයේ මුදල් කෝටි 69ක් වැය කිරීම සම්බන්ධයෙන් සිය බාප්පා වන ගෝඨාභය සමග නාමල් රාජපක්ෂ සම්බන්ධ වී ඇති බව නාමල් ගේ මහප්පා වන චමල් රාජපක්ෂ ප්‍රවෘත්ති සාකච්ඡාවකදී කරුණු දක්වා ඇත. ඩී.ඒ. රාජපක්ෂ ගේ සොහොනට රජයේමුදල් වැය කළේ තාත්තා, පුතාලා, බාප්පලා මිස තමන් නොවේ යැයි චමල් රාජපක්ෂ පැවසූ බව පුවත්පත් වල වාර්තා විය.

## කාර් රේස් සහ නාමල් (Night Racing)

ලංකාවේ ප්‍රථම වරට රාත්‍රී මෝටර් රථ තරඟයක් පවත්වනු ලැබුවේ රාජපක්ෂ රෙජිමය විසිනි. මෙම තරඟ මාලාව සංවිධානය කිරීම නාමල් හා යෝෂිත ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුනි. ශ්‍රී

ලංකා රක්ෂණ සංස්ථාව, විදුලිබල මණ්ඩලය, ජාතික ලොතරැයි මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, රජයේ බැංකු සහ පෞද්ගලික අංශයේ රාජපක්ෂ රෙජිමයේ ආධාර කරුවන්ගෙන් විශාල මුදල් සම්භාරයක් නාමල් ප්‍රමුඛ රාජපක්ෂවරු රැස් කර ගත්හ.


*මේ කවුද - ජනතාවට කුසගිනි උරුමකර ලැම්බෝගිනි පැද්ද නාමල්.*

මෙම රාත්‍රී මෝටර් රථ ධාවන තරඟය කොළඹ සහ මහනුවර අවස්ථා කිහිපයකින් සමන්විත තරඟය සඳහා අවශ්‍ය සියලුම සේවාවන් යුද හා නාවික හමුදාව ලවා ඉටු කරවා ගන්නා ලදි. කොළඹ නගරයේ කොටුව හා ගාලු මුවදොර මංතීරය දින ගණන් වසා දමා හමුදා භටයින් ලවා වැලි කොට්ට දහස් ගණනක් තැන්පත් කර කොළඹ නගර සභාවෙන් නොමිළයේ විදුලි ආලෝකය ලබා ගෙන මෙම තරඟය සංවිධානය කරනු ලැබුවේ හුදෙක්ම නාමල් ගේ යෝෂිතගේ ආශාවන් ඉටු කර දීමටය.

මහනුවර ශ්‍රී දළදා මාළිගාව අභියස මෙම මෝටර් රථ ධාවන තරඟය නොපවත්වන ලෙසට අතිපූජ්‍ය මල්වත්තේ හා අස්ගිරියේ නාහිමිවරුන් ප්‍රමුඛ ත්‍රෛනිකායික මහා සංඝරත්නය ඉල්ලීමක් කල නමුදු මහින්ද රාජපක්ෂ එය තුට්ටුවකටවත් මායිම් කලේ නැත. අස්ගිරිය මහානාහිමියන්ට දුරකථනයෙන් පණිවුඩයක් දෙමින් මහින්ද රාජපක්ෂ පවසා ඇත්තේ "මේක පුංචි පුතාගේ ආශාවක් ඒ නිසා මේකට විරුද්ධ වෙන්න එපා" යනුවෙනි.

## නාමල් විශ්ව විද්‍යාලයට සිසුවියක් ඇතුළු කිරීම

රුහුණු විශ්ව විද්‍යාලයට ශිෂ්‍යාවක් ඇතුලු කර ගන්නා ලෙසට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපතිනිය හිරිඹුරේගම මහත්මියට නියෝග කිරීමට තරම් නාමල් රාජපක්ෂ එකල බලවත් වූ බව පෙනේ.උසස් අධ්‍යාපන ඇමති එස්.බී. දිසානායකට හා හිරිඹුරේගමට සුදුසුකම් නොලැබූ සිසුවියක් රුහුණු සරසවියට ඇතුලත් කර ගන්නා ලෙසට නාමල් රාජපක්ෂ ලිඛිතව නියෝගයක් දී තිබුණි.


*මිනීමරු රාපක්ෂ පවුල විසින් මරාදැමූ තාජුදීන්*

## තාජුදීන් ඝාතනය හා නාමල් රාජපක්ෂ

අද රාජපක්ෂ පවුල මරබියෙන් පසුවන්නේ තාජුදීන් ගේ ඝාතනය සම්බන්ධයෙන් යෝෂිත, නාමල්, සහ ශිරන්ති ප්‍රමුඛ ආරක්ෂක නිළධාරීන් කිහිප දෙනෙකු සැකකරුවන් ලෙස හඳුනාගෙන තිබීම නිසාය. පාර්ලිමේන්තුවේ දී මහින්ද, රනිල් හමුවීම ඉහත කරුණට සම්බන්ධ බව පුවත්පත් වාර්තා පල විය. එම හමුවේ රහස කුමක් වුවද ලැබී ඇති සී.සී.ටී.වී. දර්ශන අනුව තාජුදීන් පැහැරගෙන ගොස් මරා මෝටර් රථයට දමා ගිනි තැබීම සම්බන්ධයෙන් යෝෂිත හා නාමල් ගේ ඍජු සම්බන්ධතාවයක් ඇති බව රහස් පරීක්ෂකවරුන්ගේ වාර්තා වලින් හෙලිවෙමින් පවති.

## නාමල් සහ විදේශ බැංකු ගිනුම

ඩුබායි බැංකුවක ඩොලර් මිලියන 1500ක් නාමල් විසින් තැන්පත් කර ඇති බව අද ප්‍රසිද්ධ රහසකි. මංගල සමරවීර ඇමතිවරයාට අනුව රාජපක්ෂවරුන් අයථා ලෙස උපයා පිටරට බැංකුවල

තැන්පත් කල මුදල ඇමරිකානු ඩොලර් බිලියන 18කි. මහින්ද තාත්තා මෙන්ම නාමල් පුතාත් තරඟයට දූෂිත ලෙස මුදල් උපයා ඇති බව අද ඔප්පු වෙමින් පවතී.

ජනාධිපතිවරණයට පසු දින නාමල් ගේ සොයුරු යෝෂිත ඩුබායි රාජ්‍යයට ගොස් එම බැංකුවේ තිබූ තැන්පත් වලින් ඩොලර් මිලියන 500ක් යුක්රේනයේ බැංකුවකට මාරු කල බවට ප්‍රවෘත්ති පලවිය. යුක්රේනයේ සිටින රුසියාවේ තානාපතිව සිටි උදයංග වීරතුංග නාමල් ගේ මාමා කෙනෙකි. ඔහුගේ මාර්ගයෙන් යෝෂිත යුක්රේනයට යවා ඩුබායි රහස් ගනුදෙනුව සිදු කරන්නට ඇති බව රහස් පරීක්ෂණ හි අදහසයි. සිය සීයාවන ඩී.ඒ. රාජපක්ෂ මිය යන විට ඔහුගේ වත්කම ශත28කි. මැදමූලන නිවසද උකසට සින්නවීමට ආසන්න වෙද්දි සෑම් විජේසිංහ බේරා දුන් බව රාජපක්ෂ චරිතාපදාන කතා වල සඳහන් වේ. අද ශ්‍රී ලංකාවේ ජාතික ආදායමටත් වඩා වැඩි මුදලක් විදේශ බැංකුවල තැන්පත් කිරීමට රාජපක්ෂවරුන් සමත් වි ඇත.


*යෝෂිත, යසාරා, CSN අධ්‍යක්ෂවරු සහ කාර්ය මණ්ඩලය සමඟ.*

## නාමල් සහ CSN නාලිකාව

ලංකාවේ ක්‍රීඩා නාලිකාවක් ලෙස ලියා පදිංචි කර ඇති CSN රූපවාහිනී නාලිකාව මහින්ද රාජපක්ෂ ගේ ආනුභාවයෙන් රුපියල් බිලියන ගණනක් ලාභ වශයෙන් උපයා ගෙන ඇත. ලංකාවේ ක්‍රිකට් තරඟ හා ක්‍රීඩා විකාශණය කිරීමේ පරම අයිතිය තිබුනේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවටය. මෙම ජනතා අයිතිය ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවෙන් ඉවත් කොට පුතාගේ සී.එස්.එන්. නාලිකාව ප්‍රකාශණ මාධ්‍ය ලෙස තෝරා ගැනීමට මහින්ද තාත්තා ත්‍යාගශීලි වී ඇත.

ක්‍රිකට් ක්‍රීඩා විකාශණයෙන් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට ඉහළ ආදායමක් ලැබුණු අතර, එම ආදායම රාජ්‍ය භාණ්ඩාගාරයට ලැබුණි. තමන්ගේ පරපුරට ජාතික ධනය කොල්ල කෑමට ඉඩදීම සම්බන්ධයෙන් මෙරට ජනතාව නිවැරදි තීන්දුවක් දී 2015 ජනවාරි 08 මහින්ද ප්‍රමුඛ හොර නඩය බලයෙන් පන්නා දැමූ නමුත්, එම හොර නඩය නිසා ජාතික ධනය, කෝටි ගණනක් කොල්ල කෑමටඅවස්ථාව ලද මහින්ද ගේ වහලුන් සහ සෑම පැලැන්තියක්ම අද දක්වාම යෙහෙන් වැජඹීම මෙරට මුළු මහත් මහින්ද විරෝධි ජනතාවට කරන ලද අපරාධයකි.

## නාමල්ගේ කෝටි 60 ඔරලෝසු පැළඳි අවස්ථා







BRAND
AUDEMARS PIGUET
ROYAL OAK OFFSHORE
URL
PRICE
$33,804.25
LKR: 4,597,378


BRAND
AUDEMARS PIGUET
URL
PRICE
$40,700.00
LKR: 5,535,200


BRAND
HUBLOT
AERO BLACK MAGIC BLACK CERAMIC
URL
PRICE
$26,300.00
LKR: 3,576,800


BRAND
PANERAI
URL
PRICE
$44,000.00
LKR: 5,984,000


BRAND
AUDEMARS PIGUET
URL
PRICE
$40,500.00
LKR: 5,508,000


BRAND
PATEK PHILIPPE
GRAND COMPLICATION
URL
PRICE
$91,000.00
LKR: 12,376,000


BRAND
ROLEX
DAY-DATE MOTHER OF PEARL DIAL
URL
PRICE
$65,400.00
LKR: 8,894,400


BRAND
HUBLOT
BIG BANG EVOLUTION GOLD
URL
HTTP://WWW.JOMASHOP.COM/
PRICE
$36,100.80
LKR: 4,909,708


කෝටි ගනන් වටිනා අතු ඔරලෝසු පැලඳි නාමල්ට කළකම් පල දීම...

# 5

# යෝෂිත කණිෂ්ක රාජපක්ෂ

1988 දී උපත ලද යෝෂිත ගල්කිස්ස ශාන්ත තෝමස් විදුහලෙන් අධ්‍යාපනය ලැබූ අතර, කලා විෂයධාරාවෙන් අ.පො.ස.සා.පෙ. පමණක් සමත් වූවෙකි. එක්වර විෂයන් 6ක් (ගණිතය භාෂාව ඇතුළුව) අසමත්වීම නිසා අ.පො.ස.(උ.පෙ) හැදෑරීමට නොහැකි විය.



*හොඳ ලුතිනන් යෝෂිත පුතාට මහින්ද තාත්තාගෙන් කඩු කස්තාන, වියදම ජනතාවගෙන්*

යෝෂිත නාවික හමුදාවට බැඳීමට ආශාවක් දක්වුවද ඔහුට විධායක ශ්‍රේණියේ නැවියෙකු වීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් නොතිබූ නිසා යෝෂිතට ඉල්ලුම් කිරීමට හැකිවන ලෙෂ ඔහුගේ අධ්‍යාපන සුදුසුකම්වලට අනුව බඳවා ගැනීමේ පටිපාටිය වෙනස් කරනු ලැබීය. නාවික හමුදා ඉතිහාසයේ විධායක ශ්‍රේණියේ නාවිකයකු සඳහා අ.පො.ස.(උ.පෙ.) රසායන විද්‍යාව හා ගණිතය අනිවාර්යයෙන් සමත්විය යුතුය. මූලික සුදුසුකම් නොමැතිව නාවික හමුදාවට බඳවා ගත් යෝෂිත ත්‍රිකුණාමලයේ නාවික හමුදා කඳවුරේ පුහුණුව ලැබුවේ දින 20කි.



*රුසියාවේ හිටපු තනාපති මහින්දගේ ඥාති සහෝදර උදයංග වීරතුංග සමඟ*

එංගලන්තයේ නාවික පාඨමාලාවක් හැදෑරීම සඳහා රජයේ මුදල් මිලියන 30කට වඩා වියදම් කොට ඔහුට වඩා සුදුසුකම් ලත් නාවිකයන් සිටියදී මහින්දගේ බලයෙන් යෝෂිත එම නාවික පාඨමාලාවට ඇතුල් කරන ලදි. මෙම අසාධාරණ නීති විරෝධී බඳවා ගැනීම පිළිබඳව එවකට නාවික හමුදාපති වගකිව යුතුය. එංගලන්තයේ නාවික හමුදා පාඨමාලාව හැදෑරීමෙන් පසුව යුක්රේනයේ නාවික හමුදා පුහුණුවකට මොහු තෝරා ගනු ලැබුවේ අපූරු අන්දමකටය. එවකට රුසියාවේ ලංකා තානාපතිවරයාව සිටි උදයංග වීරතුංග යෝෂිතගේ කෙනෙකි. ඔහු ආරක්ෂක



*හොර ලුතිනන් යෝෂිතට ශිරන්තිගෙන් මිනී මැරීමට උපදෙස්.*

අමාත්‍යාංශයේ ලේකම් යෝෂිත ගේ බාප්පා වන ගෝඨාභයට යුක්රේනයේ නාවික හමුදා පුහුණුවකට යෝෂිත නම් කරන ලෙසට ලිපියකින් දන්වන අතර ගෝඨාභය බාප්පා යෝෂිත පුතාට රජයේ මුදල් මිලියන වැය කොට යුක්රේනයේ නාවික හමුදා පුහුණුවට යැවීය. උදයංග වීරතුංග නමැති අන්ත දූෂිතයා සිය තානාපති වරප්‍රසාද උපයෝගී කරගෙන යෝෂිත රාජපක්ෂට මෙම පුහුණුව ලබා දීමට අවශ්‍ය සියලු කටයුතු සම්පාදනය කර ඇති බව විමර්ෂන වලදී හෙලි වී ඇත.

නාවික හමුදාවේ කණිෂ්ඨ නිලධාරියෙකු වූ යෝෂිතට ආරක්ෂක භටයන් ලෙස ලබා දී ඇත්තේ ඔහුට වඩා ඉහළ තනතුරු දරූ නිළධාරීන්වීම මෙහි හාස්‍යජනකම සිදුවීමයි.

උතුරේ යුද්ධයට සිය පුතා පරිත්‍යාග කල එකම රාජ්‍ය නායකයා මහින්ද රාජපක්ෂ බව මහින්දගේ ඇමතියන් හා අනෙකුත් වන්දිභට්ටයින් මාධ්‍ය මගින් විශාල ප්‍රචාරයක් ගෙන යාම ද විශේෂ කරුණකි.

මහජනතාව ගේ මුදල් කෝටි ගණන් සිය පුත්‍රයාගේ අනාගතය සඳහා වැය කරමින් එය තමාගේ දේශපාලන ප්‍රතිරූපය නංවා ගැනීමට ද උපයෝගී කර ගැනීමට තරම් මහින්ද රාජපක්ෂ නිර්ලැජ්ජා වූවා පමණක් නොව ජනතාවට එම ක්‍රියාව සාධාරණීකරණය කිරිමටද හැකිවිය. අපේ රටේ අහිංසක, මෝඩ දිළිඳු ජනතාව අනේ අපේ ජනාධිපතිතුමා - පුතා රට වෙනුවෙන් දන් දුන්නා කියමින් මහින්දගේ කපටි ක්‍රියාව අනුමත කිරීමට තරම් අඳ බාලවීම රටේ අවාසනාවකි.

උතුරේ යුද්ධය පැවති කාල සීමාව තුලදී එක් දිනක්වත් ලංකාවේ නාවික හමුදාව සමග සටන් පෙරමුණට නොගිය යෝෂිත පිටරට හමුදා පුහුණුවකින් පසුව ආචාර්ය උපාධියකට ඉදිරිපත් වූ බවටද වාර්තා පලවිය. කිසිඳු මූලික සුදුසුකමක් නොමැතිව පියාගේ දේශපාලන බලය උඩ නාවික හමුදාවේ විධායක නිලයක් ලබා ගත් යෝෂිත පසුව පියාගේ ආරක්ෂක සේනාවට බැඳුනු බව සඳහන්වේ.

නාවික හමුදාවට බඳවා ගැනීමේ සිට සියලුම පුහුණුවීම් නීති විරෝධීව ලබා ගත් ඒවා බව දැන් අනාවරණය වී ඇත. ලංකාවේ නාවික හමුදා ඉතිහාසයේ මෙබඳු අවිධිමත් නීති විරෝධි පත්වීමක් සිදු කෙරුණ ප්‍රථම අවස්ථාව මෙයයි. ශ්‍රී ලංකා නාවික හමුදාවේ ගෞරවය ආරක්ෂා කිරීම සඳහා යෝෂිතගේ පත්විම පිළිබඳව පූර්ණ පරීක්ෂණයක් කොට මේ සඳහා උදව් කල සියලුම උසස් නිළධාරීන්ට එරෙහිව විනයානුකූලව දඬුවම් කල යුතුය.

## තාජුදීන් ඝාතනය සහ යෝෂිත

ශ්‍රී ලංකා රගර් කණ්ඩායමේ දීප්තිමත් දක්ෂ ක්‍රීඩකයකු වූ තාජුදීන් යෝෂිත හා නාමල්ට අභියෝග යක් එල්ල කල දක්ෂ ක්‍රීඩකයෙකි. ශ්‍රී ලංකා රගර් කණ්ඩායමේ නායකත්වය මහින්ද රාජපක්ෂගේ බලපෑමෙන් නාමල් හා යෝෂිතට ලැබුනද, තාජුදීන් නාමල් හා යෝෂිත තුට්ටුවකටවත් මායිම් කල පුද්ගලයකු නොවේ. මේ නිසා නාමල් සහ යෝෂිත තාජුදීන් කෙරේ දැඩි ඊර්ෂායවකින් සහ වෛරයකින් පසුවිය. තත්වය මෙසේ තිබියදී තාජුදීන්ගේ පෙම්වතිය වූ යසාරා අබේනායක

තාජුදීන් අත්හැර යෝෂිත ගේ පෙම්වතිය බවට පත්විය. යෝෂිත තාජුදීන් සමග වෛර බැඳ ගන්නට හේතු වූයේය සාරාගේ උපත් ලපයක් ගැන එක්තරා සමාජ ශාලාවකදී යෝෂිත හා තාජුදීන් අතර ඇතිවූ උණුසුම් වචන හුවමාරුවක් නිසාය. තාජුදීන් නිසා යසාරා ගැබ් ගත් බවත්, එබැවින් යසාරා විවාහ කර ගැනීමට තාජුදීන් කැමැත්ත පල කල නමුදු යසාරා ගේ පියා තාජුදින් - මුස්ලිම් ජාතිකයකු බැවින් එම විවාහයට විරෝධය දක්වූ බවත් පුවත්පත් වාර්තා පලවිය. සිනමා සක්විති ගාමිණී ෆොන්සේකාගේ මිනිබිරිය වූ යසාරා යෝෂිත සමග ඇති කරගත් පෙම් සබඳතාවයට පියා වන ආනන්ද අබේනායක ද පූර්ණ අනුග්‍රහය දක්විය.



ඌයියා! ඒත් කැමතියි. යෝෂිත යසාරා හපාකයි.

යසාරා පිළිබඳව සමාජ ශාලාවේදී යෝෂිත හා තාජුදීන් අතර ඇතිවූ බහින්බස් වීමෙන් පසුව 2012 මැයි 12 දින තාජුදීන්ගේ ඝාතනය සිදුවිය. එවක කොළඹ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිව සිටි අනුර සේනානායක හා ප්‍රධාන අධිකරණ වෛද්‍යවරයා වූ ආනන්ද සමරසේකර යන රාජපක්ෂ ඇම්බැට්ටයන් ලවා මාධ්‍ය මගින් විශාල ප්‍රචාරයක් ලබා දෙමින් මෙම සාහසික අපරාධය මෝටර් රථ අනතුරක් බව පොලීසිය ලවා අධිකරණයට කරුණු වාර්තා කරනු ලැබීය.



CSN දූෂණයට වන්දි ගෙවමින් වැලිකඩ හිරගෙදරට.

2015 ජනවාරි 08 රජය බලයට පත්වීමෙන් පසුව තාජුදීන්ගේ අභිරහස් මරණය පිළිබඳව නැවත පරීක්ෂණයක් ආරම්භ කල අතර, එය මිනීමැරුමක් බව දැනට සොයා ගෙන ඇති සාක්ෂි අනුව ඔප්පු වී ඇත. රාජපක්ෂ රෙජිමය යටතේ පොලීසිය සහ අධිකරණය රාජපක්ෂකරණය වී තිබීම නිසා තාජුදීන්ගේ මරණය සම්බන්ධව අපක්ෂපාතී පරීක්ෂණයක් කිරීමට නොහැකිවිය. ලැබී ඇති තොරතුරු අනුව යෝෂිත හා නාමල් තාජුදීන්ගේ ඝාතනයේ ප්‍රධාන සැක කරුවන් ලෙස හඳුනගෙන ඇත. තාජුදීන් හැව්ලොක් සමාජශාලාවේ සිට සිය මෝටර් රථයෙන් නිවස බලා යන අතරමගදී ශිරන්ති රාජපක්ෂගේ සිරිලිය සංවිධානයට අයත් ඩිෆෙන්ඩර් රථයකින් පැමිණි පිරිසක් තාජුදීන් පැහැරගෙන ඔහුට දස වධ දී මරා ඔහුගේ මෝටර් රථයට දමා ගිනි තබා ඇති බව ලැබී ඇති තොරතුරු අනුව සනාථ වී ඇත.

අවුරුදු 23 ක් වූ තාජුදීන් මරා දමන විට එක් දරු පියෙකි. අහස පොළොව නුහුලන මෙවන් අපරාධ කිරීමට තම පුතුන් මෙහෙය වූ මහින්ද රාජපක්ෂට සහ ශිරන්තිට ලැබිය යුතු දඬුවම්

නීතියෙන් ලබා නුදුන්න ද ස්වභාව ධර්මයෙන් ලැබෙනු නියතය. මවක් සහ පියෙක් එකතු වී තම දරුවාගේ සම වයසේ තවත් දරුවකු මරා දැමීමට හවුල් වූ මහින්දට හා ශිරන්තිට ගල් ගසා මරා දැමුව ද එය මුලු මහත් ලෝකයාට දෙනු ලබන යහපත් පණිවුඩයක් වනු ඇත. තාජුදීන් ඝාතනය රාජපක්ෂ පරපුරේ හැරවුම් ලක්ෂය ලෙස සඳහන් කල හැකිය.

## යෝෂිත - නාමල් ගේ ඩුබායි බැංකු ගිනුමේ මුදල් යුක්රේන බැංකුවට මාරුකිරීම

රාජපක්ෂ පවුල හොරකම් කල මුදල් ප්‍රමාණය ඩොලර් බිලියන 18ක් බව මංගල සමරවීර ඇමතිවරයා ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළේය. මින් කලබලයට පත් නාමල් රාජපක්ෂ තමාගේ ඩුබායි බැංකුවක තැන්පත් කර තිබූ ඩොලර් මිලියන 800න් ඩොලර් මිලියන 500ක් යුක්රේනයේ බැංකුවකට මාරු කිරීමට යෝෂිත රාජපක්ෂ යෙදවූ බව පුවත්පත් වල පළවිය. යෝෂිත ඩුබායි හරහා යුක්රේනයට ගිය බවත් ඒ ගමන සඳහා නිවාඩු ලබා ගත් බව නාමල් රාජපක්ෂ ප්‍රකාශ කර ඇත. යෝෂිත නාවික නිළධාරියෙකු වශයෙන් සිටියදි මෙවැනි දූෂිත ගනුදෙනු වලට සාක්ෂි මෙහෙයවීම පිළිබඳව මෙතෙක් කිසිඳු පරීක්ෂණයක් නොකිරීම විමතියට කරුණකි.

නාවික හමුදාවට අයත් අධිබලැති බෝට්ටුවක් යෝෂිත විසින් ලබාගෙන ඇති අතර, එය බොල්ගොඩ වැවේ රඳවා තිබියදී සොයාගෙන ඇත. අන්ත දූෂිතයකු, මිනීමරුවකු වන මහින්ද රාජපක්ෂ තමන්ගේ පුත්‍රයින්ට එම පාපයන් පුරුදු කිරීම දෛවයේ සරදමකි.

*තාජුදීන් තවත් ජීවත් විය යුතු නැහැ...*



# 6
# බැසිල් රෝහණ රාජපක්ෂ

මහින්ද රාජපක්ෂ ගේ බාල සහෝදරයා වන බැසිල් ලංකා දේශපාලන ඉතිහාසයේ මෙතෙක් බිහි වී ඇති අන්ත දූෂිත දේශපාලනඥයකු වශයෙන් හැඳින්විය හැකිය. ලංකාවේ පමණක් නොව මුලු ලෝකයේම බැසිල් හඳුන්වන්නේ Mr. 10% (Ten present) යනුවෙනි. මින් අදහස් වන්නේ ඔහු විසින් කරන ලද සියලුම ව්‍යාපෘති වලින් සියයට දහයක් කොමිස් මුදල් ඔහු විසින් ලබා ගත් බවයි. මහින්ද රාජපක්ෂ ගේ අවසාන කාලය වන විට මෙම කොමිස් මුදල් 30% දක්වා ඉහළ ගිය බව අනාවරණය වී ඇත.



*දිවි නැගුමෙන් මිලියන 15,000ක් හොරා කෑ බැසිල්*

බැසිල් ගේ ළමා කාලය හා අධ්‍යාපනය පිළිබඳ වැඩි විස්තර සොයා ගැනීම අසීරුය. වෙබ් අඩවිවල සඳහන් වන්නේ ඔහු දේශපාලන කටයුතු වලට සම්බන්ධ වූ ආකාරය අනුව අ.පො.ස. (සා.පෙ.)වත් සමත් වී ඇත්දැයි සොයා ගැනීම අසීරුය. ඔහු ගාල්ල හා මාතර විදුහල් වලින් ඉගෙනුම ලැබූ බව පවසන නමුත් ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව පැහැදිලි විස්තරයක් දක්නට නැත.

රාජපක්ෂ පවුල ශ්‍රී.ල.නී.පයේ වුවද බැසිල් ට දේශපාලන ප්‍රතිපත්තියක් නොවීය. 1977 මුල්කිරිගල ආසනයට ශ්‍රී.ල.නි.ප.යෙන් ඉදිරිපත් වී පරාජය විය. මහින්ද රාජපක්ෂ ද බෙලිඅත්ත ආසනයෙන් අන්ත පරාජයක් ලැබීය.

## බැසිල් එජාපයට

1983 ජනමත විචාරණයේ දී මුල්කිරිගල ආසනයට තරඟ කල එ.ජා.ප. අපේක්ෂක ආනන්ද කුලරත්න පරාජය වූ නිසා ජේ.ආර්. ජයවර්ධන මුල්කිරිගල ආසනය සඳහා අතුරු මැතිවරණයක් පැවත්වූ අතර, බැසිල් රාජපක්ෂ සිය ඥාතියකු වූ නිරූපමා රාජපක්ෂට විරුද්ධව එ.ජා.ප.යෙන් තරඟ කළ ආනන්ද කුළරත්න ට සහයෝගය දැක්වීය. ඩී.එම්. රාජපක්ෂ පවුලේ ජෝර්ජ් රාජපක්ෂගෙ දියණිය වූ නිරූපමාට එරෙහිව බැසිල් - ආනන්ද කුලරත්න ට සහයෝගය දැක්වූයේ හුදෙක්ම සිය ආත්ම වාසිය සඳහාය.

ගාමිණී දිසානායක මහතා ගේ අනුග්‍රහයෙන් මහවැලි අධිකාරියේ සම්බන්ධීකරණ නිලධාරී වරයෙක් වශයෙන් රැකියාව කළ බැසිල් මහවැලි ව්‍යාපෘතිවලින් 10% කොමිස් මුදල් ගැනීමේ ව්‍යාපාරය ඇරඹූ බව එකල අසන්නට ලැබුන ප්‍රසිද්ධ කාරණයකි. ආර්ථික අතින් ඉතා අසරණ තත්වයක රාජපක්ෂ පවුල සිටි නිසා ගාමිණී දිසානායක මහතා ඔවුන්ට අනුකම්පාවෙන් බැසිල්ට මහවැලියේ රැකියාව ලබාදුන් බව ප්‍රසිද්ධ කාරණයකි. ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ දෝෂාභියෝග සිද්ධියත් සමග බැසිල් ඇමෙරිකාවට පලා ගියේය. ඇමෙරිකාවේ ලොස් ඇන්ජලීස් නුවර ඉන්ධන පිරවුම්හල්වල රැකියා කරමින් ඉතා දුක්ඛිත ජීවිතයක් ගත කල බැසිල් 2005 දී මහින්ද රාජපක්ෂ ජනාධිපති තරගයට ඉදිරිපත් වීමත් සමග ගෝඨාභය සමග ලංකාවට පැමිණ මහින්ද ගේ ජනාධිපතිවරණයට ඉතා කැපවීමකින් දේශපාලන ව්‍යාපාරය හා සම්බන්ධ විය.

## බැසිල් - ටිරාන් - ප්‍රභාකරන් සබඳතා

2005 ජනාධිපතිවරණයේ දී උතුරු නැගෙනහිර ඡන්ද ඉතා තීරණාත්මක සාධකයක් විය. උත්පත්තියේ සිට ඉතාම කපටි පුද්ගලයකු වූ බැසිල් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරණයේ


*ටිරාන් අලස්*


*ප්‍රභාකරන්*


*බැසිල් - කොමිස් සමග*

දිනීමට නම් රනිල් වික්‍රමසිංහට නියත වශයෙන් උතුරේ ඡන්ද වැලැක්විය යුතු බව ඔහුගේ කපටි බුද්ධියට අවබෝධ වී තිබුණි. මේ සඳහා යොදා ගත හැකි හොඳම පුද්ගලයා ප්‍රභාකරන් බව අවබෝධ කරගත් බැසිල්, ප්‍රභාකරන්ට රුපියල් මිලියන 800ක අල්ලසක් ටිරාන් අලස් හරහා ලබා දී ජනාධිපතිවරණයේදී කිසිඳු ඡන්ද දායකයෙකුට සිය ඡන්දය පාවිච්චි කිරීමට තහනම් බව ප්‍රභාකරන් ලවා ප්‍රකාශ කොට මුලු උතුරේම ඡන්දය දීම වලක්වනු ලැබීය. ලක්ෂ 5කට අධික එ.ජා.පයට ලැබීමට නියමිත ඡන්ද වැලැක්වීම නිසා මහින්ද රාජපක්ෂ වැඩි ඡන්ද 180,000 ජනාධිපතිවරණය ජයග්‍රහණය කළේය. එදා උතුරේ ජනතාවට නිදහසේ ඡන්දය පාවිච්චි කිරීමට හැකියාව තිබුනේ නම් රනිල් වික්‍රමසිංහ වැඩි ඡන්ද ලක්ෂ 04කින් පමණ ජය ගැනීමට නියමිතව තිබුණි.

බැසිල් - ටිරාන් හා එමිල් කාන්තන් නමැති LTTE නායකයකු සමග මෙම කුමන්ත්‍රණය කළ බව ඇමෙරිකානු තානාපති බ්ලේක් විසින් පසුව ඇමෙරිකාවට කේබල් පණිවිඩයක් මගින් දන්වා ඇත. මෙම කුමන්ත්‍රණය එවකට මුදල් අමාත්‍යාංශයේ ලේකම් පී.බී. ජයසුන්දර මහතා සහ එවකට මහින්ද ගේ ලේකම් වශයෙන් සිටි ලලිත් වීරතුංග ගේද සහයෝගය ලැබුණු බව ඇමරිකානු තානාපතිවරයාගේ කේබල් පණිවුඩයේ සඳහන් වූ බව විකිලික් පසුව අවධාරණය කරනු ලැබීය.

# මහින්ද ගේ උපදේශක බැසිල්

මහින්ද ජනාධිපති වීමෙන් පසුව ජනාධිපති උපදේශක වූ බැසිල් රජයේ සියලුම කටයුතු වලට අණදෙන නිළධාරියා විය. උප ජනාධිපතිවරයකු ලෙස මුලු රාජතන්ත්‍රයම කළමණාකරණය කිරීමේ බලතල මහින්ද බැසිල්ට ලබා දී තිබුණි.

2008 වර්ෂයේ දී ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත් කරනු ලැබූ බැසිල්ට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය නමින් අමාත්‍යාංශයක් පිහිටුවා ජාතික අයවැයෙන් 70% පමණ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා සංස්ථා එම අමාත්‍යාංශයට පවරනු ලැබීය.



*රජයේ ව්‍යාපෘතිවලින් කෝටි ගණනක කොමිස් ගැසූ බැසිල් ගම්පහ ඉදිකල සුපිරි නිවස හා කාර්යාලය.*

බැසිල් රාජපක්ෂ ගේ අධ්‍යාපන සුදුසුකම් හා දේශපාලන පළපුරුද්ද සලකා බලන විට ජාතික ආර්ථිකයේ ප්‍රධාන තැනක් ගන්නා ආර්ථික සංවර්ධනය අමාත්‍යාංශය වැනි අමාත්‍යාංශයක් බාරව කටයුතු කිරීමට සුදුසු දැන උගත්කමින් හෝ දේශපාලන පරිචයක් ඇති පුද්ගලයකු නොවේ. හුදෙක්ම ජනාධිපති ගේ සහෝදරයා වීම මෙම භාරදූර ඇමති තනතුරක් ලැබීමට හේතු විය. විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය සංවිධාන පවා බැසිල් ගේ අමාත්‍යාංශය කෙරෙහි දක්වූයේ ඉතා අඩු මට්ටමේ පිලිගැනීමකි.

ලැබී ඇති තොරතුරු අනුව ජනාධිපති මහින්ද රාජපක්ෂ බොහෝ වැදගත් කාරණා සම්බන්ධයෙන් උපදෙස් ලබා ගත්තේ බැසිල් රාජපක්ෂගෙනි. ඔහුගේ උගත්කම කෙසේ වෙතත්, කිහිප අවස්ථාවන්හි ඔහු උගත් පාසල් වලින් නෙරපා ඇති අතර, මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා දැන උගත් පළපුරුදු පාක්ෂිකයන්ගෙන් හෝ ලෝකයේ විශාලම කැබිනට් මණ්ඩලයෙන් හෝ උපදෙස් ලබා නොගෙන බැසිල් හා ගෝඨාභයගෙන් උපදෙස් ලබාගන්නා බව බ්ලේක් තවදුරටත් සඳහන් කර ඇත. බැසිල් හා ගෝඨාභය දශක 2කට ආසන්න න කාලයක් ඇමරිකාවේ ජීවත් වී 2005 ජනාධිපතිවරණයට ආසන්නව පැමිණ ජනාධිපතිවරණයේ ඉහළ තනතුරුවලට පත් වුවද ලංකාවේ තත්වය පිළිබඳව ගෝඨාභයට හෝ බැසිල්ට නිරවුල් අවබෝධයක් නොතිබූ බවද බ්ලේක් තානාපතිවරයා ඇමෙරිකා රජයට යැවූ කේබල් පණිවුඩයේ තවදුරටත් සඳහන් ව ඇත.



*2015 ජනවාරි 9 වන දින බැසිල් සිය බිරිඳ සමග ඇමරිකාවට පලා යෑම.*

බැසිල් ගේ චරිතය පිලිබඳව රොබට් බ්ලේක් තානාපතිවරයා විග්‍රහයක යෙදේ. "බැසිල්ට සමීප උපදේශකයන් නැත. ඔහුට ඇත්තේ මිතුරන්ට වඩා සතුරන්ය. ඔහු නිතරම උත්සාහ කරන්නේ පුද්ගලයන් මුදලට ගැනීමටයි". මහවැලි සංවර්ධන අමාත්‍යාංශය ඔහු සේවය කල අවධියේ ඔහුට පටබැඳී තිබූ නාමය ටෙන් පසන්ට්(10%) සියලුම ව්‍යාපෘති වලින් බැසිල් 10% කොමිස් ලබා ගත් බව රොබට් බේලේක් තානාපතිවරයා ඇමරිකානු රජයට යැවූ කේබල් පණිවුඩයේ සඳහන් විය.

බැසිල් හා ගෝඨාභය පිළිබඳ ව තවදුරටත් කරුණු දක්වන රොබට් බ්ලේක් 2010 ජනාධිපතිවරණය තුලින් මහින්ද රාජපක්ෂ ගේ සමීප උපදේශකයකු වන සුනිමල් ප්‍රනාන්දු සමග කරන ලද සාකච්ඡාවේදී අනාවරණය වූ කරුණු අනුව ඡන්ද දායකයින්ගෙන් 85% රාජපක්ෂ පවුල දූෂිතයන් බවත් මහින්ද රාජපක්ෂ පමණක් 80% දූෂිතයකයකු බවත් ඔවුන් විසින් කරන ලද සමීක්ෂණයේ දී හෙළි වූ බව පවසා ඇත. බැසිල් හා ගෝඨාභය එකිනෙකා කෙරෙහි පසමිතුරු ආකල්පයකින් කටයුතු කල බව පවසන ඇමරිකානු තානාපති බ්ලේක් යම්කිසි දිනක චීන කේබල් පණිවුඩ පරීක්ෂා කිරීමට හැකි වුවහොත් රාජපක්ෂ සහෝදරවරුන් ගැන විශ්මය දනවන ප්‍රවෘත්ති හෙළිවනු ඇති බව සඳහන් කරයි. හම්බන්තොට වරාය ඉදිකිරීම පිළිබඳ කොන්ත්‍රාත්තුව චීන සමාගමකට දීම පිළිබඳව මහින්ද, බැසිල් හා ගෝඨාභය අතර පැවති තීරණාත්මක සාකච්ඡාවකදී ගෝඨාභය හා බැසිල් අතර ඉදිකිරීම් සමාගම තෝරා ගැනීමට ඇතිවූ අර්බුදය විසඳීමට කොන්ත්‍රාත්තුව දෙකට කඩා සමාගම් දෙකකට පැවරීමෙන් බැසිල් හා ගෝඨාභය අතර වූ උග්‍ර අර්බුදය විසඳීමට සිදුවූ බවද ඇමරිකානු තානාපති බ්ලේක් සිය කෙබල් පණිවුඩයේ සඳහන් කර ඇත.



*රජයේ මුදල් කෝටි ගණනින් සොරකම් කොට, බැසිල් මල්වානේ සෑදූ බිලියන 2 බංගලාව.*

## රාජපක්ෂවරු අශීලාචාර වනචරයින් පිරිසක්

ලංකාවේ හිටපු ඇමරිකානු තානාපතිවරියක වන පැට්රීෂියා ඒ. බියුටෙනිස් (Patricia A Butenis) වොෂින්ටනයට යැවූ කේබල් පණිවුඩයක හිටපු ජනාධිපතිනී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමරණතුංග මහත්මිය රාජපක්ෂ පවුල පිළිබඳව කරන ලද හැඳින්වීමක් අපූරුවට දක්වා ඇත.

"රාජපක්ෂවරු දේශපාලනයට ඇතුල්වීම ඉතාම අමිහිරි අත්දැකීමකි. රාජපක්ෂවරුන් නූගත් අශීලාචාර වනචරයන් පිරිසකි" රාජපක්ෂවරුන් පිළිබඳව චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිනිය ගේ විග්‍රහය ප්‍රභුවරුන්ගේ ආකල්පය අනුව සිදුවූ බවට සමහරු තර්ක කරති.

ජනතා විමුක්ති පෙරමුනේ හිටපු නායක සෝමවංශ අමරසිංහ මහින්ද රාජපක්ෂ පිළිබඳව දන්වා ඇත්තේ මෙබඳු අදහසකි. මහින්ද රාජපක්ෂට ඇත්තේ ඉතාමත් පටු දැක්මකි. ඔහු හීනමානයෙන් පෙලෙන අතර, සම්ප්‍රදායික ප්‍රභු පැලැන්තියේ දේශපාලන පරපුරකට අයත් නොවූ ඔහු හැම දෙනා දෙසම බැලුවේ සැකයෙනි.

# පුෂ්පා රාජපක්‍ෂ පදනම

## පුෂ්පාගේ පුණ්‍ය පදනමට කෝටි 600ක්



කොළඹ අලුතින් ඉදිකෙරුණ වරායේ ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්තුවක් ලබාගත් චීන සමාගමකින් රුපියල් මිලියන 600 (කෝටි 60) මුදලක් පුෂ්පා රාජපක්ෂ නමැති පදනමේ ගිනුමකට බැරවීමේ සිද්ධියක් සම්බන්ධයෙන් කොළඹ මූල්‍ය අපරාධ කොට්ඨාසය පුළුල් පරීක්ෂණයක් ආරම්භ කර ඇත. බැසිල් රාජපක්ෂ මහතාගේ බිරිඳ වූ පුෂ්පා රාජපක්ෂ මහත්මිය යටතේ මෙම පදනම ස්ථාපිත කර තිබේ.

වරායේ ඉදිකිරීම් කටයුතු වල කොටසක් බාර ගෙන තිබූ Colombo International Container Terminal නමැති සමාගම එකම චෙක්පතකින් සෘජුවම මෙම මිලියන 600 මුදල එම පුෂ්පා රාජපක්ෂ ගිණුමට බැර කර තිබේ.

පුණ්‍ය පදනමක් ලෙස එම පදනම පිහිටුවා ඇතත් එහි මුදල් එය පිහිටුවාගත් අය විසින් පෞද්ගලිකවම පරිහරණය කරන බවට මූල්‍ය අපරාධ කොට්ඨාශය තහවුරු කරගෙන තිබේ.

එම චීන සමාගමට අදාළ වරාය සංවර්ධන කටයුතුවලට අදාළ කොන්ත්‍රාත්තුව පැවරීම පිටුපස එවකට රජයේ හිටපු ප්‍රබල ඇමතිවරයකු සිටියි.

එම ඇමතිවරයා එම සමාගමට අදාළ කොන්ත්‍රාත්තුව පැවරීමේ දී ඔහුට සමාගමෙන් ලැබුණු කොමිස් මුදල වූ මිලියන 600 සෘජුවම ඔහු විසින් බාර නොගෙන අදාළ පුෂ්පා රාජපක්ෂ පදනමේ ගිණුමට බැර කරවා ඇති බවටද තොරතුරු ලැබී තිබේ.

පුෂ්පා රාජපක්ෂ තමාගේ පෞද්ගලික සේවකයන් ලෙස නාවික හමුදා සෙබළියන් 6 දෙනෙකු යොදවා ගෙන තිබූ බවට එම සෙබළියන් ජනාධිපති කොමිසම හමුවේ දිවුරුම් ප්‍රකාශ මගින් සහතික කර ඇත. එම සෙබළියන්ගේ රාජකාරිය වූයේ පුෂ්පාට සාරි ඇන්දවීම, ආයගේ සාරි කටු ගැසීම, සපත්තු පොලිෂ් කිරීම, ටිෂූ කඩදාසි පෙට්ටි රැලෙන යැම. මීට අමතරව ඇයගේ සුරතල් බල්ලන් නැහැවීම හා උන්ට කෑම දීම, ඇවිද්ද වීම ආදියට නාවික හමුදාවේ සෙබලුන් යොදාගත් බවටද එම සෙබලුන් දිවුරුම් ප්‍රකාශ ලබාදී ඇත.

රාජපක්ෂ සහෝදර සමාගමේ බිරින්දෑවරුන් අතුරින් ජනතා අප්‍රසාදයට හා පිළිකුලට බඳුන් වූ ප්‍රධාන තැනැත්තිය බැසිල්ගේ බිරිඳ පුෂ්පා රාජපක්ෂයි.

*මල්ලී හරි මල්ලී...*





*පානාති පාතා වේ රමණී...*

# 7

# ගෝඨාභය නන්දසේන රාජපක්ෂ

ගෝඨාභය 1949 ජුනි 20 දින මාතර පාලටුවේ ඉපදී වීරකැටියේ මැදමුලන ජීවත්විය. කොළඹ ආනන්ද විද්‍යාලයේ අ.පො.ස. උසස් පෙල දක්වා අධ්‍යාපනය ලැබීය. 1971 අප්‍රේල් 26 ශ්‍රී ලංකා යුධ හමුදාවේ කැඩෙට් නිළධාරියෙකු ලෙස පත් වූ ගෝඨාභය 1992 දී වෛද්‍ය හේතු (මොලේ ආබාධයක්) මත හමුදාවෙන් විශ්‍රාම ගෙන ඇමෙරිකාවට රැකියාවක් සඳහා ගොස් ඇත.



*සහෝදර ප්‍රේමය උතුරාගොස්*

ගෝඨාභය කිසිවිටෙකත් ඉගෙනීමට දක්ෂයෙකු නොවිය. ඔහු ආනන්ද විද්‍යාලයේ ඉගෙන ගත් නමුදු කිසිම ක්‍රීඩාවකට හෝ සම්බන්ධ නොවූ ඉතා කුලැටි, පසුගාමී චරිතයක් තිබූ ළමයෙක් බව ඔහුගේ මිතුරෝ පවසති. අඩු තරමින් හොඳ මිතුරෙකු නොසිටි බව ප්‍රසිද්ධ කරුණකි. අ.පො.ස. (සා.පෙල) දෙවරකට සමත් වී ඇති බව ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කිරීමේදි සනාථ වී ඇත.



*මිනීමරු කරුණා, ගෝඨා හමුවක්.*

හමුදා ජීවිතයේදී ද කුෂලතා දක්වූ නිළධාරීයෙක් නොවු ගොඨාභය 1989/90 මාතලේ දිස්ත්‍රික්කයේ හමුදා කාණ්ඩයක් බාරව සිටි අතර, ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් විශාල ප්‍රමාණයක් ඝාතනය කිරිමට සම්බන්ධ වූ බවට කරුණු හෙලි වී ඇත. මැතකදි මාතලෙන් හමු වු සමූහ මිනීවල පිළිබඳ පරීක්ෂණ යට ගැසීමට මහින්ද රාජපක්ෂ පෙළඹවූයේ ගොඨාභය බවටද ආරංචි පැතිර තිබුණි. කෙසේ වුවද මොළේ අමාරුවක් නිසා හමුදා සේවයෙන් විශ්‍රාම ගත් බව ඔහුගේ රාජකාරී වාර්තාවල සඳහන් වේ.

ඇමෙරිකාවේ ලොස් ඇන්ජලීස් නුවර, පිරිසිදු කිරීමේ කම්කරු (Cleaner) රැකියාවක් කල බව ඔහු පිළිබඳව වෙබ් අඩවි වල ඔහුගේ නම සඳහන් වන්නේ නන්දසේන රාජපක්ෂ නමිනි.

එම වෙබ් අඩවිවල තොරතුරු අනුව 2010 පසුව ලොස්ඇන්ජලීස් නුවර නිවස 5ක අයිතිය ගෝඨාභය රාජපක්ෂගේ බවට කරුණු අනාවරණය වී ඇත. එම දේපල වල වාර්තාවන වටිනාකම ඩොලර් මිලියන 50කට වඩා තක්සේරු කර ඇති බවද, එම වෙබ. අඩවි වල සඳහන් වී ඇත. ගෝඨාභයගේ හා බිරිඳ වන අනෝමා නමින් මෙම නිවාසවල අයිතිය ලියාපදිංචි කර ඇති බවද එම අඩවිවල දක්වා ඇත. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වීමට පෙර ගෝඨාභය පවුල ලොස්ඇන්ජලීස් නුවර කුලී නිවසක ජීවත් වූ බව ප්‍රසිද්ධ කරුණකි. ආරක්ෂක අමාත්‍යාංශය වැනි ඉතා ප්‍රබල අමාත්‍යාංශයක ලේකම් ධූරයක් දැරීමට කිසිදු සුදුසුකමක් නොමැති ගෝඨාභයට මහින්ද රාජපක්ෂ ලේකම් ධූරය පිරිනැමීම මුලුමහත් රාජ්‍ය සේවයට කරන ලද නින්දාවකි.


*ගෝඨා, බිරිඳ*

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අධි ශ්‍රෙණියේ නිළයක් වන රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ධූරය අ.පො.ස.(සා.පෙල) දෙවරකට සමත් වී ඇති ගෝඨාභය වැනි පුද්ගලයකුට පිරිනැමීම මහින්ද රාජපක්ෂ විසින් කරන ලද ඉතාම නින්දිත ක්‍රියාවකි. ගෝඨාභය ඉතාම සූක්ෂම අන්දමින් රාජ්‍ය බලතල යොදා ගනිමින් අධික ලෙස මුදල් අවභාවිතය කල පුද්ගලයෙකි. සුප්‍රසිද්ධ මිග් ගනුදෙනුව තුලින් ඩොලර් මිලියන 04 කොමිස් මුදල් ලබා ගෙන ඇති බව සාක්ෂි සහිතව ඔප්පු කිරීම නිසා සන්ඩේ ලීඩර් පුවත්පතේ ප්‍රධාන කර්තෘ ලසන්ත වික්‍රමතුංග මහතා ඉතා මිලෙච්ඡ ලෙස ඝාතනය කිරීම සම්බන්ධව ප්‍රධාන ප්‍රධාන ක්‍රියාකාරියෙකු ලෙස ගෝඨාභය කටයුතු කර ඇති බව දැනට කරුණු අනාවරණය වෙමින් පවතී.

යුද්ධයේ මුවාවෙන් පාවිච්චියට ගත නොහැකි මිග් ගුවන් යානා 04ක් රුසියාවේ තානාපතිව සිටි සිය ඥාතියෙකු වන උදයංග වීරතුංග නැමැත්තා ගේ අනුබලය ඇතිව මිලට ගෙන ඇති බව පරීක්ෂණවලදි හෙලි වී ඇත.

මීට අමතරව වීරකැටිය ව්‍යාපෘතිය නමින් ව්‍යාජ නමක් යොදා ගෙන සිය දෙමාපියන්ගේ සොහොන් කොත් හා කෞතුකාගාරයක් සෑදීමට ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලයේ අරමුදල් වලින් රුපියල් මිලියන 65ක් (ලක්ෂ 650) වංචා සහගත ලෙස ලබාදීමට අනුමැතිය ලබා දී ඇත්තේ ගෝඨාභය බව කරුණු අනාවරණය වී ඇත. පුදුමය නම් එම වංචාව ඔහුගේ අනුදැනුම අනුව කරන ලද බව පිළිගෙන ඩී.ඒ. රාජපක්ෂ ගුණානුස්මරණ කමිටුව විසින් එම ලක්ෂ 650ක මුදල අදාල සංස්ථාවට ආපසු ගෙවීමට එම කමිටුව තීරණය කොට ලක්ෂ 25 මුදලක් දැනටමත් ගෙවා තිබීමයි. මෙම සිදධිය ලංකා ඉතිහාසයේ කිසිදිනක නොමැකෙන මුදල් මංකොල්ලයක් ලෙස සටහන් වනු නොඅනුමානය.

මෙරට නීතිය එක් එක් පුද්ගලයන්ට එක් එක් ආකාරයට ක්‍රියාකරන බව ජීවමාන උදාහරණයක් ලෙස මෙය දැක්විය හැකිය. යමෙකු හොරකමක් කොට (මුදල් හෝ භාණ්ඩයක්) එය හෙලි වූ පසුව එම මුදල හෝ භාණ්ඩය භාරදීමෙන් එය සොරකම් කළ පුද්ගලයා වරදක් නොකල පුද්ගලයකු ලෙස සඳහන් කල හැකි නම් අප සිහිකල යුත්තේ "මෙරට කුමට අධිකරණ නීතිය හා විනිසුරුන්"යන නන්ද මාලිනියගේ ගීතයයි.

ගෝඨාභය රාජපක්ෂ නමැති පුද්ගලයා විසින් කරන ඇති අපරාධ, දූෂණ, රාජ්‍ය බලය අයුතු ලෙස යොදා ගැනීම පිලිබඳව විස්තර කිරිමට වෙනම ග්‍රන්ථයක් සම්පාදනය කිරිමට සිදුවේ. මහින්ද රාජපක්ෂට වඩා ඉතා නින්දනීය, බිහිසුනු ක්‍රියා සිදුකල පුද්ගලයෙක් වන ගොඨාභය නීතිය

ඉදිරියට පමුණුවා දඬුවම් නොකලහොත් ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රියවලිය කෙරෙහි ජනතාවගේ ඇති විශ්වාසය හා පිළිගැනීම අතිශයින්ම පහළ මට්ටමකට වැටීම වැලැක්විය නොහැක.

ඇමරිකානු පාස්පෝර්ට් එකක් ඔහුට හිමි බව ගොඨාභය විසින් මෙරට සුප්‍රීම් උසාවියේ දී ප්‍රකාශකොට ඇත.

## මහින්ද සහ ගෝඨා විසින් සිරකරුවන් මරා දැමීම

**දිනය** :- 2012 නොවැම්බර් 09 දින
**ස්ථානය** :- වැලිකඩ බන්ධනාගාරය

මහින්ද සහ ගෝඨාභය රාජපක්ෂගේ කුමන්ත්‍රණයක් අනුව සිදු කරන ලද සිරකරුවන් 27 දෙනෙකුගේ ඝාතනය - ලංකා ඉතිහාසයේ රාජ්‍ය පාලකයකු විසින් කරන ලද අතිශය කුරිරු සහ ඉතා නින්දනීය සහගත මිනිස් ඝාතනයකි.



*මිනීමරු ගෝඨාගේ නියෝග මත වැලිකඩ සිරකරුවන් මරා දැමූ ආකාරය.*

වැලිකඩ බන්ධනාගාරයේ මත්කුඩු ජාවාරමක් පිළිබඳව පරීක්ෂණ කරන මුවාවෙන් රජයේ හමුදා යවා නම් ලැයිස්තු අනුව සිරකරුවන් සොයා ඔවුන්ට වෙඩි තබා මරා දමා ඇති බව දැනට කරන ලද පරීක්ෂණ වලින් අනාවරණය වී ඇත.

මෙම මහා මිනිස් ඝාතනයට හේතු වී ඇත්තේ මහින්ද රාජපක්ෂගේ අනු දැනුම උඩ ගෝඨාභය විසින් සුදු වෑන් උපයෝගී කර ගනිමින් කරන ලද පැහැර ගැනීම් හා මිනිස් ඝාතන පිළිබඳව සැකකරුවන් විශාල පිරිසක් වැලිකඩ බන්ධනාගාරයේ මේ වන විට රඳවා තැබීමයි. මෙම මිනිස් ඝාතන වලට ගෝඨාභය රාජපක්ෂ සම්බන්ධ බව මෙම රැඳවියන් තොරතුරු දන්නා බැවින් එකී පරීක්ෂණයක් මුවාවෙන් හිර ගෙදර අනවශ්‍ය කලබලයක් ඇති කොට තෝරාගත් රැඳවියන් පිරිසක් ඝාතනය කිරීමට ගෝඨාභය සැළසුම් කල මිනිස් ඝාතනයක් බවට තොරතුරු හෙළිවෙමින් පවතී.

මහින්ද - ගෝඨාභය සහ ඇවන්ගාඩ් සමාගම අතර තිබූ සබඳතාවයක් හා එහි සිදුකරන ලද අතිබිහිසුනු මිනීමැරුම් හා දූෂණ ක්‍රියා පිලිබඳව තොරතුරු දන්නා සැකකරුවන් රාශියක් වැලිකඩ බන්ධනාගාරයේ රදවා තිබුනි. මෙම සැකකරුවන් මරා දැමීමට හේතුවන්නට ඇත්තේ ඇවන්ගාඩ් සමාගම හා රාජපක්ෂවරු අතර තිබූ රහස් සම්බන්ධතාවය හෙලිවෙතැයි යන බිය නිසා විය යුතුය.

මහින්ද හා ගෝඨාභය මිත්‍යාවිශ්වාස දැඩිව විශ්වාස කල පුද්ගල චරිත දෙකකි. කෝට්ටේ රජමහා විහාරයේ කඩු සොරකම සිදු කරන ලද්දේ එම කඩු තබා ගන්නා අයෙකුට සදාකාලික බලයේ රැඳී සිටීමට හැකි බවට තිබූ විශ්වාසයෙනි. මෙම කඩු සොරකමට සම්බන්ධ නිලමේ හෙවත් මංජු ශ්‍රී මහේස්ත්‍රාත්වරයාට විශේෂ ප්‍රකාශයක් කිරීමට සූදානමින් සිටියේය. මෙම සැකකරුද වැලිකඩ බන්ධානාගාරයේ සිටි අතර, බන්ධනාගාරයට ඇතුලු වූ සෙබලුන් "කඩුව ගන්න හාමුදුරුවෝ මරපු එකා කෝ" කියමින් කෑ ගසා ඇති අතර, නිලමේ හෙවත් මංජු ශ්‍රී ද මරා දමා තිබුනි. මංජු ශ්‍රී මහේස්ත්‍රාත් ඉදිරියේ කිරීමට බලාපොරොත්තු වූ ප්‍රකාශයෙන් රාජපක්ෂවරු චූදිතයන් වීමට ඉඩ තිබූ බැවින් මොහුද මරා දමා ඇත.

මෙම අතිශය කුරිරු නින්දනීය මිනිස් ඝාතනය යන කොමිෂන් සභා දෙකක් පත් කර වාර්තා සකස් කර ඇති නමුත් අද දක්වා එම වාර්තා ප්‍රසිද්ධියට පත් කර නැත. ජිනීවා මානව හිමිකම් කොමිසම හමුවට ශ්‍රීලංකාව ගෙන ඒමට ප්‍රධාන සාධකයක් වූයේ ද මෙම සිරකරුවන් මරා දැමීමේ සිද්ධියයි.

## ලසන්ත වික්‍රමතුංග ඝාතනය සහ මහින්ද ගෝඨා සම්බන්ධය

2009 ජනවාරි 08 දින පෙ.ව. 10.30ට පමණ අත්තිඩිය බේකරි හන්දිය අසලදී ලංකාවේ මෙතෙක් බිහිවූ නිර්භය, අදීන, සත්‍යගරුක පුවත්පත් කලාවේදියෙකු වූ ලසන්ත වික්‍රමතුංගයන් මිනිමරු මහින්දගේ උපදෙස් අනුව ගෝඨාභයගේ නියමය පරිදි ඔහුගේ නිල නොලත් ඝාතකයින් විසින් මරා දැමීම මෙම සියවසේ දී කරන ලද ඉතාම අමානුෂික කුරිරු මිනිස් ඝාතනයක් ලෙස හැඳින්විය හැකිය.


ප්‍රවීන මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග


ලසන්තගේ දේහයට සොනාලි ගෞරවය දක්වමින්

මෙම අබිරහස් මිනීමැරුම සිදුවී දැනට වසර 7කට අධික කාලයක් ගතවී තිබුනද මෙම අභිරහස් මිනිමරුවන් මේ දක්වා නීතියේ රැහැනට හසු කර ගැනීමට නොහැකිවීම වික්‍රමතුංග පවුලේ අභාග්‍යය නොව මුලුමහත් ජාතියේම අභාග්‍යයකි. ජාතියේ හා දේශයේ වාසනාවට 2015 ජනවාරි 08 දින සිදුවූ දේදුනු විප්ලවයට ණයගැති වන්නට අද ලසන්ත වික්‍රමතුංගයන් ගේ ඝාතනයට වගකිව යුතු සැබෑ මිනීමරුවන්ගේ විස්තර හෙලිවෙමින් පවතී. මහින්ද රාජපක්ෂ හා ගෝඨාභය රාජපක්ෂ එකතු වී කරන ලද මෙම සහාසික අපරාධයට හේතු වූයේ සන්ඩේ ලීඩර් පුවත්පත් මගින මහින්දගේ හා ගෝඨාභයගේ මූල්‍ය වංචා, මිනීමැරුම් ආදිය සාධක සහිතව හෙළි කිරීමයි. "මිග් යානා" මිළදී ගැනීමේ දී ඩොලර් මිලියන ගණනක් වංචා කිරීමේ සිද්ධිය ලිඛිත සාධක සහිතව ලසන්ත වික්‍රමතුංගයන් හෙලි කිරීම ඔහුගේ අවාසනාවන්ත මරණයට හේතු විය.

මහින්ද රාජපක්ෂ හා ගෝඨාභය ලසන්ත වික්‍රමතුංගයන් ඝාතනය කිරීම කෙතරම් සියුම් ලෙස සැලසුම් කලද එම මිනීමැරුම පිලිබඳව තොරතුරු එකිනෙක අනාවරණය වෙමින් පවතී.

## ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් කිරීම

ලසන්ත වික්‍රමතුංගයන් ගේ ඝාතනය මෙන්ම මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් කිරීමට රාජපක්ෂ රෙජීමය විසින් කරන ලද ඉතාම නින්දනීය කුරිරු මිනිස් ඝාතනයක් ලෙස සඳහන් කල හැකියි. 2010 ජනවාරි ජනාධිපතිවරණයට දින කිහිපයකට පෙර අතුරුදන් වූ ප්‍රගීත් පිළිබඳව කිසිඳු ආරංචියක් රාජපක්ෂ රෙජීමය සමයේ දී සොයා ගැනීමට නොහැකි විය. ඔහුගේ අතුරුදන්වීම පිළිබඳව මොහාන් පීරිස් හිටපු අගවිනිසුරු වරයා සහ එතනෝල් චක්‍රවර්ති පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නියෝජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු විවිධ අර්ථකථන මහින්ද රාජපක්ෂ පිනවීමට ප්‍රකාශ කළහ. මොහාන් පීරිස් අන්තර් ජාතික සම්මේලනයකදී ප්‍රගීත් එක්නැලිගොඩ බටහිර රටක දේශපාලන රැකවරණය යටතේ ජීවත්වන වන බව ප්‍රකාශ කළ අතර හෝමාගම මහේස්ත්‍රාත් ඉදිරියේ ප්‍රකාශ කළේ ප්‍රගීත් ඉන්නා තැන දන්නේ උඩ සිටින දෙවියන්

පමණයි යනුවෙනි. ප්‍රගීත් පැරීසියේ දී තමන්ට හමුවූ බව අරුන්දික ප්‍රනාන්දු පාර්ලිමේන්තුවේ දී හා ඉන් පිටතදී ඉතා නිර්ලජ්ජිතව ප්‍රකාශ කළේය. මනුෂ්‍ය ජීවිතයක ඇති වටිනාකම පිලිබඳව කිසිඳු තැකීමක් නොකරන මෙබඳු අමනයන් ජනතාව විසින් පාර්ලිමේන්තුවට පත් කර එවීම මුලුමහත් ජාතියේම අවාසනාවකි.

2015 ජනවාරි 08 විප්ලවයෙන් බිහිවූ යහපාලන ආණ්ඩුවෙන් ප්‍රගීත් ගේ අභිරහස් අතුරුදන්වීම පිළිබඳව පරීක්‍ෂණ නැවත ආරම්භ කිරීමෙන් පසුව දම්වැලක පුරුක් ඇමුණු ආකාරයෙන් මෙම සහාසික මිනීමැරුම පිළිබඳව කරුණු අනාවරණය වෙමින් පවතී. ලසන්ත වික්‍රමතුංගයන්ගේ මිනීමැරුමට මෙන්ම ප්‍රගීත් ගේ අතුරුදහන්වීමටද හේතු වූයේ රාජපක්‍ෂවරුන් ගේ දූෂණ හෙලි කිරීමට කාටූන් පොතක් පිළියෙල කිරීමයි. රාජපක්‍ෂ පවුල් වනය ව්‍යාප්ත වී ඇති ආකාරය සහ ඔවුන් මහජන දේපල කොල්ල කන ආකාරය විස්තර කෙරෙන පොතක් පිළියෙල කිරීම ප්‍රගීත් අතුරුදහන් කිරීමට හේතු වූ බව අනාවරණය වෙමින් පවතී.





*රාජපක්ෂ රෙජිමය විසින් අතුරුදහන් කළ ප්‍රගීත් එක්නැලිගොඩගේ බිරිඳ හා දරු දෙදෙනා*

රාජපක්‍ෂවරුන්ගේ කුලී මිනීමරුවන් වූ ආරක්‍ෂක අංශයේ ඉහළ නිළධාරීන් ඇතුලුව 9 දෙනෙක් මෙම අතුරුදහන් කිරීමට සම්බන්ධ බවට සාක්‍ෂි සහිතව කරුණු හෙළි දරව්වෙමින් පවතී. ගෝඨාභය රාජපක්‍ෂ ගේ නියමය අනුව මෙම ඝාතනයද සිදු වූ බවට කරුණු හෙලිවීමත් සමගම රාජපක්‍ෂවරුන්ගේ වහලුන් වන උදය ගම්මන්පිල, විමල් වීරවංශ, දිනේෂ් ගුණවර්ධන, ප්‍රධාන දූෂකයන් වන කෙහෙළිය රඹුක්වැල්ල, වාසුදේව ඇතුලු දේශපාලන කුණු කූඩයට විසිවුනු වාමාංශික නායකයින් "රණවිරුවන් - බුද්ධි අංශ නිළධාරීන්" සිරගත කිරීමට වර්තමාන ආණ්ඩුව කටයුතු කරන බව පවසමින් ජනතාව මුලා කිරීමේ ව්‍යාපාරයක් අරඹා ඇත.



*ප්‍රගීත් ප්‍රංශයේදී හමුවූ බව කී රාජපක්ෂ ජුන්ටාවේ වහලෙකු වූ අරුන්දික ප්‍රනාන්දු*



*මහින්ද රාජපක්ෂගේ සට්ටැඹියකු වූ හිටපු අගවිනිසුරු මොහාන් පීරිස්*

ප්‍රගීත් එක්නැලිගොඩගේ මිනීමරුවන් හෙලිවීමත් සමගම රාජපක්‍ෂවරුන් භීතියට පත්වී ඇති අතර තම වහලුන් උපයෝගී කර ගෙන එම විමර්ශන අඩපණ කිරීමට දැඩි උත්සාහයක යෙදී සිටී.

ප්‍රගීත් කොටි ඔත්තුකරුවෙකු වශයෙන් පැහැර ගෙන ගොස් ගිරිතලේ හමුදා කඳවුරේ ප්‍රශ්න කිරීමෙන් අනතුරුව ඔහු ඝාතනය කර ඇති බව මෙතෙක් කරන ලද විමර්ශණ වලදී අනාවරණය වී ඇත. රාජපක්‍ෂ රෙජිමය පරාජය කලද ඔවුන්ගේ වහලුන් අද දක්වාම සක්‍රියව ඇතිබව මෙම පරීක්‍ෂණ සිදු කිරීමේදී ඇති වූ බාධා වලින් හොඳින්ම පැහැදිලි වූ කරුණකි. නීතිපති දෙපාර්තමේන්තුව හමුදාවේ උසස් නිළධාරීන්, ඩයලොග් දුරකථන සමාගම, මෙම පරීක්‍ෂණවලට අපමණ බාධා එල්ල කල බව අපරාධ පරීක්‍ෂණ දෙපාර්තමේන්තු නිළධාරීන් අධිකරණය හමුවේ ප්‍රකාශ කොට ඇත. ශ්‍රී ලංකා හමුදාව ප්‍රථමවරට මිනීමැරුම් පිළිබඳව චෝදනා එල්ල වී ඇති නිළධාරීන්ට

නීති උපදෙස් ලබාදීමට හමුදාවේ මුදල් වැය කරමින් නීතිඥ සහාය ලබාදීමද පුදුම එලවන සිද්ධියකි. ප්‍රගීත් ගේ අතුරුදහන්වීම පිලිබඳව පරීක්‍ෂණ පවත්වන නිලධාරීන්ගේ අවංකභාවය හා ඔවුන්ගේ තීක්‍ෂණ පරීක්‍ෂණ ක්‍රමවේදයන් අනුගමනය නොකලා නම් ප්‍රගීත් ගේ අතුරුදහන්වීමත් රාජපක්‍ෂවරුන් විසින් සිදුකරන ලද අනෙකුත් මිනීමැරුම් මෙන්ම කාලයේ වැලිතලාවට යටවී යනු ඇත.

අද ලාංකික ජනතාව පමණක් නොව මාධ්‍ය නිදහස අගයන මුලුමහත් ලෝකයාම දෑස විවර කරමින් බලා සිටින්නේ, මාධ්‍ය නිදහස වෙනුවෙන් සිය ජීවිත පරිත්‍යාග කල ලසන්තයන්ට සහ ප්‍රගීත්ට සාධාරණය ඉටුවේදැයි යන වැදගත් තීරණය ලැබෙන දිනය උදාවන තුරුය.

## ඇවන්ගාඩ් දූෂණය සහ ගෝඨාට නඩු

රාජපක්‍ෂ රෙජිමය පරාජයවීමෙන් පසුව හෙලි වූ අතිවිශාල දූෂණය නම් ඇවන්ගාඩ් සමාගම හා ගෝඨාභය රාජපක්‍ෂ එක්වී කරන ලද කෝටි, ප්‍රකෝටි මහජන මුදල් මංකොල්ල කෑමේ සිද්ධියයි.

ඉන්දීය සාගර මුහුදු කොල්ලකරුවන්ගෙන් එල්ල වන කොල්ලකෑම් වලින් වාණිජ නෞකා ආරක්‍ෂා කර ගැනීම සඳහා මුහුදු ආරක්‍ෂක සේවයක් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් බොහෝ කලක සිට පවත්වා ගෙන යනු ලැබූ සේවාවකි. නැව් වලට ආරක්‍ෂාව සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවට විශාල ආදායමක් ලැබුනි. මෙම විශාල ධනස්කන්ධය ගෝඨාභය ඇතුලු ඔහුගේ ගජ මිතුරන් කල්ලියට ලබා ගැනීම සඳහා ඉතා කූඨ ලෙස සකස් කරන ලද ක්‍රියාවලියක් 2012 වර්ෂයේ සිට ගෝඨාභය ක්‍රියාත්මක කරනු ලැබීය.

ඇවන්ගාඩ් නම් පෞද්ගලික ආරක්‍ෂක සමාගමකට ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් කරන ලද ආරක්‍ෂක සේවය පවරාගෙන ශ්‍රී ලංකා නාවික හමුදාවට ලැබෙමින් තිබූ විශාල ආදායමක්, ඇවන්ගාඩ් සමාගමට ලබාදීම සඳහා "රක්නා ලංකා" නමින් රාජ්‍ය සමාගමක් ඇති කර එම මාර්ගයෙන් රජයට අයත් ගිනි අවි ඇවන්ගාඩ් සමාගමට ලබා දී රජයට ලැබීමට තිබූ විශාල ආදායමක් ඇවන්ගාඩ් සමාගමට ලැබෙන පරිදි රාජ්‍ය ආරක්‍ෂක අමාත්‍යාංශයේ බලතල පාවිච්චි කොට කිසිඳු විනිවිදභාවයකින් තොරව නීත්‍යානුකූල නොවූ හමුදාවක් හා ගිනි අවි විශාල සංඛ්‍යාවක් ඇවන්ගාඩ් සමාගමට ලබා දී ඇති බව කරන ලද පරීක්‍ෂණ වලින් අනාවරණය වී ඇත.



*ශ්‍රී ලංකා නාවික හමුදාවට ලැබෙමින් තිබූ රුපියල් බිලියන ගණනක අදායම ගෝඨා + නිශ්ශංක සමාගමට හරවා ගත් වගයි.*

ඇවන්ගාඩ් සමාගම වසරකට රුපියල් බිලියන 50කට වඩා ලාභයක් ලබා ඇති බව දැනට අනාවරණය වී ඇත. නාවික හමුදාව මගින් රාජ්‍ය භාණ්ඩාගාරයට ලබා දීමට තිබූ මෙම මුදල් ගෝඨාභයගේ මැද්හත්වීම උඩ ඇවන්ගාඩ් සමාගමට ලබාදී එම මුදල් වලින් 50%ක් පමණ ප්‍රමාණයක් ගෝඨාභය ප්‍රමුඛ රාජපක්‍ෂවරු ලබාගෙන ඇති බවට කරුණු අනාවරණය වෙමින් පවතී. ඇවන්ගාඩ් සිද්ධියේ දී ගෝඨාභය රාජපක්‍ෂ අත්අඩංගුවට ගැනීමට අවස්ථාව තිබූ නමුත් නීතිපතිවරයා හා වෙනත් අදිසි බලවේගයන් මගින් ඔහු අත්අඩංගුවට ගැනීම වැලැක්වීමට අධිකරණ නියෝගයක් ගැනීමට මෙම දූෂිතයන් සමත්වීම ජාතියේ අවාසනාවයි.

මහා පරිමාණ දූෂණ කිහිපයක් සම්බන්ධයෙන් ගෝඨාභය අත් අඩංගුවට ගැනීමට හැකි බව නියෝජ්‍ය නීතිපතිවරයා කරුණු දක්වා තිබුනද නීතිපතිවරයා ඇවන්ගාඩ් සමාගමට එරෙහිව ක්‍රියාකිරීමට ප්‍රමාණවත් සාක්ෂි නැති බව පැවසීම නිසා ගෝඨාභය අත් අඩංගුවට ගැනීම වැලැක්විණ. "මහනුවර" නමැති ඇවන්ගාඩ් සමාගමට අයත් නෞකාවේ ගිනි අවි 4000කට ආසන්න ප්‍රමාණයක් හා උණ්ඩ ලක්ෂ 10කට අධික ප්‍රමාණයක් තිබූ බව පොලිස් පරීක්ෂණ වලින් අනාවරණය විය. මෙම ගිනි අවි වලට කිසිදු බලපත්‍රයක් නොතිබූ බවද සමහර ගිනි අවි වල අනුක්‍රමික අංක මකා තිබූ අතර, පොලිසී වලට අයත් ගනි අවි ද මෙම පරීක්ෂණයේ දී සොයා ගෙන ඇත. චෝදනා හතරක් යටතේ ඇවන්ගාඩ් සමාගමට එරෙහිව නඩු පැවරිය හැකි බවට නියෝජ්‍ය නීතිපතිවරයා නිර්දේශ කර තිබුනද රාජපක්ෂ රෙජිමයේ ආවතේව කාරයින් නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිල දරන නිසා මෙම සිද්ධියට අදාල නියම නිත්‍යානුකූල පියවර ගැනීම අපහසු වී ඇත.

## නීතිපති දෙපාර්තමේන්තුව මහින්ද යටතට

ස්වාධීනව පැවති නීතිපති දෙපාර්තමේන්තුව ලංකා ඉතිහාසයේ පළමු වරට ජනාධිපති මහින්ද යටතට ගැසට් නිවේදනයක් මගින් පවරා ගන්නා ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණයට විනිසුරුවන් තේරීම

ගෝඨාභය අත් අඩංගුවට ගැනීම වැලැක්වීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසක්ම පෙත්සමක් ගොනු කිරනු ලැබූ අතර, එම පෙත්සම විභාග කිරීමට මුලින් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් තිදෙනෙකුව නම් කර තිබූ අතර, එක් විනිසුරුවරයකු එම විනිසුරු මඩුල්ලෙන් ඉල්ලා අස්විය.


ඊවා වනසුන්දර

අනතුරුව ඊවා වනසුන්දර හා සරත් ආබෘ යන විනිසුරුවන් හමුවේ එම මූලික අයිකිවාසිකම් පෙත්සම විභාග කල අතර ගෝඨාභය අත් අඩංගුවට ගැනීම වළකමින් එම විනිසුරුවන් දෙදෙනා තීන්දු කලහ.

ඊවා වනසුන්දර යනු මහින්ද රාජපක්ෂ නීති විද්‍යාලයේ ඉගෙනගන්නා කාලයේ ඔහුගේ මිතුරියක වූ අතර, ඇයට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු තනතුර පිරිනැමීම පිළිබඳව නීති ක්ෂේත්‍රයේ දැඩි විරෝධය ද මතුවිය.

ඊවා වනසුරන්දරට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු පදවිය ලැබුන අයුරු ඇය විසින්ම පුවත්පත් සාකච්ඡාවේ දී අනාවරණ වූ කරුණු පහත දක්වමු.

**මහින්ද:** ඊවා හවසට මොනවාද කරන්නේ? හවස ගෙදර යන ගමන් ටෙම්පල් ට්‍රීස් පැත්තේ එන්න.

**ඊවා:** මහින්ද රාජපක්ෂ රාජ්‍ය නායකයා නිසා එම ඉල්ලීම ඉවත දැමීමට මට නොහැකි වුනා හවස වැඩ ඇරී ගෙදර යන ගමන් අරලියගහ මන්දීරයට ගියා

**මහින්ද:** මම ඔයාව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ධූරයකට පත් කරනවා. මොකද කියන්නේ.

**ඊවා:** වෙන කුමන හෝ තීරණයක් ගන්නට පෙර මම මහත්තයාගෙන් අහනවා. මේ කාරනේ මට එහෙම කරන්න උවමනාවක් වුනේ නැහැ. මොකද මෙම ඉල්ලීම කරන්නේ රටේ රාජ්‍ය නායකයා පත්වීම් බලධාරියා මම මගේ කැමැත්ත ප්‍රකාශ කලා.

සරත් ආබෲ ගැන මෙම ග්‍රන්ථයේ සඳහන් කිරීමට තරම් වටිනාකමක් ඇති පුද්ගලයෙක් නොවේ. ඔහු මහේස්ත්‍රාත් වරයකු කාලයේ සිට මානසික ආබාධයකින් පෙළුනු ඉතාම වනචර අශීලාචාර පුද්ගලයෙකි. මහින්ද රාජපක්ෂ රටේ උත්තරීතර ආයතනය වන ශ්‍රේෂ්ඨාධිකරණට මෙවැනි අමනයින් පත්කිරීමෙන් බලාපොරොත්තු වූයේ තමාට අවනත පරිදි නඩු තීන්දු ලබා ගැනීමයි. ලංකා අධිකරණ ඉතිහාසයේ ප්‍රථම වතාවට ශ්‍රේෂ්ඨධිකරණ විනිසුරුවරයෙක් ස්ත්‍රී දූෂණයක් සම්බන්ධයෙන් විත්තිකරුවකු බවට පත්ව මහාධිකරණයේ නඩු පවරා ඇත.

මෙවැනි පසුබිමක් ඇති ඊවා වනසුන්දර හා සරත් ද ආබෲ ශ්‍රේෂ්ඨාධීකරණ විනිසුරුන් ගෝඨාභයගේ මූලික අයිතිවාසිකම් පෙත්සම විභාග කිරීමට පත් කිරීම හුදු ශ්‍රේෂ්ඨාධිකරණය හැල්ලුවට පත් කල කරුණකි. ගෝඨාභය - ලලිත් වීරතුංග - අනූෂ පැල්පිට ආදින අත්අංගුවට ගැනීම වලක්වා ඇත්තේ නීතිපතිවරයා හා ශ්‍රේෂ්ඨාධිකරණය විසිනි. නැවතත් ලිවිය යුත්තේ "මෙරට කුමට අධිකරණය නීතිය හා විනිසුරුන්" යන නන්දා මාලිනියගේ සුප්‍රසිද්ධ ගීතයයි.

ගෝඨාභයලා, මහින්දලා, නාමල්ලා, බැසිල්ලා, කෝ හොරු ඇල්ලුවද කියමින් යහපාලන ආණ්ඩුවට කෝචොක් කරමින් සිටී. සිදුවන දෑ දෙස බලන විට ඔවුන්ගේ කෝචොක් කෙරිල්ලද අසාධාරණ නොවන බව පෙනුනත් මොවුන් අන්ත දූෂිතයන් බව ජනතාවට රහසක් නොවේ.

දූෂණ පිළිබඳව පරීක්ෂා කිරීම අල්ලස් හෝ දූෂණ කොමිසම මහා පරිමාණ දූෂණ පිලිබඳ ජනාධිපති කොමිසම, මූල්‍ය වංචා පිලිබඳ පොලිස් කොමිසම ආදී කොමිෂන් සභා තිබුණද රාජපක්ෂ පුත්‍ර සහ සහෝදර සමාගම හා ඔවුන්ගේ හොරු කල්ලිය විසින් කරන ලද මහා පරිමාණ දූෂණ පිළිබඳව අනාවරණයක් කර ගැනීමට මෙතෙක් නොහැකිවීම යහපාලන ආණ්ඩුවේ ප්‍රධානීන්ට විලි ලැජ්ජාවක් නැතිව විඳ දරා ගැනීමට හැකි වුවද රාජපක්ෂ රෙජිමය පෙරලා දමා යහපාලන ආණ්ඩුව බලයට පත් කිරීම ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ ශ්‍රී ලංකාවාසි ජනතාවට නම් විඳ දරා ගත නොහැකි කාරණයකි.

*ඇවන්ට් ගාඩ් නැව "මහනුවර"*



## ගෝඨාභයගේ ලංකා හොස්පිට්ල් (ඇපලෝ) දූෂණ

ගෝඨාභය සභාපතිත්වය දරූ ලංකා හොස්පිට්ල් ආයතනයේ සිදුවී ඇති දූෂණ පිළිබඳව F.C.I.D. විසින් කොළඹ මහෝස්ත්‍රාත් උසාවියේ උසාවි අංක 03 නඩු අංක 24237/2015 යටතේ පහත සඳහන් චූදිතයන්ට විරුද්ධව නඩු පවරා ඇත.

ගෝඨාභය රාජපක්ෂ, රොෂිනි කබ්රාල්, ආචාර්ය නාලක ගොඩහේවා, දිලිත් ජයවීර, මහින්ද මඩිහහේවා, වරුණි අමුණුගම - ගෝඨාභය රාජපක්ෂගෙන් සහ පාලන නිළධාරී ආශා පිලිප්



*ගෝඨාභය රාජපක්ෂ, රොෂිනි කබ්රාල්, ආචාර්ය නාලක ගොඩහේවා, දිලිත් ජයවීර, මහින්ද මඩිහහේවා, අජිත් නිවාඩ් කබ්රාල්*

ගෙන් F.C.I.D. ප්‍රකාශ සටහන් කර ගෙන ඇත. රුපියල් මිලියන 600 (ලක්ෂ 6000) මුදලක් ගෝඨාභය ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හොරකම් කර ඇති බවට විමර්ෂන කෙරේ.

## අරංතලාවේ භික්ෂූන් වහන්සේලා 200ක් හා නිරායුධ පොලිස් නිළධාරීන් 800 - අමු අමුවේ මරා දැමූ කරුණා අම්මාන්, වනජීවී අධ්‍යන්ෂ ජනරාල් ලෙස එංගලන්තයට හොර රහසේ යැවූ ගෝඨාභය

2007 ජූනි 15 වැනි දින ජිනීවා නුවරදී මහින්ද රාජපක්ෂ ඊ.පී.ඩී.පී. නායක ඩග්ලස් දේවානන්ද සහ ඒෂියන් ට්‍රිබියුන් කර්තෘ කේ.ටී. රාජසිංහම් යන තිදෙනා පැවැත් වූ සාකච්ඡාවකදී විනයාගමූර්ති මුරලිදරන් හෙවත් කරුණාඅම්මාන් එංගලන්තයට යැවීම සඳහා මූලික සාකච්ඡාවක් පවත්වා ඇත. මුරලිදරන් හෙවත් කරුණා ගෙන් තවදුරටත් ශ්‍රී ලංකා රජයට ප්‍රයෝජනයක් නොමැති බැවින් ඔහුගෙන් ගැලවීමට හොඳම මග ඔහු කෙසේ හෝ එංගලන්තයට යවා ඔහුගේ පවුල සහ දරුවන් සමග ජීවත්වීමට සැලැස්වීම බව රාජසිංහම් මහින්ද රාජපක්ෂට යෝජනා කර ඇත.

2007 අගෝස්තු 30 දින ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් අංක D 1944260 යටතේ රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයක් **කෝකිල දුෂ්මන්ත ගුණවර්ධන** නමැත්තාට නිකුත් කර ඇත. ඔහුගේ නිල තනතුර වශයෙන් වනජීවී අධ්‍යක්ෂ ජනරාල් යනුවෙන් සඳහන් කර ඇත. පුදුම සහගත කරුණ වන්නේ එම ගමන් බලපත්‍රයේ ඡායාරූපය කරුණා අම්මාන් ගේ වීමයි. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව අයත් වූයේ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂක, නීතිය හා සාමය යන අමාත්‍යාංශයටය. එහි ලේකම් වූයේ ගෝඨාභය රාජපක්ෂ මහතාය. ආරක්ෂක ඇමති වූයේ මහින්ද රාජපක්ෂ මහතාය.

රෝහිත බෝගොල්ලාගම එවක විදේශ ඇමතිවරයා මෙම ගමන් බලපත්‍රය ව්‍යාජ ගමන් බලපත්‍රයක් බව පුන පුනා ප්‍රකාශ කලද, කෝකිල ගුණවර්ධනගේ නමින් කරුණා අම්මාන්ට ලබා දි ඇති රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර ය සියයට සියයක්ම නිවැරදි බව බ්‍රිතාන්‍ය ආගමන විගමන නිළධාරීන් සහතික කර ඇත. කෙසේ වුවද මේ වන විට ආගමන විගමන දෙපාර්තමේන්තුවේ මෙම ව්‍යාජ ගමන් බලපත්‍රය සකස් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපි ලේඛණ විනාශ කර ඇතැයි අනුමාන කල හැකිය.

වත්මන් ජනාධිපති ලේකම් පී.බී. අබේකෝන් මහතා එකල ආගමන හා විගමන පාලකවරයා විය. රජයේ ප්‍රබලයකුගේ ආධාරයක් නොමතිව රාජත්‍රාන්ත්‍රික ගමන් බලපත්‍රයක් ලබා ගැනීම ඉතාම අසීරු කාර්යයක් බව කරුණා අම්මාන් බ්‍රිතාන්‍ය පොලීසියට ප්‍රකාශ කර ඇත.

මෙම ව්‍යාජ ගමන් බලපත්‍රය ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් විදේශ කටයුතු අමාත්‍යාංශයට යවා ඇත. විදේශ කටයතු අමාත්‍යාංශය වෙනත් ගමන් බලපත්‍ර කිහිපයක් සමගින් කරුණා අම්මාන් ගේ ගමන් බලපත්‍රයද බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයට ඉදිරිපත්කර ඇත්තේ මොවුන් දේශගුණ විපර්යාස පිළිබඳ සම්මේලනයකට, බ්‍රිතාන්‍යයට යන පිරිසක් ලෙස හඳුන්වමිනි. ලංකා ආණ්ඩුවේ ඉල්ලීමක් නිසා බ්‍රිතාන්‍ය මහා කොමසාරිස් කාර්යාලය 2007 සැප්තැම්බර් 05 දින මාස 6ක සීමා රහිත වාර ගණනක් බ්‍රිතාන්‍යයට ඇතුල්විය හැකි වීසා බලපත්‍රයක් ද නිකුත් කර ඇත.

V.V.I.P කරුණා අම්මාන් 2007 සැප්තැම්බර් 17 දින ප්‍රභූ ආරක්ෂව සහිතව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල වෙත කැඳවා ගෙන යනු ලැබූ අතර, ආරක්ෂක අමාත්‍යාංශයේ ඉහල නිලධාරියකු, ගුවන් තොටුපල අධිකාරියේ අධ්‍යක්ෂවරයකු හා ජනාධිපති සම්බන්ධීකරණ ලේකම් වරයකු වූ නාලක බමුණුසිංහට හා ගුවන් තොටුපල අධිකාරියේ නියෝජ්‍ය සභාපති වූ ශාලිත විජේසුන්දරට උපදෙස් දෙමින් පවසා සිටියේ කරුණු අම්මාන්ට අවශ්‍ය සියලුම සහාය ලබා දෙන ලෙසයි. කටුනායක ගුවන් තොටුපල ප්‍රධාන ආරක්ෂක දොරටුවෙන් බාධාවකින් තොරව කරුණාඅම්මාන් රැගත් වාහනය අඳුරේම ප්‍රභූ පර්යන්තයට ලඟාවිය. එහිදී නාලක බමුණුසිංහ හා ශාලිත විජේසුන්දර කරුණා පිළිගෙන ප්‍රභූ ආරක්ෂක නිළධාරීන් සමග ප්‍රභූ පර්යන්තයේ ප්‍රභූන් සඳහා වෙන් කෙරුණු ශාලාවට ඇතුලුවිය. ප්‍රභූ පර්යන්තයේ සේවයේ යෙදී සිටින විගමන නිළධාරීන් සමග කෙටි සාකච්ඡාවක යෙදුනු ශාලිත විජේසුන්දර සැනෙකින් විගමන කටයුතු නිමවා කරුණා අම්මාන් ආරක්ෂක ප්‍රභූ මැදිරියේ අසුන් ගැන්වීය.



*භික්ෂූන්වහන්සේලා 200 නමක් කරුණා විසින් මරා දමන ලදී*

ශ්‍රී ලංකන් ගුවන් සමාගමට අයත් NL 505 දරන ගුවන් යානය දහවල් 02.15 කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලින් ලන්ඩනයේ හීත්රෝ ගුවන් තොටුපල බලා පියාසර කිරීමට සියල්ල සූදානම් වෙමින් පැවතින. සියලුම මගින් ගුවන් යානයේ අසුන් ගෙන අවසන් විය. ප.ව. 02.05ට ගුවන් යානයේ දකුණුපස දොරටුව විවෘත විය. කරුණා රැගත් මෝටර් රිය ගුවන් යානයේ පියගැට අසලටම සේන්දු විය. කරුණා පෙරටු කරගත් ශාලිත විජේසුන්දර ගුවන්



*අඹ යාළුවෝ - මිනීමරු ගෝඨ - කරුණා*

යානයේ විශේෂ පිය ගැට පෙලින් ඇතුලු වී ව්‍යාපාරික පන්තියේ අසුනක් කරුණාට පිරිනමා අංක D1944260 දරණ රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයද ඔහු අත තබා ගුවන් යානයෙන් නික්මුනි. රාජකීය සත්කාර ලබමින් කෝකිල ගුණවර්ධන හෙවත් විනයාග මූර්ති මුරලිදරන් හෙවත් කරුණා අම්මාන් ලන්ඩනයේ හිත්රෝ ගුවන් තොටුපල බලා ගමන් ඇරඹීය.

සැප්තැම්බර් 18 දින උදෑසන 9.30ට පමණ හිත්රෝ ගුවන් තොටුපලින් ලන්ඩනයට සැපත් වූ කරුණා සිය රාජතාන්ත්‍රික ගුවන් බලපත්‍රය ආගමන විගමන නිළධාරීන්ට ඉදිරිපත් කොට කිසිඳු බාධාවකින් තොරව ගුවන් තොටුපලින් නික්ම කුලී රථයකින් සිය දරු පවුල ජීවත් වූ කෙන්සින්ටන් බලා පිටත් විය. කරුණා කෙන්සින්ටන් නිවසේ සති 06ක් වාසය කළේය.

## බ්‍රිතාන්‍ය පොලිසිය කරුණා අත්අඩංගුවට ගෙන නඩු පවරන ලදී

ලන්ඩන් පොලීසියට ලද තොරතුරක් මත කරුණා ජීවත් වූ කෙන්සින්ටන් නිවස වටලා ව්‍යාජ ගමන් බලපත්‍රයක් මගින් බ්‍රිතාන්‍යයට ඇතුලුවීම පිළිබඳ චෝදනා මත අත්අඩංගුවට ගෙන කොලින්වුඩ් රැඳවුම් මධ්‍යස්ථානයට ගෙන යන ලදි. මෙහිදී තවදුරටත් ප්‍රශ්ණ කෙරුණු අතර, ඔහුගේ ගමන් බලපත්‍රය කිසිඳු ලෙසකින් කූට ලෙස සකස් කරන ලද ව්‍යාජ ගමන් බලපත්‍රයක් නොවන බව අනාවරණය විය. කරුණා කිසිඳු ව්‍යාජ / අසත්‍ය තොරතුරක් කොළඹ බ්‍රිතාන්‍යය මහ කොමසාරිස් කාර්යාලයට ඉදිරිපත් කර නොතිබුනි. මන්ද ගමන් බලපත්‍රය පිළිබඳ සියලු කටයුතු කරන ලද්දේ විදේශ කටයුතු අමාත්‍යාංශය හා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසිනි. ශ්‍රී ලංකා ආණ්ඩුවේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නියම ලෙස නිකුත් කරන ලද ගමන් බලපත්‍රය විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශය මත කොළඹ බ්‍රිතාන්‍යය මහ කොමසාරිස් කාර්යාලයට ඉදිරිපත් කොට රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයකට හිමි වීසා බලපත්‍රයක් ලබා ගෙන තිබුනි.

## කරුණා බ්‍රිතාන්‍ය පොලිසියට ගෝඨාගේ වංචාව හෙළි කරයි

මෙය බ්‍රිතාන්‍ය ආගමන විගමන නිලධාරීන්ට උභතෝකෝටික ප්‍රශ්ණයක් වූ බැවින් කරුණාගෙන් ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා හිත්රෝ පොලීසිය වෙත ඉදිරිපත් කෙරුනි. **කරුණා අම්මාන් ඔහු කෝකිල ගුණවර්ධන නොවන බවත්,** වනජීවි අධ්‍යක්ෂ ජනරාල් ලෙස දේශගුණික විපර්යාස සම්මේලනයට ඉදිරිපත් වන නියෝජිතයකු නොවන බවත්, තමා එල්.ටී.ටී.ඊ. සංවිධානයේ හිටපු නියෝජ්‍ය නායකයා බවද, හිත්රෝ පොලීසියට ප්‍රකාශ කලේය. තමා රාජ්‍ය තාන්ත්‍රික නිළධාරියකු නොවන බවද කරුණා බ්‍රිතාන්‍ය රහස් පොලිස් නිළධාරීන්ට පවසා ඇත. කරුණා ලන්ඩන් මෙට්රෝ පොලිටන් පොලීසියට කරන ලද ප්‍රකාශය බ්‍රිතාන්‍යය නීතිපති දෙපාර්තමේන්තුවේ රොබට් මෙයිකිල් විසින් කරුණාට එරෙහිව පැවති නඩුවේ දී ඉදිරිපත් කරන ලදි.

තමා ලංකාවේ සිටියදී ලන්ඩනයේ ජීවත් වන තම බිරිඳ හා දරුවන් දැකීමට අවශ්‍ය බව ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාට දැන්වූ පසු බ්‍රිතාන්‍යයට ඇතුලුවීමට අවශ්‍ය

ගමන් බලපත්‍රය ඇතුලු සියලු දෑ තමාට ලබා දෙන බව ආරක්‍ෂක ලේකම් වරයා තමන්ට පොරොන්දු වූ බව කරුණා ප්‍රකාශ කර ඇත.



Kill him down

මෙම ගමන් බලපත්‍රය සකස් කිරීම සඳහා තමන් කිසිඳු දායකත්වයක් නොදුන් බවත් අවශ්‍ය සියලුම ලියවිලි ආරක්‍ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සපයා ගුවන් යානයේ දී මෙම රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රය තමන්ට ලබා දුන් බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

තමා බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයට නොගිය බවත් ගමන් බලපත්‍රය ලබා ගැනීමේ දී ලංකාණ්ඩුවේ උපදෙස් අනුව ක්‍රියා කල බව පැවසූ කරුණා තමා වනජීවී සංරක්‍ෂණ දෙපාර්තමේන්තුවේ සම්මේලනයක් සඳහා බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයෙන් වීසා අයදුම් නොකල බවද වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

මෙම කරුණු සියල්ල සලකා බලන කල එවකට ආරක්‍ෂක ලේකම් ධූරය දැරූ ගෝඨාභය රාජපක්‍ෂ කූට ලේඛණයක් සකස් කර ජාතිද්‍රෝහී මිනීමරු කරුණා මහා බ්‍රිතාන්‍යයට යැවීමට එක එල්ලේම උපකාර කර ඇති බව පැහැදිලිවේ. මෙම රාජද්‍රෝහියාට නිසි දඬුවම් ලබා නොදීම මෙරට අධිකරණයට කරන ලද අපහාසයක් වන අතර, රජයේ වගකීමක් පැහැර හැරීමක් වශයෙන් ද හැඳින්විය හැකිය.

ගෝඨා ව්‍යාජ පාස්පෝට් එකක් නිකුත් කරා පමණක් නොව වනජීවී අධ්‍යක්‍ෂ ජනරාල් ලෙස ව්‍යාජ පුද්ගලයකුද නම් කරන ලදී.

ගෝඨා හිරේ



# 8

# රාජපක්ෂ මාෆියාව

2005 ජනාධිපති අපේක්ෂක ධූරය මහින්දට ලැබීමත් සමගම යුධ සමයේ ඇමෙරිකාවට පලා ගොස් සිටි ගෝඨාභය හා බැසිල් ජනාධිපතිවරණ කටයුතු සඳහා ලංකාවට පැමිණියහ. 2005 ජනාධිපතිවරණය ජයග්‍රහණය කිරීමෙන් අනතුරුව ගෝඨාභය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාශයේ ලේකම් ධූරයටද, බැසිල් ජනාධිපති උපදේශක ලෙසද පත් කර ගති. වැඩිමහල් සොයුරු චමල් රාජපක්ෂටද වරාය ඇමති ධූරය ලබාදුන් අතර, රජයේ ඉතා ඉහළ තනතුර රාජපක්ෂවරුන්ගේ බූදලයක් බවට පත්විය.



*නිශාන්ත වික්‍රමසිංහ එයාර් ලංකා සුරූපිකාවක් සමග*

රජයේ ඉතා වැදගත් ආයතන වන වරාය, ගුවන් තොටුපල, එයාර් ලංකා සමාගම, තෙල්, විදුලිබල, මහාමාර්ග ආදි සියලුම ආයතන රාජපක්ෂවරුන් ගේ පාලනයට නතු කරන ලදි. ජනාධිපති ලේකම් තනතුරට ලලිත් වීරතුංග වන මහින්දගේ සුචව කීකරු ගෝලයකු පත් කරගත් අතර□ මුදල් ඇමති වූ මහින්ද ගේ ලේකම් ධූරයට පී.බී. ජයසුන්දර පත් කර ගති.

මේ අයුරින් රජයේ වැදගත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු බැංකු, රක්ෂණ, රේගුව ඇතුලු ආදායම් උපයන සියලුම වැදගත් ආයතන විධායක ජනාධිපති මහින්ද යටතේ තබා ගති.

එයාර් ලංකා සමාගමේ සභාපති ධූරයට අ.පො.ස.(සා.පොල) අසමත් මහින්දගේ බිරියගේ සහෝදරයා වූ නිශාන්ත වික්‍රමසිංහ පත් කරනු ලැබීය. තෙල් සංස්ථාවේ සභාපති ධූරය ශිරන්ති රාජපක්ෂ ගේ ලඟම ඥාතියෙකු වු අසන්ත ද මෙල් නමැත්තා පත් කරන ලදි.

## 2005 ජනාධිපති අපේක්ෂක ධූරය ලබා ගැනීම

චන්ද්‍රිකා කුමාරතුංග මැතිණිය ගේ දේශපාලන ආගමනයට මුල සිටම විරුද්ධ වෙමින් ඇයට එරෙහිව කුමන්ත්‍රණ දියත් කරමින් ජනාධිපති අපේක්ෂක ධූරය කෙසේ හෝ ලබා ගත් මහින්ද එජාපයට එරෙහිව ප්‍රබල සටනක් දිය යුතු බව අවබෝධ කර ගැනීමට තරම් තීක්ෂණ බුද්ධියක් තිබුනි. උතුරේ ද්‍රවිඩ ඡන්ද එජාපයට ලැබීම වැලැක්වීමට මහින්ද - බැසිල් - ටිරාන් සමග එකතු වී ගැසූ අවසාන තුරුම්පුව බලාපොරොත්තු වූවා සේම එය මහින්ද ගේ වාසියට ද හේතු විය.

## ජනපති විමට පෙරම දූෂිතයකු වූ හැටි

2004 සුනාමි විනාශය සිදුවූ අවස්ථාවේ දී සුනාමි ආධාර වශයෙන් ලැබුනු රුපියල් මිලියන 800ක මුදල් මහින්දගේ පුද්ගලික බැංකු ගිනුමට බැර කරමින් මහා පරිමාණ දූෂණ කරන ආකාරය පිලිබඳව මනා අවබෝධයක් ලබා ගත් මහින්ද එම අත්දැකීම් උපයෝගී කරගෙන සංවර්ධනයේ මුවාවෙන් ලබාගත් රුපියල් බිලියන ගණනක මුදල් ආධාර රාජපක්ෂ පවුල හා ඔහුගේ ඥාති සමූහයා විසින් මංකොල්ල කෑම කිසිඳු ලැජ්ජාවකින් තොරව කරන ලද බව පරීක්ෂණ වලින් අනාවරණය වෙමින් පවතී.

## 2005 ජනාධිපතිවරණය

චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මියට දැඩි ලෙස බලපෑම් එල්ල කොට 2005 ජනාධිපති අපේක්ෂක ධූරය ලබා ගත් මහින්ද අනුර බණ්ඩාරනායක මහතාට ඇගමැති ධූරය ලබා දෙන බවට මහින්ද සහතික වූ නමුත් පසුව එම පොරොන්දුව අමු අමුවේම කඩා රත්නසිරි වික්‍රමනායක මහතා අගමැති ධූරයට පත් කලේය.



ටිරාන් අලස්

1989 ලංකාවෙන් පලා ගොස් අවුරුදු 15ක් පමණ අමෙරිකාවේ පදිංචි ව සිටි ගෝඨාභය හා බැසිල් ලංකාවට ගෙන්වා ගත් මහින්ද ජනාධිපතිවරණය මෙහෙයවීමට ඔවුනට බාර දුනි. කුප්‍රකට ඩීල් කරුවකු වන බැසිල්, කොටි නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් සමග රහස් ගිවිසුමක් ඇති කර ගෙන ටිරාන් අලස් සමග සම්බන්ධ වී රුපියල් මිලියන 800ක මුදලක් එල්.ටී.ටී.ඊ. සංවිධානයට ගෙවා 2005 ජනාධිපතිවරණයේ දී උතුරේ ජනතාවට ඡන්දය ප්‍රකාශ කිරීම වලක්වනු ලැබීය.

එ.ජා.ප. ජනාධිපති අපේක්ෂක රනිල් වික්‍රමසිංහට උතුරෙන් ලැබිය යුතු ඡන්ද ලක්ෂ 5ක් පමණ අහිමි කිරීමට ටිරාන් කුමන්ත්‍රණය සමත්විය. මහින්ද වැඩි ඡන්ද 180,000 පමණ ජනාධිපතිවරණය ජයග්‍රහණය කලේය.

## මහින්ද චින්තනය

බණ්ඩාරනායක චින්තයෙන් පසුව ලංකා දේශපාලන ඉතිහාසයේ දේශපාලන පක්ෂ නායකයකුගේ චින්තනයක් දක්නට ලැබෙන්නේ 2005 මහින්ද චින්තනය - දේශපාලන පක්ෂයක දර්ශනය ලෙස හඳුන්වාදීමෙන් අනතුරුවය. ඩී.එස්. සේනානායක, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක, ජේ.ආර්. ජයවර්ධන වැනි දේශපාලන යෝධයන් අභියස අඟුටුමිට්ටකු වන "මහින්ද රාජපක්ෂ" වැනි අඥබාලයකු දේශපාලන චින්තකයකු වශයෙන් හැඳින්වීමට පොත්පත් ලියූ කුසල්, කබ්රාල්, ජී.එල්. වැනි වන්දි භට්ටයින් ජාතියෙන් සමාව ගත යුතුව ඇත.

ශ්‍රී.ල.නි.ප. ප්‍රතිපත්ති පසෙක තබා රජයේ සියලුම ව්‍යාපෘති "මහින්ද චින්තනයේ" ප්‍රතිපත්ති ලෙස හුවා දැක්වීම තුලින් මාඕසේතුං, කිම් ඉල් සුං වැනි ඒකාධිපති පාලකයින් අනුගමනය කල දේශපාලන ක්‍රියා මාර්ග අනුගමනය කලේය. මෙ සියුම් කූඨ දේශපාලන ක්‍රියා මාර්ග තුලින් රාජපක්ෂ පරපුර ලංකා දේශපාලන ඉතිහාසයේ අමරණීය කිරීමට මහින්ද උත්සාහ කල බව පෙනේ.

2010 ජනාධිපතිවරණයේ දී ද "මහින්ද චින්තන" වැඩ පිළිවෙල රජයේ දේශපාලන ප්‍රතිපත්තිය ලෙස ඉදිරිපත් කිරීමෙන් ශ්‍රී.ල.නි.ප. දේශපාලන දර්ශණය ඉස්මතු කර ලීමට ක්‍රියා කලේය. මෙම සියලු ක්‍රියාමාර්ග තුලින් මහින්ද අපේක්ෂා කලේ රාජපක්ෂ පරපුර ලංකා දේශපාලන ක්ෂේත්‍රයේ අමරණීය පරපුරක් ලෙස වර්ධනය කිරීමයි. ශ්‍රී.ල.නි.ප. කිසිඳු ජ්‍යෙෂ්ඨ සාමාජිකයකුට ජනපති

තනතුර සඳහා ඉදිරිපත්වීමට තිබූ සියලු ඉඩකඩ ඇහිරූ මහින්ද 18 වැනි ව්‍යවස්ථාව තුලින් ජීවිතාන්තය දක්වා ජනාධිපති තනතුර දැරීමට අවශ්‍ය නීතිමය තත්වය උදාකර ගත්තේය. 2010 ඉතාම දූෂිත ජනාධිපතිවරණයක් තුලින් සරත් ෆොන්සේකා ලැබූ ජයග්‍රහණය මංකොල්ල කෑ මහින්ද සිය ප්‍රතිවාදියා වූ ෆොන්සේකාට එරෙහිව ඉතාම නිහීන ලෙස සිය බලය පාවිච්චි කොට අසත්‍ය චෝදනා යොමුකොට ඔහු හිර අඩස්සියට පත් කලේය.

බලයට පත් වූ වහාම පාර්ලිමේන්තුවේ 2/3ක බලය පාවිච්චි කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කර ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයකුට තරඟ කිරීමේ වාර දෙක වෙනස් කොට ඕනෑම වාර ගණනක් තරඟ කිරීමේ අවස්ථාව උදා කර ගති.

රාජපක්ෂ ගේ වහලුන් වශයෙන් සිටි මැති ඇමතියන් මෙම ව්‍යවස්ථාව සංශෝධනය අනුමත කිරීමෙන් පැහැදිලි වන්නේ මහින්ද ගේ මතයට එරෙහිව සිය අයිතිවාසිකම් දිනා ගැනීමට එකදු සන්ධාන මන්ත්‍රීවරයකුට අවස්ථාව ලබා නොදුන් බවයි.

සන්ධාන මන්ත්‍රීවරුන්ට දූෂණ ක්‍රියා මගින් ඕනෑතරම් මුදල් උපයා ගැනීමට අවස්ථාව සලසාදීම තුලින් මහින්ද සන්ධානයේ මන්ත්‍රීන් වහලුන් ලෙස තබා ගැනීමට සමත්විය.

## නාමල්ට ඔටුන් පැළඳවීම

තුන්වැනි වරටත් ජනාධිපති ධූරය ලබාගෙන සිය වැඩිමහල් පුත් නාමල් රාජපක්ෂට ජනාධිපති ධූරය ලබාදීම මහින්දගේ පරම චේතනාව විය. සිය පක්ෂයේ බොහෝ දෙනාගේ විරෝධය නොතකා ජනාධිපති ආයු කාලය වසර දෙකක් තිබියදී රාජකීය දෛවඥ සුමනදාස අබේවික්‍රමගේ උපදෙස් අනුව 2015 ජනාධිපතිවරණය පැවැත්වූයේ 2015 සිට 2022 දක්වා ජනාධිපති ධූරය දරා ඉක්බිතිව සිය දෙවු පුත් නාමල් රාජපක්ෂට ඔටුනු භාරදීමේ අපේක්ෂාවෙනි.

## 2015 ජනාධිපතිවරණය

නිදහස් ලංකාවේ පැවති ඉතාමත්ම තීරණාත්මක මැතිවරණය 2015 ජනපතිවරණය ලෙස ඉතිහාසයට එක් වී ඇත. මහින්දට එරෙහිව එක්සත් ජාතික පක්ෂ රනිල් වික්‍රමසිංහ ඉදිරිපත් වනු ඇති බව මහින්දගේ ඒකාන්ත විශ්වාසය විය. ග්‍රාමීය මට්ටමේ දැවැන්ත දේශපාලන සංවිධාන ව්‍යුහයක් ගොඩ නගා සිටි මහින්ද උතුරේ හැර සියලුම පලාත් සභා, පලාත් පාලන ආයතන, ප්‍රාදේශීය සභාවල සම්පූර්ණ බලය අල්ලා ගෙන තිබුනි. මැති ඇමතිවරුන්ට රිසිසේ දූෂණයේ යෙදෙමින් මුදල් ඉපැයීමට අවස්ථාව ලබා දී තිබූ සේම පලාත් සභාවල මැති ඇමතිවරුන්ට, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට, පළාත් පාලන ආයතනවල නගරාධිපතිවරුන්ට, හා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට රිසිසේ දූෂණ වංචා වල යෙදෙමින් මුදල් සහ දේපල රැස්කර ගැනීමට මහින්ද අවස්ථාව විවර කර දී තිබුනි.



*සැබෑ මහින්ද...*

ග්‍රාම නිලධාරි වරයාගේ සිට ජනාධිපතිවරයා දක්වා තිබූ දේශපාලන බලය මුදල් බලය පොලිස් බලය නිළධාරී බලය ඉක්මවා ජනතාවගේ අයිතීන් ක්‍රියාත්මක කිරීමට කිසිඳු ඉඩකඩක් ලැබුනේ නැත.

## පොදු අපේක්ෂයකු ඉදිරිපත් කිරීම

මහින්දගේ ඒකාධිපති පවුල් පාලන ක්‍රමයට එරෙහිව විශාල මහජන විරෝධයක් තිබුනද සියලු රාජ්‍ය මාධ්‍ය හා කිහිපයක් හැරණවිට සියලු පෞද්ගලික මාධ්‍ය ආයතනද රාජපක්ෂවරුන් විසින් දේශපාලන බලය හා මුදල් බලය පාවිච්චි කොට සිය අණසකට යටත් කරගෙන තිබුනි.

පැය 24 පුරාම රාජපක්ෂ වන්දනාවේ යෙදුනු මාධ්‍ය මහින්ද යුද්ධය නිමා කොට රට එක්සේසත් කල මහා විජයබාහු රජුටත් වඩා ශ්‍රේෂ්ඨ නරපතියකු බවට ජනතාව අතර ප්‍රබල මතයක් ඉදිරිපත් කලහ. රාජ්‍ය බලය, මුදල් බලය, පොලිස් බලය හමුවේ රනිල් වික්‍රමසිංහ පහසුවෙන් පරාජය කල හැකි බව මහින්ද සහ ඔහුගේ පවුල් උදවියත් රාජපක්ෂ වහලුන්ද තරයේම විශ්වාස කලහ.

ලංකාවේ ජනතාවගේ වාසනාවට ප්‍රජාතන්ත්‍රවාදයේ අරුණලු නැවත ලක් දෙරණ මත පතුරුවාලීමට දේශයේ පිනට පහල වූ ගරුතර මාදුළුවාවේ සෝභිත හිමියන් ප්‍රමුඛ ජාති හිතෛෂී දේශමාමක දේශපාලන නායකයින් වන රනිල් වික්‍රමසිංහ, චන්ද්‍රිකා කුමාරතුංග, සහ ප්‍රසිද්ධ සිවිල් ක්‍රියාකාරීන් රැසකගේ ඉතාම ඥාණාන්විත තීරණයක් අනුව ශ්‍රී.ල.නි.පයේ මහ ලේකම් මෛත්‍රීපාල සිරිසේන මහතා පොදු අපේක්ෂකයා වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබිණ.

## පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන

2014 නොවැම්බර් 21 දින ලංකා දේශපාලන ඉතිහාසයේ අමරණීය දිනයක් වශයෙන් සඳහන් කල හැකිය. ශ්‍රී.ල.නි.පයේ මහලේකම් වූ මෛත්‍රීපාල සිරිසේන මහතා 2015 ජනාධිපතිවරණයේ පොදු අපේක්ෂයා වශයෙන් ඉදිරිපත් වන බව කොළඹ නව නගර ශාලාවේදී ප්‍රකාශයට පත් කරනු ලැබීය.

මහින්ද රාජපක්ෂගේ සියලු අනාගත අපේක්ෂාවන් සුනුවිසුනු කරමින් මෛත්‍රීපාල සිරිසේන මහතා කල ජීවිත පරිත්‍යාගය ලංකා ඉතිහාසයේ කිසිදිනක නොමැකෙන සිද්ධියක් ලෙසද සඳහන් කල යුතුමය.

## දින 40 පෙරළිය

මහින්ද රාජපක්ෂ පොදු අපේක්ෂකයා මෛත්‍රීපාල සිරිසේන මහතාට එරෙහිව යෙදවිය හැකි සියලුම බලවේග වන දේශපාලන යන්ත්‍රය, පොලීසිය, හමුදාව, රාජ්‍ය නිළධාරීන්, රාජ්‍ය සම්පත් සියලුම ජනමාධ්‍ය ඉතා නින්දිත ලෙස යොදා ගැනිණ.

මෛත්‍රීපාල මහතාට එරෙහිව රාජ්‍ය ජනමාධ්‍ය සහ පෞද්ගලික ජනමාධ්‍ය මගින් ඉතා නින්දිත ලෙස මඩ ප්‍රචාර දියත් කෙරිණ. රැස්වීම් පැවැත්වීම සඳහා කිසිඳු ප්‍රසිද්ධ පිට්ටනියක් ලබා ගැනීමට නොහැකි විය. රැස්වීම් සංවිධානය කරන ලද පුද්ගලයින් රාශියක් වෙඩි තබා ඝාතනය කල අතර, වේදිකා ගිනි තබා විනාශ කරන ලදි.

රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් එක්සත් ජාතික පක්ෂය, මෛත්‍රීපාල මහතාගේ සියලු ප්‍රචාරක රැස්වීම් සංවිධානය කරන ලදි. පොදු අපේක්ෂක සටනට ජීවවායුව ලබා දුන් අපවත් වී වදාල ගරු මාදුළුවාවේ සෝභිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රමුඛ සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරය මැතිවරණ ව්‍යාපාරයේ කැපී පෙනෙන වැඩ කොටසක් ඉටු කලහ. රාජ්‍ය පවුල් පාලනය පලවා හැරීමට පොදු අපේක්ෂකයකු ඉදිරිපත් කිරීමට රනිල් වික්‍රමසිංහ මහතා දැක්වූ පරිත්‍යාගශීලි භාවයද ඉතා ගෞරවයෙන් යුතුව සටහන් කල යුතුය.

# 9

# මහින්ද රාජපක්ෂ ලංකාවේ දේශපාලන සංස්කෘතිය විනාශ කල හැටි

1948 නිදහස ලැබීමෙන් පසුව බිහිවූ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය තුල අප රට පාලනය කල දේශපාලන නායකයින් මුලු ආසියාවටම ආදර්ශයක් වන සේ රාජ්‍ය පාලන කටයුතු ගෙන ගිය බව බොහෝ දෙනා පිළිගන්නා කරුණකි.

2005 මහින්ද රාජපක්ෂ ජනාධිපති වීමෙන් අනතුරුව මීට පෙර රාජ්‍ය නායකයින් අනුගමනය කල දේශපාලන සම්ප්‍රදායන් සම්පූර්ණයෙන් බැහැර වීමක් දක්නට ලැබෙයි. "මහින්ද චින්තනය" නමින් අමුතු මාදිලියේ දේශපාලන සංස්කෘතියක් බිහි කිරීමට උත්සාහ කිරීම විශේෂ ලක්ෂණයක් විය. මීට පෙර ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, ජේ.ආර්. ජයවර්ධන, ආර්.ප්‍රේමදාස, චන්ද්‍රිකා කුමාරතුංග ආදී දේශපාලන නායකයන් රට පාලනය කල නමුදු ඔවුන්ගේ නමින් චින්තන බිහි කිරීමට උත්සාහ කල බවක් නොපෙනේ.

මහින්ද රාජපක්ෂ මෙම සියලු වැදගත් නායකයින් අභිබවා ඔහුගේ නමින් චින්තනයක් බිහි කිරීම මෙම සියවසේ සිදුවූ හාස්‍යජනකම දේශපාලන සිදුවීමකි. අධික හීනමානයකින් පෙළුනු මහින්ද මේ රටේ බිහිවූ සියලුම ශ්‍රේෂ්ඨ ජන නායකයින්ට වඩා කැපී පෙනීමේ ආශාවකින් පෙළුනු පුද්ගලයෙකි. මෙම හීනමානය කෙතරම් උග්‍ර වී තිබුනේදයත් රජයේ සියලුම ව්‍යාපෘති "මහින්ද චින්තනයෙන්" උපන් සංකල්පයන් ලෙස සමාජගත කිරීමට ඔහු අපමණ වෙහෙස දරයි. මහින්දගේ පලමු මැතිවරණ ප්‍රකාශනය මහින්ද චින්තනය නමින් හැඳින් වූ අතර, දෙවන ජනාධිපතිවරණය මහින්ද චින්තන ඉදිරි දැක්ම යනුවෙන් නම් කෙරින.



බොදුබල සේනාවේ චීවරධාරී ඥානසාර

මහින්ද රාජපක්ෂ ඔහුගේ චන්දිහට්ටයින් වන ඩලස් අලහප්පෙරුම, විමල් වීරවංශ, දි.මු. ජයරත්න, නිමල් සිරිපාල ද සිල්වා, රෝහිත අබේගුණවර්ධන, මහින්දානන්ද අලුත්ගමගේ, පවිත්‍රා වන්නිආරච්චි, මර්වින් සිල්වා, දිනේෂ් ගුණවර්ධන ආදීන් ලවා මහින්ද චින්තනය තුලින් ශ්‍රී ලංකාවේ සමාජ අර්ථික දේශපාලනික, අධ්‍යාත්මික පෙරලියක් ඇති කරන ලද බවට මිත්‍යාමතයක් සමාජ ගත කිරීමට දැඩි ප්‍රයත්නයක යෙදුනේය.

මෙම ගිහි චන්දිහට්ට භාවයන්ට අමතරව බෞද්ධ භික්ෂූන් යැයි කියා ගන්නා දේශපාලන අඳ බාල භික්ෂූන්වන මුරුත්තෙට්ටුවේ ආනන්ද, බෙංගමුවේ නාලක, ඇල්ලේ ගුණවංශ, කඹුරුගමුවේ වජිර, මැදගොඩ අභයතිස්ස, ඉත්තැකන්දේ ධම්මාලංකාර, බොදුබල සේනාවේ ගලගෙ

ාඩඅත්තේ ඥාණසාර, වල්පොල පියනන්ද, වටිනාපහ සෝමානන්ද, ගැටමාන්නේ ගුණානන්ද යන මහින්දගේ දේශපාලන ගිහි චීවරධාරීන් පිරිසක්ද මහින්ද චින්තනය කර පින්නාගෙන රට වටා යමින් රට බේරාගත් නායකයා මහින්ද රාජපක්‍ෂ බවට ජනමතයක් ගොඩනැගීමට කටයුතු කලහ. මෙම සියලුම චීවරධාරීන්ට ගොඩනැගිලි, විදේශ චාරිකා මහජන මුදලින් ලබාදුනි. සමහර භික්‍ෂූන්ට ගුවන්විදුලි නාලිකා හා රූපවාහිනී නාලිකා බලපත්‍ර නොමිලයේ ලබාදීමට තරම් මහින්ද පරිත්‍යාගශීලි විය. රජයේ මුදල් කෝටි ගණන් වැය කරමින් මෙම චීවරධාරීන් ලවා ලංකාව පුරාම පන්සල් වෙහෙර විහාරවල පින්කම් බෝධි පූජා උත්සව සංවිධානය කරමින් මහින්දගේ ප්‍රාතිහාර්යය සිංහල බෞද්ධ ජනතාව අතර තහවුරු කිරීමට ඉතා උනන්දුවෙන් කටයුතු කලහ. මහින්ද බෞද්ධ භික්‍ෂූන් යොදා ගත්තේ ධාර්මික සමාජයක් ඇති කිරීමට නොව, තමාගේ බලපරාක්‍රමය තහවුරු කර ගැනීමටය.

තමන්ගේ පාදඩ දේශපාලනය වර්ධනය කර ගැනීමට කලේ සිටි අලි පැටවුන් නීති විරෝධීව අල්ලා එම අලි ඇතුන් සන්නස් මගින් පන්සල් වලට ලබා දුන් අතර, ඊට අමතරව තමන්ගේ සහෝදරයන්ට හා හිතවතුන්ටද අලි පැටවුන් ලබාදී ඇති බව නව රජය බලයට පත්වීමෙන් පසුව කරන ලද පරීක්‍ෂණ වලදී අනාවරණය වී ඇත.

## පාදඩ දේශපාලනය පාර්ලිමේන්තු ගත කිරීම

2010 පැවති ජනාධිපතිවරණය ඉතාම දූෂිත ආකාරයෙන් පවත්වා නිකුත් කරන ලද ප්‍රතිඵලයක් මගින් දෙවන වරටත් ජනාධිපති ධූරය ලබා ගත් මහින්ද ඔහුගේ තෙවන අදියර ක්‍රියාත්මක කලේය. එ.ජා.ප., ජ.වි.පෙ. සහ අනෙකුත් පක්‍ෂවලට අල්ලස් හා ඇමතිකම් ප්‍රදානය කර පාර්ලිමේන්තුවේ දි 2/3 ක බලයක් ඇති කර ගැනීම මහින්ද ගේ පලමු ඉලක්කය විය. 2010 ජනාධිපති ධූරයට පත්වී මාසයක් යන්නට මත්තෙන් 18 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කර ගත්තේ ජනාධිපති ධූරය සඳහා තරග කිරීමට තිබූ වාර දෙක අහෝසි කොට ඕනෑම වාර ගණනක් ජනාධිපති තරගයට ඉදිරිපත්වීමට හැකි පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කර ගති. එපමණ නොව 17 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුලින් පිහිටුවා තිබූ සියලුම කොමිෂන් සභා අහෝසි කොට, තමාට අභිමත පරිදි කොමිෂන් සභා පිහිටුවා ගැනීමට හැකි වන සේ නීති සම්පාදනය කරන ලදි. ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට නීතිපති දෙපාර්තමේන්තුව ජනාධිපතිවරයා යටතට පත් කරනු ලැබීය. අග විනිසුරු ධූරයට ජනාධිපතිවරයාගේ අභිමතය අනුව පත් කිරීමේ බලය තමා වෙත පවරා ගත් මහින්ද සියලුම අණපනත්, නීති රීති තමන්ට අවශ්‍ය පරිදි පනවා, එය තමන්ගේ දේශපාලන අධිකාරී බලය වර්ධනය කිරීම සඳහා යොදා ගති.

ව්‍යවස්ථාදායකයා සහ අධිකරණය යන ආයතන දෙකම හුදෙක් මහින්ද රාජපක්‍ෂගේ අභිමතය අනුව පමණක් ක්‍රියා කරන ආයතන බවට පත්විය. සියයකට අධික කැබිනට් මණ්ඩලයක් පත් කර ගත් මහින්ද සිය මැති ඇමතිට ජාතික ධනය රිසිසේ කොල්ල කෑමට හැකි වන පරිදි පරිපාලන රටාවක් ඇති කලේය.

ජාතික අයවැයෙන් සියයට 70%ක් පමණ මහින්ද චමල්, බැසිල්, ගෝඨාභය යන තම සහෝදරයන් ගේ අභිමතය පරිදි ආදායම් ලබන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සංස්ථා ආදිය ලබාදී ඉතිරි 30% තමන්ට ඉතාම සමීප ඇමතිවරුන්ට බෙදා දුනි.



# 10

# මහින්ද රාජපක්ෂගේ දූෂිත මැති ඇමතිවරු සහ දිස්ත්‍රික් මට්ටමේ දේශපාලන මැරයින්

## බැසිල් රාජපක්ෂ

මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ සිටි ඉතාම දූෂිත ඇමතිවරයා වශයෙන් බැසිල් රාජපක්ෂ හැඳින්විය හැකියි ආර්ථික සංවර්ධන ඇමතිවරයා වශයෙන් ජාතික අයවැයෙන් 40% පමණ ප්‍රමාණයක් මෙහෙයවීමේ පූර්ණ බලතල මහින්ද රාජපක්ෂ විසින් සිය සොහොයුරු බැසිල් රාජපක්ෂ වෙත නීත්‍යානුකූලව ලබා දී තිබුනී රුපියල් මිලියන 6500ක් අවභාවිතය කිරිම සම්බන්ධයෙන් රක්ෂිත බන්ධනාගාර ගත විය.

උතුරු වසන්තය ඇතුලු මගනැගුම, දිවි නැගුම ආදි මහා පරිමාන ව්‍යාපෘති සියල්ලෙහිම වැය කර ඇති මුදල් වලින් 50% ට අධික ප්‍රමාණයක් බැසිල් සහ ඔවුන්ගේ අන්තේවාසික නිළධාරීන් හොරකම් කර ඇති බව දූනට කර ඇති විමර්ෂන වලින් අනාවරණය වී ඇත.

## ජොන්ස්ටන් ප්‍රනාන්දු

1991 එ.ජා.ප. කුරුණෑගල නගර සභා මන්ත්‍රීවරයකු වශයෙන් දේශපාලනය ආරම්භ කල ජොන්ස්ටන් ක්ෂේවියර් ප්‍රනාන්දු 2000 වර්ෂයේ දි කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ප්‍රථම වරට පාර්ලිමේන්තුවට තේරි පත් විය. 2001 වසරේ ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමති ධූරයට ද, 2011 සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ ඇමති වශයෙන්ද කටයුතු කලේය.



*ජොනී*

2011 මහින්ද රාජපක්ෂ ගේ ආණ්ඩුව පත්වීමට පෙර කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වූයේ එ.ජා.ප. යෙනි. මහින්ද රාජපක්ෂ ඝාතනය කිරීමට කුමන්ත්‍රණය කිරීමේ චෝදනාවට ලක්වුවද සරත් ෆොන්සේකාට එරෙහිව සාක්ෂිදීම නිසා මහින්ද රාජපක්ෂ ජොන්ස්ටන්ට සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ ඇමති ධූරය පිරිනැමීය.

මෙම කාලය තුලදි වෙළඳ අමාත්‍යාංශයේ සියලුම ගනුදෙනු වලදී ඉතා අධික ලෙස කොමිස් මුදල් ලබාගෙන දිවයින පුරා සුරාසැල් සියයකට අධික

ප්‍රමාණයක් විවෘත කර මහින්දගේ මතට තිත වැඩසටහනට සහය ලබාදුනි. එතනෝල් නීති විරෝධීව ආනයනය කොට ලංකාව පුරා බෙදාහැරීමේ ප්‍රධාන තැරැව්කරුවා වූයේ ජොන්ස්ටන් ප්‍රනාන්දුය. අරලියගහ මැදුරට මාසිකව රුපියල් මිලියන 100ක මුදලක් ප්‍රදානය කල බවටද තොරතුරු හෙලි වි ඇත.

2015 ජනාධිපතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා ලංකා සතොස ආයතනයෙන් රුපියල් ලක්‍ෂ 50ක භාණ්ඩ ලබා ගෙන මුදල් නොගෙවීම නිසා රක්ෂිත බන්ධනාගාර ගතව සිට දැනට ඇප මත මුදා හැර ඇත. මීට අමතරව 2010 - 2014 දක්වා වත්කම් බැරකම් හෙලි නොකිරීම සම්බන්ධයෙන් ද අල්ලස් හා දූෂණ කොමිසම මගින් ජොන්ස්ටන්ට එරෙහිව නඩු පවරා ඇත. මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුවේ සිටි අන්ත දූෂිත හා වනචර ඇමතිවරයෙක් වූ ජොන්ස්ටන් ලංකාවේ ඉතා සුප්‍රසිද්ධ ගායිකාවක සමග ප්‍රසිද්ධ සම්බන්ධයක්ද පවත්වා ගෙන යයි.

වී එෆ්.එම්. ගුවන්විදුලි නාලිකාවේ හිමිකරු මෙන්ම වයඹ පලාතේ රටබීමහල් ඇතුලු මත්පැන් නිෂ්පාදනාගාරයක හා තවත් ව්‍යාපාර රැසක හිමිකරු වශයෙන් ජොන්ස්ටන් ප්‍රනාන්දු මන්ත්‍රීවරයා හැඳින්වේ.

මෙම සියලු අයථා මුදල් රැස් කිරීමට ප්‍රධාන වශයෙන් උපකාර කර ඇත්තේ මහින්ද රාජපක්ෂ මහතාය.

## කුමාර වෙල්ගම

2000 දී ප්‍රථම වරට පාර්ලිමේන්තුවට තේරී පත් වූ කුමාර වෙල්ගම රාජපක්ෂවරුන්ගේ සුප්‍රසිද්ධ වහලෙකි. රාජපක්ෂවරුන් විසින් කරන ලද මිනීමැරුම් දූෂණ, වංචා සියල්ල හමුවේ මහින්ද රාජපක්ෂ නැවත වරක් දේශපාලන කරලියේ ඔසවා තැබීමට වලිකන ප්‍රධාන පුද්ගලයෙකි.


*වෙල්ගම*

දූෂණ ක්‍රියා රාශියකට හසු වී ඇති බැවින් රාජපක්ෂවරුන් නැවත බලයට ගෙන ඒම මගින් පමණක් තම ගැලවීම ලඟා කර ගැනීමට හැකි බව දන්නා කුමාර වෙල්ගම ඉතා ප්‍රසිද්ධියේම මෛත්‍රී - රනිල් ආණ්ඩුවට එරෙහිව ක්‍රියාකරයි් පොලිස් දූෂණ මර්ධන අංශය මගින් මොහුට විරුද්ධව ඇති පැමිණිලි පිළිබඳව විමර්ශණ ආරම්භ කර ඇත.

ගමනාගමන ඇමති වශයෙන් සිටි කාලයේදී ලංගම බස් රථ සඳහා අමතර කොටස් ගෙන්වීමේදී රුපියල් බිලියන ගණනක දූෂණ සිදුවී ඇති බව මෑතකදී අනාවරණය විය. ලංකාවේ විශාලම අල්ලස වශයෙන් ඉතිහාස ගතවී ඇති රුපියල් මිලියන 150 රේගු දෙපාර්තමේන්තුවේ අල්ලස් සිද්ධිය සම්බන්ධයෙන්ද කුමාර වෙල්ගම චෝදනා එල්ල වී ඇත.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය සභාපති පදවියක් නිර්මාණය කර තමාගේ ඥාති සහෝදරයකු එම තනතුරට පත් කිරීම සම්බන්ධයෙන් කුමාර වෙල්ගමට එරෙහිව අල්ලස් හා දූෂණ කොමිසම විසින් නඩු පවරා ඇත.

ලංකා නෙට් නිවුස් වාර්තාවකට අනුව ඉන්දියාවේ අශෝක් ලේලන්ඩ් සමාගමෙන් බස් මිලදී ගැනීමේ දී එක් බස් රථයකට මිලියනය බැගින් බස් රථ 1200 රුපියල් මිලියන 1200 අල්ලස්

වශයෙන් ලබාගෙන ඇත. එවකට ලේකම් ධම්මික පෙරේරා ද මෙම අල්ලස් ගනුදෙනුවට හවුල් බව ලංකා නෙට් නිවුස් තවදුරටත් තහවුරු කර ඇත.

අල්ලස් හා දූෂණ වලට පමණක් නොව මොහු සුප්‍රසිද්ධ සල්ලාලයකු ද වේ. පාර්ලිමේන්තුව තුලදී ඉතාම අවනීතව කාන්තා මන්ත්‍රීවරියන්ට අපහාස, උපහාස අයුරින් කරන කුමාර වෙල්ගම බොහෝ මන්ත්‍රීවරුන් හඳුන්වන්නේ කුමාර වල්ගම යනුවෙනි. ඔහු ස්ත්‍රී ලොල් වනචර පුද්ගලයකු බව ප්‍රසිද්ධ රැස්වීම් වලදී පවා ප්‍රකාශ කරයි. වනචරකම ඔහුගේ පරම්පරා ලේ උරුමයක් බව පැවසීමට තරම් මෙම වනචර මන්ත්‍රීවරයා නිර්භීත වී ඇත.

මහින්ද රාජපක්ෂ නිතරම ඇසුරු කලේ වනචරයින් හා මිනීමරුවන් නිසා කුමාර වෙල්ගම වැනි චරිත මහින්දගේ ප්‍රියයන් වූ බව නිසැකය. කුමාර වෙල්ගම තමන්ගේ අනියම් පෙම්වතියකගේ නම ලංකා දුම්රියකට නයනාකුමාරි නමින් නම් කර ඇත. මෙවැනි අශීලාචාර, දූෂිත වනචරයෙක් ඉතා ඉහල ඡන්ද ප්‍රමාණයකින් පාර්ලිමේන්තුවට තේරීම තුලින් මහජනතාවගේ දේශපාලන විඥාණය පිළිබඳව ප්‍රශ්නකාරී තත්වයන් ඇතිවේ.

## කෙහෙලිය රඹුක්වැල්ල

එක්සත් ජාතික පක්ෂයේ පිහිටෙන් පාර්ලිමේන්තුවට ඇතුල් වූ කෙහෙලිය රඹුක්වැල්ල මහින්ද රජයේ සිටි තවත් අන්ත දූෂිත (මුදල් හා චරිතය) ඇමතිවරයෙකි මහින්දගේ දැත් ශක්තිමත් කිරීමේ මුවාවෙන් ජනමාධ්‍ය ඇමතිධූරය ලබාගත් කෙහෙලිය ලංකාවේ ජනමාධ්‍ය ඉතිහාසයේ ඉතාම නින්දිත ලෙස ජනමාධ්‍ය හැසිරවීමට ක්‍රියා කල ඇමතිවරයකු වශයෙන් හැඳින්විය හැකියි ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ස්වාදීන රූපවාහිනිය, ලංකා ගුවන්විදුලි සංස්ථාව, ලේක්හවුස් ආයතනය මහින්ද රාජපක්ෂ ගේ ප්‍රතිරූපය පිම්බීම සඳහා ඉතා අශීලාචාර ලෙස මෙහෙය වීම කෙහෙලිය රඹුක්වැල්ලගේ කාලය තුල සිදුවිය. රජය සතු ජනමාධ්‍ය ආයතන වලින් මහින්දගේ ප්‍රචාරක කටයුතු හැර වෙනත් කිසිඳු දේශපාලන පක්ෂ ප්‍රචාරන කටයුතු වලට ඉඩක් නොලැබුනි.


කෙහෙලිය

රූපවාහිනී සංස්ථාව භාරව සිටි චන්‍ද්‍රපාල ලියනගේ, මොහාන් සමරනායක, ස්වාධීන රූපවාහිනිය සභාපති ලෙස ක්‍රියාකල අනුර සිරිවර්ධන සුදර්මන් රදලියගොඩ, ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සභාපති වූ හඩ්සන් සමරසිංහ□ ලේක්හවුස් ආයතනයේ සභාපති පුෂ්පකුමාර ආදීන් මහින්ද ගේ අශුචි පවා සුවඳ බව පවසමින් ලාංකික ජනතාව තුල මහින්ද රාජපක්ෂ මායා ලෝකයක් බිහි කිරීමට කටයුතු කල පුද්ගලයෙක් විය. හඩ්සන් සමරසිංහ නමැති වාචාලයා උදේ සිට රෑ වනතුරු මහින්ද ගේ ගුණ ගායනා කල වසලයකු විය.

2015 ජනාධිපතිවරණයේ දි රජයේ ජනමාධ්‍ය ආයතන සියල්ලම ඉතාම අශීලාචාර ලෙස සියලුම මැතිවරණ නීතිරීති බිඳ දමමින් මහින්ද රාජපක්ෂගේ දේශපාලන ප්‍රචාරක ව්‍යාපාරය ගෙන ගිය අතර කෙහෙලිය රඹුක්වැල්ල එම මෙහෙයුම්වල ප්‍රධානියා විය. එම ප්‍රචාරක කටයුතු වලදී ස්වාධීන රූපවාහිනිය ගෙවිය යුතු ලක්ෂ 1500 පමණ මුදලක් නොගෙවා වංචා කිරීම පිලිබඳව ජනාධිපති විමර්ෂන කොමිසම පරීක්ෂණ පවත්වමින් ඇති අතර, එම මුදල් අවභාවිතය පිළිබඳව මහින්ද රාජපක්ෂ හා ස්වාධීන රූපවාහිනියේ සභාපති අනුර සිරිවර්ධන ඇතුලු ඉහල නිළධාරීන්ට නඩු පැවරී ඇත.

කෙහෙලිය රඹුක්වැල්ල ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සහ ස්වාධීන රූපවාහිනියේ ප්‍රචාරය වන සියලුම ටෙලි නාට්‍ය වලින් රුපියල් 50,000ක අල්ලස් මුදල් ලබා ගත් බව ප්‍රසිද්ධ රහසකි. මේ

වගේ දිනකට රුපියල් ලක්ෂ 05 පමණ මුදලක් මොහු උපයා ගෙන ඇති බවට තොරතුරු හෙළි වී ඇත. සියලුම ටෙලි නාට්‍ය නිෂ්පාදනවරුන් කෙහෙලිය රඹුක්වැලල ජනමාධ්‍ය ඇමතිවරයාට ලක්ෂ ගණන් මුදල් ලබා දීමට අමතරව ටෙලි නාට්‍ය නිලියන් ඔහුගේ සුඛ විහරණයටද ලබා දුන් බව ප්‍රසිද්ධ කාරණයකි.

### *ඔස්ට්‍රේලියාවේදී කකුල් කඩා ගැනීම*

කෙහෙලිය ඔස්ට්‍රේලියාවේ නිවාඩුවක් ගත කිරීමට ගොස් සිටියදී ඔහු නැවතී සිටි හෝටල් කාමරයෙන් වෙනත් කාන්තාවක් නැවතී සිටි කාමරයකට පැනීමට ගොස් තුන්වැනි මහලී බිමට ඇද වැටී කකුල් දෙකේ ඇට කැඩී තිබීම නිසා මෙල්බර්න් නුවර පෞද්ගලික රෝහලකට ඇතුලත් කර ප්‍රතිකාර ලබා දීමට මහින්ද රාජපක්ෂ ජනාධිපති අරමුදලින් රුපියල් කෝටි දෙක හමාරක් (ලක්ෂ 250) ලබා දී ඇති දුප්පත් ජනතාවට රුපියල් ලක්ෂයක මුදලක්වත් ලබා නොදෙන මහිනද් රාජපක්ෂ කෙහෙලිය වැනි පාදඩයින්ට කෝටි ගණනින් ආධාර ලබාදීමට පරිත්‍යාගශීලි වී ඇති කෙහෙලිය ගේ පුතා ලංකාවේ ක්‍රිකට් කණ්ඩායම ඇතුල් කර විදේශ තරගවලට සහභාගි කරවීමට යැවූ අවස්ථාවකදී අදික ලෙෂ මත්පැන් පානය කොට ගුවන් යානයේ දොර ඇරීමට උත්සාහ නල බවට තොරතුරු හෙළි වූ විට තම පුත්‍රයා නින්දෙන් ඇවිදින රෝගයෙන් පෙලෙන බවට සාවද්‍ය ප්‍රකාශයක් ඉදිරිපත් කොට තම පුත්‍රයා බේරා ගැනීමට නින්දිත ප්‍රයත්නයක් දැරීයි කෙහෙලිය වැනි දූෂිත පාදඩයින් නිරන්තරයෙන් ආරක්ෂා කිරීම මහින්ද රාජපක්ෂගේ ප්‍රතිපත්තිය වියි

## මහින්දානන්ද අලුත්ගමගේ

මහින්දානන්ද දේශපාලනයට පිවිසීමට පෙර කුලියාපිටිය ඉඩම් වෙන්දේසි සමාගමක රක්ෂණ නියෝජිතයකු වශයෙන් සිටි අතර, ඔහුගේ මාසික වැටුප රුපියල් 1250කි. ඔහුගේ බිරිඳ වූ ආශා සිංගර් සමාගමේ සුලු සේවිකාවක වූ අතර ඇයගේ මාසික වැටුප රුපියල් 750කි.

මෙම ක රුණු මැතකදී අනාවරණය වූයේ මහින්දානන්දගේ බිරිඳ වූ ආශා විජයන්ති පෙරේරා කුරුණෑගගල දිස්ත්‍රික් උසාවියේ මහින්දානන්දට එරෙහිව එහි පවරා තිබූ නඩත්තු නඩුවකදීය. 1990 ගණන් වලදි මසකට රුපියල් 1250/- වැටුපක් ලැබූ මහින්දානන්ද දේශපාලනයට පිවිස අවුරුදු 20 පමණ කෙටි කාලය තුලදී රුපියල් බිලියන ගණනක ධනවතකු වී ඇත. මහින්දානන්ද සතු ඉඩම්, ගෙවල් හා බැංකු මහින්ද රාජපක්ෂ අවසරින් නිදහස් වී විදුලිබල ඇමති වූ මහින්දානන්ද නොරොච්චෝලේ බලාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතියෙන් රුපියල් බිලියන කොමිස් මුදල් ලබා ගෙන ඇති බව ප්‍රසිද්ධ කාරණයකි. ඩොලර් මිලියන 23.5ක කොමිස් මුදල් නොරොච්චෝලේ විදුලිබල ව්‍යාපෘතියෙන් මහින්දානන්ද දූෂිත ලෙස උපයා ගෙන ඇති බවට තොරතුරු හෙළි වී ඇත. මෙම අයථා ලෙස ඉපැයූ මුදල් වලින් මිලට ගෙන ඇති ඉඩම් ගෙවල් බැංකු ගිනුම් වල තැන්පත් කර මුදල් පිළිබඳව පහත දක්වමු.



*මහින්දානන්ද*

1. මුදල් විශුද්ධිකරණය යටතේ කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් වෙත ඊ වාර්තාවකට අනුව නඩු අංක N/22467/01/15/01/5

2. බොරැල්ල කුරුප්පු පාරේ පර් 20.85 ක් මිලියන 15
   (මෙය ඉතාමත් අඩු තක්සේරුවකි)

3. මහනුවර ජෝර්ජ් ආර් ඩී ද සිල්වා මාවතේ පර් 35. 68392.00කි

මෙම ලිපිනයේම පර් 12 - රුපියල් 7,80,000/-කි.

මෙම ලිපිනයේම පර් 18.3 - රුපියල් 10,00,000/-කි.

4. කොළඹ ඇල්විටිගල මාවතේ ට්‍රිලියම් නිවාස සංකීර්ණයේ අංක 153/9/2 නිවාසය බිරිඳගේ නමට මිලට ගෙන ඇත. ලක්ෂ 285.

5. කොළඹ 07 කිංසි පාරේ අංක 70/3/1 දේපල රුපියල් ලක්ෂ 270ක.

## උදය ගම්මන්පිල

මහින්ද රාජපක්ෂගේ ප්‍රධාන සගයකු වන උදය ගම්මන්පිල ජාතික හෙල උරුමය නිසා දේශපාලනයට පිවිස මහින්ද ගේ තනතුරු වරදාන හමුවේ සිය මුල් දේශපාලන පක්ෂය අත්හැර පිවිතුරු හෙල උරුමය නමින් පක්ෂයක් පිහිටුවා ගෙන ඇති නමුත් මෙම පක්ෂය පිලිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි වී නැත. සාමාජිකයන් 50කට අඩු සංඛ්‍යාවක් ඇති මෙම පක්ෂය නූතන දේශපාලන කරලියේ බඩපිනුම් ගසමින් සිටී. 2015 මැතිවරණයේ දි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පිහිටෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වු මෙම කට හැකර දේශපාලනඥයා විමල් වීරවංශගේ වල්ලේම එකෙකි. පුවත්පත් හා අනෙකුත් මාධ්‍ය මෙම දේශපාලන අපතයාට මෙතරම් ප්‍රසිද්ධියක් ලබා දෙන්නේ ඇයි දැයි මෙරට බුද්ධිමත් ජනතාව අතරේ කුකුසක් ඇති වී ඇත. ත්‍රිවිල් රථයකටවත් නොසෑහෙන සාමාජික සංඛ්‍යාවක් ඇති ලියාපදිංචි නොවූ දේශපාලන පක්ෂයක් අටවා ගෙන ගම්මන්පිල ලාංකික දේශපාලන කරලියේ ඉතා වැදගත් ප්‍රමුඛ දේශපාලන චරිතයක් ලෙස කැපී පෙනීමට නිරන්තර උත්සාහයක යෙදෙන අතර□ මාධ්‍ය පකීර්ලා ලෙස හඳුන්වා ගන්නා ජනමාධ්‍ය ආයතනවල ප්‍රධානීන්ද මෙම විහිලුකාරයාට - මහින්ද රාජපක්ෂට සමාන තැනක් දීමට උත්සාහ ගෙන තිබීම අදහා ගත නොහැකි කරුණකි.



*ගම්මන්පිල*

සුදනකු වශයෙන් පෙනී සිටීමට උත්සාහ කලද ඔස්ට්‍රේලියානු ව්‍යාපාරිකයෙකු ගේ සමාගමකින් අයථා ලෙස රුපියල් කෝටි 11 වටිනාකමකින් යුත් කොමිස් - හොර රහසේ ඔහුගේ නමට හරවා ගත් බවට චෝදනා කරමින් එම ඔස්ට්‍රේලියානු ජාතික ව්‍යාපාරිකයා උදය ගම්මන්පිලට එරෙහිව නීතිමය පියවර ගෙන ඇති

## ඩලස් අලහපෙරුම

දිවයින පුවත්පතේ වාර්තාකරුවකු ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කල ඩලස් 1994 දී මාතර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තු මැතිවරණයට තරග කොට ප්‍රථම වරට පාර්ලිමේන්තුවට ඇතුලුවිය.

2015 ජනවාරි 20 දින ලංකා ඊ නිව්ස් Romings banlog පළවූ වාර්තාවකට අනුව 2015 ජනවාරි 09 දින මහින්ද රාජපක්ෂ අරලිය ගහ මන්දිරය හැර දා මැද මූලනට පලා යන විට රුපියල් මිලියන 1500ක මුදල් අරලියගහ මැදුරේ කාමරයක තිබී හමු වී ඇත. ආණ්ඩුවෙන් මේසා විසල් මුදල් ප්‍රමාණයක් අතර, දේශීය සහ විදේශීය මුදල් විශාල ප්‍රමාණයක් තිබී ඇත. අරලියගහ මැදුර හැර පලා යනවිට දී ද මේසා විශාල මුදල් ප්‍රමාණයක් රැගෙන යන්නට ඇත්දැයි අනුමාන කල හැකිය.



*ඩලස්*

ආරක්‍ෂක අරමුදලේ ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ තිබූ රුපියල් මිලියන 210෴000 මුදලින් රුපියල් මිලියන 13500 සිදුවූ දෙයක් සොයගැනීමට නොහැකිව ඇති දූනට එම ගිනුමේ ඉතිරිව ඇත්තේ රුපියල් මිලියන 7500 කී

# මහින්ද දිස්ත්‍රික් මට්ටමේ දේශපාලන මැරයින් ඇති කොට පෝෂණය කිරීම

## කොළඹ දිස්ත්‍රික්කය

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී දුමින්ද සිල්වා මහින්ද හා ගෝඨාභය විසින් නිර්මාණය කරන ලද අංක 1 මැරවරයෙකි. ගෝඨාභයගේ ආශිර්වාදයෙන් ලංකාවට මත්ද්‍රව්‍ය (හෙරොයින්) ගෙන්වීමේ ප්‍රධානියකු වූ දුමින්ද මහින්දගේ අණ කිරීම අනුව භාරත ලක්‍ෂමන් ප්‍රේමචන්ද්‍ර මහතා ඝාතනය කරන ලදි.

### මර්වින් සිල්වා

කුප්‍රකට මර්වින් සිල්වා - මහින්ද ගේ ඇල්ෂේෂන් වර්ගයේ සුනඛයෙකි අද වන විට රාජපක්‍ෂවරුනට එරෙහිව ප්‍රධාන චරිතයක් රඟපාන මර්වින් සිල්වා රාජපක්‍ෂවරුන්ගේ මළ මුත්‍රා පවා කෑමට - බීමට පුරුදුව සිටි වසලයකි. රාජපක්‍ෂවරුන්ට එරෙහි මාධ්‍ය ආයතන ගිනි තැබීමට යොදා ගත් මෙම වහලා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට ගොස් රූපවාහිනී සේවකයන්ගේ මළ මුත්‍රා වලින් සංග්‍රහ ලැබූ අතර රූපවාහිනී සංස්ථාවේ නිළධාරිනියන්ගේ අඟ - පසඟ කපා දැමීමට ක්‍රියා කල වසලයෙකී. රාජපක්‍ෂවරුන්ගේ අනුග්‍රහයෙන් කොළඹ අවට නිවාස රාශියක් ඉඩම් රාශියක් බලහත්කාරයෙන් අල්ලා ගෙන ඇත.

1970 සමගි පෙරමුණු ආණ්ඩුව යටතේ සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ (ජාතික පොල) නාටාමියකු ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කල මර්වින් සිල්වා රාජපක්‍ෂ ආණ්ඩුවේ කැබිනට් අමාත්‍ය ධූරයක් ලබා ගැනීමට තරම් වාසානාවන්ත වූ පුද්ගලයෙකි. රාජපක්‍ෂවරුන්ගේ සියලුම මිනීමැරුම්, පැහැරගෙන යාම්, කප්පම් ගැසීම් වලට පූර්ණ සහයෝගය දී එම අපරාධ මෙහෙයවූ අයෙකි.

## ගම්පහ දිස්ත්‍රික්කය

### නිමල් ලංසා

ගම්පහ දිස්ත්‍රික්කයේ අංක 1 දේශපාලන මැරයකු සහ අංක 1 මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු, බාල අපචාරකරුවකු වන නිමල් - මහින්ද රාජපක්‍ෂගේ අග්‍රගන්‍ය මිතුරෙකි. මත්ද්‍රව්‍ය හා අනවසර ගිනි අවි තිබෙන බවට ලද තොරතුරක් මත නිමල් ලංසාගේ නිවස විශේෂ පොලිස් කාර්යාංශය විසින් වටලන ලද අවස්ථාවේදී මහින්ද රාජපක්‍ෂ හෙලිකොප්ටර් යානයකින් නිමල් ලංසාගේ නිවසට ගොස් ඔහුගේ කරට අත දමාගෙන නිවස ඉදිරිපිට සිටින ඡායාරූප මාධ්‍යවල පලවිය. නිමල් ලංසා මහා පරිමාන කුඩු ජාවාරම් කාරයකු වූ අතර, එම ජාවාරම් වලින් ලද මුදලින් කොටසක් මහින්දට, ගෝඨාභයට හා බැසිල්ට ලබා දුන් බවට තෙරතුරු අනාවරණය වී ඇත. වත්තල, මීගමුව අවට ගණිකා නිවාස හා අනවසර මත්පැන්හල් රාශියක් නිමල් ලංසා විසින් පවත්වා ගෙන යයි. මිනීමැරුම් හා පැහැරගෙන යාම් රාශියකටද මොහු සම්බන්ධ වී සිටී නමුත් රාජපක්‍ෂවරුන්ගේ ආශිර්වාදයෙන් එම චෝදනාවලින් නිදහස් වී අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු


මහින්දගේ මිත්‍ර නිමල් ලංසා

ලෙසපත්වී ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ධූරයෙන්ද පිදුම් ලබා යෙහෙන් වැජඹීම පුදුමයට කරුණකි.

## ප්‍රසන්න රණතුංග

ගම්පහ දිස්ත්‍රික්කයේ සුප්‍රසිද්ධ දේශපාලන පවුලකට අයත් ප්‍රසන්න - මහින්ද ගේ අතිජාත ගෝලයෙකි. මහින්ද ගේ පවුලට වඩා මහින්ද ගැන උණ ගායෙන් පෙලෙන ප්‍රසන්න මහින්ද ගේ දේශපාලන උෂ්ණයෙන් රත් වී අද දේශපාලන උන්මත්තකයකු වී ඇත. මොහු අවංක, ශුද්ධවන්ත දේශපාලනඥයකු ලෙස සමාජයේ කැපී පෙනීමට උත්සාහ කලද, රජයට අයත් ඉඩමක් මහ ඇමති දේශපාලන බලතල පාවිච්චි කොට රුපියල් මිලියන 65ක් (ලක්ෂ 650) අල්ලස් ලබා ගත් බවට චෝදනා ලැබ අධිකරණය හමුවෙව්පෙනී සිටීමට සිදුවී ඇත.



ගම්පහ දිස්ත්‍රික්කයේ මහින්ද සමග නැගිටිමු සහ මහින්ද සුළඟ යන දේශපාලන වැඩ සටහන් මෙහෙයවීමේ ප්‍රධාන ක්‍රියාධරයකු වන ප්‍රසන්න පුද්ගලයකුට පහර දී මිනීමැරීමට තැත් කිරීමේ චෝදනා වලට ලක්වී අධිකරණයේ නඩුවක් පවරා ඇත.

## රෝහිත අබේගුණවර්ධන

මහින්ද රාජපක්ෂ රජයේ සිටි අන්ත දූෂිත ඇමතිවරයකු වූ රෝහිත කළුතර දිස්ත්‍රික්කයේ පිටිසර ගම්මානයක ඉතා දිළිඳු පවුලක උපන් අ.පො.ස.(සා.පෙල) සමත් නැති මෝඩයෙකි. රැකියාව වශයෙන් මංකොල්ල කෑම් වල යෙදුනු රෝහිත දුම්රියේ ගමන් කරන කාන්තාවන් ගේ රත්‍රං මාල කඩා ගැනීම නිසා දඬුවම් ලැබූ පුද්ගලයෙකි. මේ නිසා ඔහුට රත්තරං යන නාමයද පටබැඳී තිබුනි.

අන්ත දිළින්දකු වුවද දේශපාලනයට පිවිසීමෙන් පසුව මහජන මුදල් හොරකම් කිරීමෙන් කෝටිපතියෙකු විය. රුපියල් මිලියන 450ක් (කෝටි 45) මුදලක් උපයා ගත් ආකාරය ඔප්පු කිරීමට නොහැකි වීම නිසා අල්ලස් හා දූෂණ කොමිසම විසින් මොහුට එරෙහිව නඩු පැවරීය.

මෙම පරීක්ෂණ සඳහා අල්ලස් කොමිසමට පැමිණීමට නොතීසි නිකුත් කල අවස්ථාවේදී එදින නාගයකු දෂ්ඨ කිරීම නිසා කොමිසම හමුවට පැමිණීමට නොහැකි බව දන්වා ඇත.

මහින්ද රාජපක්ෂ ගේ බලපෑම් මත පසුගිය දස අවුරුද්ද පුරාම මොහුට විරුද්ධ ක්‍රියා නොකල අතර, වර්තමාන ආණ්ඩුව නැවත මෙම දූෂිතයාට එරෙහිව විමර්ෂන ආරම්භ කර ඇත.

වරාය භාරව මහින්ද යටතේ රාජ්‍ය අමාත්‍ය ධූරයක් දැරූ රෝහිත එම කාල සීමාව තුලදී දූෂණ ක්‍රියාවල යෙදෙමින් අපිරිමිත මුදල් සම්භාරයක් උපයා ගෙන ඇත. මහින්ද රාජපක්ෂ නිරතුරුව තමාට පක්ෂපාතී දූෂිත පුද්ගලයන් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය ගෙන යාම නිසා රෝහිත අබේගුණවර්ධන වැනි දූෂිතයන්ට රිසි සේ මහජන මුදල් කොල්ල කෑමට අවස්ථාව උදාවී තිබුනි.



*රෝහිත*

# මහනුවර දිස්ත්‍රික්කය

## ලොහාන් රත්වත්තේ

අනුරුද්ධ රත්වත්තේ ගේ පුතකු වන ලොහාන් මහනුවර දිස්ත්‍රික්කයේ මහින්දවාදී දේශපාලන මැරයෙකි. අනුරුද්ධ රත්වත්තේ නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍ය ධූරය දරන කාලයේ පැවති මැතිවරණ ව්‍යාපාරයේ දී උඩතලවින්න ප්‍රදේශයේ දී මුස්ලිම් තරුණයක් 12 දෙනෙකු වෙඩිතබා බෝම්බ ගසා ඝාතනය කිරීමේ සිද්ධියේ ප්‍රධාන සැකකරුවෙකි. මැතිවරණ දිනයේ දි සිය පියාවන අනුරුද්ධ රත්වත්තේට එරෙහිව ඡන්ද සටනේ යෙදුනු මුස්ලිම් තරුණයින් පිරිසකට බෝම්බ ගසා එක් තරුණයෙකුගේ කටට පිස්තෝලය තැබීමට තරම් නැරමයකු වූ ලොහාන් මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ දේශපාලන මැරයෙකි. රාජපක්ෂවරුන්ගේ ආශිර්වාදය හා ආරක්ෂාව යටතේ අශීලාචාර දේශපාලන ව්‍යාපාරයක යෙදී සිටින ලොහාන් බහු විවාහ චෝදනාවලටද ලක් වූවෙකි. ළමා අපචාර සම්බන්ධයෙන්ද මොහුට එරෙහිව චෝදනා එල්ල වී ඇත. මහින්ද රාජපක්ෂගේ දේශපාලන උපක්‍රම වූයේ ලොහාන් - මහින්දානන්ද වැනි ප්‍රසිද්ධ දේශපාලන මැරයින් ලවා ප්‍රතිවිරුද්ධ දේශපාලන සංවිධානවල නායකයින් මැඩ පවත්වා සිය දේශපාලන ප්‍රතිරූපය ඉහල නංවා ගැනීමයි.



*ලොහාන්*

## එස් බී දිසානායක

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ හැඳින්වීමට අනුව පුස් බයිසිකලයෙන් දේශපාලනය ඇරඹූ එස්.බී. අද වන විට ලංකාවේ සිටින සුපිරි ධනවතෙකි. කාලයෙන් කාලයට තම පැවැත්ම අනුව දේශපාලන පක්ෂ මාරු කරන මෙම පුද්ගලයා කට නිසාම දේශපාලනයට පැමිණ කට නිසාම හිර බත් කෑ කිසිදු ප්‍රතිපත්තියක් නැති අමන දේශපානඥයෙකි. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවීමෙන් අනතුරුව ශ්‍රී.ල.නි.ප. යට පැන ගත් මොහු රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවේද ඇමති ධූර ලබා ගැනීමට තරම් වාසානාවන්ත විය. චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිනිය යටතේ සමෘද්ධි ඇමති ධූරය

දරූ මොහු අන්ත දූෂිත ලෙස සමෘද්ධි ව්‍යාපාරයේ මුදල් කොල්ල කා ඇත.



එස්.බී.

තමාගේ වාසිය වෙනුවෙන් අම්මා - අප්පා පවා පාවා දීමට මැලි නොවන මොහු මහනුවර දිස්ත්‍රික්කයේ දේශපාලන මැරයකු ලෙසද ප්‍රසිද්ධිය. මහින්ද රාජපක්ෂගේ 2015 මැතිවරණයේ දී මෛත්‍රීපාල සිරිසේන මහතාට එරෙහිව මහනුවර දිස්ත්‍රික්කයේ ඡන්ද සටන මෙහෙයවූ ප්‍රධාන පුද්ගලයා වූ එස්.බී. පාර්ලිමේන්තු මැතිවරණයේ දී හඟුරන්කෙත ආසනයෙන් පරාජයට පත් වුවද යහපාලන ආණ්ඩුවෙන් ජාතික ලැයිස්තුවෙන් නැවත පාර්ලිමේන්තුවට පැමිණ අද කැබිනට් අමාත්‍ය ධූරයක් ද දරයි. අදෝමැයි මහින්ද යටතේ සියලු වරප්‍රසාද ලබා ගෙන ඇමති කම් දරා මහින්ද බලයෙන් පහවූ විට ඔහුට එරෙහිව අවලාද නගමින් අද ඇමති කටුව ලෙවකමින් සිටී.

## කුරුණෑගල දිස්ත්‍රික්කය

### දයාසිරි ජයසේකර



දයාසිරි

එක්සත් ජාතික පක්ෂයෙන් දේශපාලනයට පිවිසි දයාසිරි ද මහින්ද ගේ ඇමති කටුවලට පේවී සිය පක්ෂය අතහැර දමන්නට තරම් ගුණමකුවකු විය. 2015 ජනාධිපතිවරණයේ දී කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් මහින්දට බහුතර ඡන්දයක් ලබාදීමට පෙරමුණ ගෙන ක්‍රියා කල දයාසිරි අද මෛත්‍රීපාලනය යටතේ ක්‍රීඩා අමාත්‍ය ධූරය දරයි. මහින්ද නිතරම මාන බැලුවේ තමාට වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගත හැකි ජනප්‍රිය පුද්ගලයින්, මුදල් හා තනතුරු ප්‍රදානය කර තම පක්ෂයට නතු කර ගැනීමයි. දයාසිරි කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනප්‍රිය තරුණ දේශපාලකයකු වූ නිසා මහින්ද දයාසිරිටම මුදල් හා තනතුරු දී තම පක්ෂයට හරවා ගත් බව ප්‍රසිද්ධ රහසකි.





මහින්ද සහ පුත්‍ර සමාගමට කෲර පාලක ගඩාෆිගේ ආශිර්වාදය



'අනේ සර්... අපි කළ ද...' -පවිත්‍රා දේවි වන්නිආරච්චි

# ලක්ෂමන් හුළුගල්ල (හුලා)
සාමාන්‍ය මධ්‍යම පාන්තික පවුලක උපන් ලක්ෂමන් කුරුණෑගල මලියදේව විදුහලෙන් අ.පො.ස. සාමාන්‍ය පෙල සමත්ව ලංකා හෝටල් සංස්ථාවේ වේටර්වරයකු වශයෙන් ජීවන වෘත්තිය ආරම්භ කොට මහවැලි ඇමති ගාමිණී දිසානායක මහතාට සමීප වී පහත්බිම් සංවර්ධන මණ්ඩලයේ ලිපිකරු වෘත්තියක් ලබා ගෙන ගාමිණී දිසානායක මැතිතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්තව සේවය කලේය.

ඉංග්‍රීසි බස තරමක් දුරට හැසිරවීමට තිබූ දක්ෂතාවය නිසා ගාමිණී දිසානායක ඇමතිතුමා මොහු තමාගේ නොයෙකුත් පෞද්ගලික රාජකාරී සඳහා යොදවා තිබුණි. කෛරාටික කපටි බුද්ධියක් උත්පත්තියෙන්ම දායාද කරගෙන තිබූ හුළුගල්ල, දිසානායක පවුලේ විශ්වාසවන්ත හිතවතකු බවට පත්වීමට සමත්විය. මෙම සමීප සබඳතා උපයෝගී කරගෙන නොයෙකුත් අයථා ක්‍රියාවල යෙදෙමින් මුදල් ඉපැයීම ආරම්භ කෙරිණ.

ගාමිණී දිසානායක මහතා එක්සත් ජාතික පක්ෂ රජයේ ඉතා ප්‍රබල ඇමතිවරයකු වූ අතර, ඔහු යටතේ විශාල ධනස්කන්ධයක් යොදවා ක්‍රියාත්මක වූ මහවැලි සංවර්ධන ව්‍යාපාතියේ කොන්ත්‍රාත් ආදිය ලබා දෙන බව පවසා හුළුගල්ල විශාල වශයෙන් අල්ලස් මුදල් ලබා ගත් බව ප්‍රසිද්ධ කරුණකි.

රාජ්‍ය දැව සංස්ථාව ගාමිණී දිසානායක ඇමතිතුමා යටතේ පැවති අතර, දිවයිනේ විහාරස්ථාන වල ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අවශ්‍ය වූ දැව රාජ්‍ය දැව සංස්ථාව මගින් නොමිලයේ ලබා දීමට වැඩ පිළිවෙලක් ආරම්භ කර තිබුනි. මෙම වැඩ පිළිවෙල යටතේ කුරුණෑගල ඇත්කඳ විහාරයට සපයන බවට පවසා රුපියල් ලක්ෂ ගණනක් වටිනා දැව තොගයක් රාජ්‍ය දැව සංස්ථාවෙන් ලබාගෙන ඒවා හොර රහසේ පුද්ගලික දැව ජාවාරම්කරුවකුට විකිණීමේ සිද්ධියකට ලක්ෂමන් හුළුගල්ල හසුවිය. මෙම දූෂණ ක්‍රියාවට අධිකරණය මගින් වැරදිකරුවී සය අවුරුදු සිර දඬුවකට ලක්ෂමන් හුළුගල්ල යටත් විය.

මේ කාලයේ ජනාධිපති ප්‍රේමදාසට එරෙහිව දෝෂාභියෝගය ඉදිරිපත් කර ගාමිණී, ලලිත් දෙපල රාජාලියා නමින් අලුත් දේශපාලන පක්ෂයක් පිහිටුවා ගෙන ප්‍රේමදාස ජනාධිපතිවරයාට එරෙහි දැවැන්ත දේශපාලන ව්‍යාපාරයක් ආරම්භ කර තිබුනි. 6 අවුරුදු සිර දඬුවම් නියම වී සිටි ලක්ෂමන් ගාමිණී දිසානායක මහතා ක්‍රියාත්මක කරමින් තිබූ දේශපාලන ව්‍යාපෘතිය පිළිබඳ සියලු රහස් තොරතුරු ප්‍රේමදාස ජනාධිපතිවරයාට ලබාදීම නිසා ජනාධිපති සමාව ලබාගෙන සිර දඬුවම අත්හිටුවා ගැනීමට සමත් විය. කන්න දුන්නු අත හපා කෑමේ නින්දිත ප්‍රතිපත්තිය අනුගමනය කල හුළුගල්ල ප්‍රේමදාස ජනාධිපති වරයාගේ ඔඩොක්කු කුක්කකු බවට පත්විය.

ප්‍රේමදාස ජනාධිපති වරයාගේ හදිසි අභාවයෙන් පසුව විජේතුංග ජනාධිපති වරයාගේ කාලයේ දී ද නොයෙකුත් දූෂණ ක්‍රියාවල යෙදෙමින් විශාල ධනස්කන්ධයක් උපයා ගැනීමට සමත් වූ හුළුගල්ල චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය ජනාධිපති විමෙන් පසුව එම පක්ෂයට සේන්දු විය. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ පාලන සමයේ දී සනත් ගුණතිලක සමග දැඩි සබඳතාවයක් ගොඩ නගා ගෙන තිබූ අතර, මෙමගින් ඕස්ට්‍රේලියානු සමාගමක් සමග රූපවාහිනී විකාශණ සමාගමක් ආරම්භ කොට එම ඕස්ට්‍රේලියානු ව්‍යාපාරිකයන්ගෙන් කෝටි ගණනක මුදල් වංචා කොට අවසානයේ දේශපාලන බලය යොදවා සියලුම පරීක්ෂණ යට ගසා දැමීමට තරම් ලක්ෂමන් ප්‍රබල චරිතයක් විය.

## රාජපක්ෂ යුගය හා ලක්ෂමන්
මහින්ද රාජපක්ෂ, බැසිල් හා ගෝඨාභය සමග ඉතාම සමීප සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීමට ලක්ෂමන් ඉතාම පහත් උපක්‍රමයක් යොදා ගනී. ලක්ෂමන්, මාවනැල්ල මන්ත්‍රී චන්ද්‍රා

රණතුංග ගේ දියණියක සමග විවාහ වී සිටි අතර, ඇය රූමත් කාන්තාවක් වූවාය. රාජපක්ෂවරුන් නියම කාමසුබල්ලිකානු යෝගී පරපුරක් බැවින් ලක්ෂමන්ට සිය සුරූපි බිරිය මගින් අති විශිෂ්ඨ සබඳතාවක් ගොඩ නගා ගැනීමට හැකිවිය. මෙම සබඳතාවන් කොතරම් දුරට ප්‍රබලවීද කිවහොත් ලක්ෂමන් ගේ බිරිඳ මාස කිහිපයක් බැසිල් රාජපක්ෂ සමග ජීවත්වීමට යාමට තරම් නිර්භීත වූවාය. බැසිල් පමණක් නොව මහින්ද හා ගෝඨා සමගද ඉතා සමීප සබඳතාවයක් තිබූ බව බොහෝ දෙනා පිළිගත් කරුණක් විය.

තමාට බලය ගැනීමට හා එමගින් අති විශාල ධනස්කන්ධයක් උපයා ගැනීමට තම බිරිය පාවා දීමට තරම් නිහීන වූ ලක්ෂමන් සිය බිරිය ගේ මාර්ගයෙන් ගෝඨාභය යටතේ පිහිටුවා තිබූ ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත්වීමක් ලබා ගත්තේය. එල්.ටී.ටී.ඊ. ය සමග පැවති යුධ සමයේ රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ සියලුම පුවත් පාලනය කිරීම හා බෙදා හැරීම සම්පූර්ණයෙන්ම තිබුනේ ලක්ෂමන් ගේ ප්‍රධානත්වයෙන් පැවති ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානයටය.





ලක්ෂමන් (හුලා) ගෝඨා හා බැසිල සමඟ (ඉහළ)
ලෝකප්‍රසිද්ධ මත් ද්‍රව්‍ය ජාවාරම් කාර මජූඩ් ගෝඨාභය සමග (පහළ)

මහින්ද හා ගෝඨාභය මාධ්‍යය දැඩි ලෙස පාලනය කර තමන්ගේ දූෂිත පාලනය පිලිබඳ තොරතුරු මහජනතාව අතරට යාම වැලැක්වීමට ඉතා සූක්ෂම වැඩ පිලිවෙලක් දියත් කර තිබුනි. මාධ්‍ය ආයතන ප්‍රධානීන් අරලියගහ මන්දිරයට ගෙන්වා ඔවුනට පෞද්ගලිකව තර්ජනය කිරීම මහින්ද ගේ පුරුද්දක් විය. ඊට අමතරව මාධ්‍යවේදීන් මරා දැමීම, ඔවුනට තම ආරක්ෂක නිළධාරීන් ලවා පහරදීම, මාධ්‍යවේදීන් ගේ නිවාස වලට ඇතුලු වී ලිපි ලේඛණ සොරකම් කිරීම, මහින්ද ගේ පාලන කාලය තුල නිරන්තරයෙන්ම සිදුවිය. ගෝඨාභයද සිය නිල බලය උපයෝගී කරගෙන මාධ්‍යවේදීන් දැඩි ලෙස මර්ධනය කිරීමට කටයුතු කල පුද්ගලයෙකි. මෙම සියලු නීති විරෝධි කටයුතු වලට ප්‍රධාන වශයෙන් යොදවා ගත්තේ ලක්ෂමන් හුළුගල්ලයි. මහින්ද ගෝඨාභයගේ අණ ලැබුණු වහාම ලක්ෂමන් පුවත්පත් සාකච්ඡා පවත්වා මහින්දට හා ගෝඨාභයට එල්ල වන චෝදනාවලට සුදු හුණු ගෑම කරනු ලැබීය. මෙම සට්ටැඹි ක්‍රියාවලට ප්‍රති උපකාර වශයෙන් මාධ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පදවියට අමතරව පශු සම්පත් මණ්ඩලයේ උප සභාපති පදවිය, කොමර්ෂල් බැංකුවේ අධ්‍යක්ෂ ධූරයක් හා රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ විධායක අධ්‍යක්ෂ ධූරයක් ද පිරිනමා තිබුණි. මෙම ආයතන වලින් ලක්ෂ ගණන් මුදල් අයථා අන්දමින් උපයා ගෙන ඇති බව දැනට අනාවරණය වී ඇත.

මාධ්‍යවේදීන් මරා දැමීම හා අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් ද මොහුගේ දායකත්වය නොඅඩුව ලැබී ඇති බව පරීක්ෂණ වලින් අනාවරණය වෙමින් පවතී.

## කුඩු රජා සහ පාතාලය සමග සබඳතා

ලංකාවේ මත්කුඩු (හෙරොයින්) ජාවාරමට සම්බන්ධ අන්තර්ජාතික මත්ද්‍රව්‍ය ජාවාරම් කාරයකු වන මොහොමඩ් මුබාරක් මොහොමඩ් මුජයිඩ් සමග ඉතා සමීප සබඳතාවයක් තිබූ ලක්ෂමන් මෙම මත්කුඩු ජාවාරම් කරුවා රාජපක්ෂවරුන්ට හඳුන්වා දීමේ පුරෝගාමියෙකු ද විය. ගෝඨාභය රාජපක්ෂට මුජයිඩ් නමැති අන්තර් ජාතික මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවා හඳුන්වා දී ඔහුගේ මාර්ග යෙන් සෙල්වම් නමැති චිත්‍රපටිය නිපදවීමට කටයුතු කිරීම තුලින් කෝටි ගණනක මුදල් උපයා ගෙන ඇත. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පාලන සමයේදී අරලියගහ මන්දිරයේ පවත්වනු ලැබූ දන්සැල් වලට බුරියානි සැපයීම කරනු ලැබුවේද ලක්ෂමන් ගේ අතිජාත මිත්‍ර මුජයිඩ් නම් මැලේසියාවේ පදිංචි මෙම අන්තර් ජාතික මත්ද්‍රව්‍ය ජාවාරම් කරුවාය. පාතාල නායකයින් සමගද ලක්ෂමන් හුළුගල්ල සබඳතා පවත්වා ඇති බව රහස් පොලීස් පරීක්ෂණ වලින් අනාවරණය වී ඇත.

## හුලා සහ සුධර්මා

ලක්ෂමන් හුළුගල්ල මිතුරන් අතරේ හඳුන්වනු ලැබුවේ හුලා නමිනි. හුලා සහ සලාකා ව්‍යාපාර අධිපති ගාමිණී නෙත්තිකුමාර ගේ බිරිඳ වූ සුධර්මා අතර තිබූ ආදර අන්දරය සමාජයේ දැඩි කතාබහට


හුලා+සුදර්මා

ලක් වූයේ සුධර්මා නෙත්තිකුමාර විසින් සලාකා හෝටලයේ පවත්වා ගෙන ගිය "බූරුවා පොල" (කැසිනෝ) පොලීසිය විසින් වැටලීමෙන් පසුවය. 2013 නොවැම්බර් 04 දා පොලිස් විශේෂ දූෂණ මර්ධන අංශය විසින් සලාකා බූරුපොල (කැසිනෝ) වටලනු ලැබූ අතර, ඊට පසු දින එම වැටලීමට සම්බන්ධ පොලිස් නිලධාරින් 23 දෙනෙකු වහාම ක්‍රියාත්මක වන පරිදි එම අංශයෙන් මාරු කර දුෂ්කර සේවයට යවන ලදි. මෙම කරුණ මාධ්‍ය මගින් ඉතා විශාල ලෙස ප්‍රචාරයට පත් කිරීම නිසා මහින්ද - ගෝඨා එම සිද්ධිය යට ගසා දැමීමට උත්සාහ කලද එය ව්‍යර්ථ විය.

ලක්ෂමන්ට අවුරුදු 25 ඉක්මවූ දූ වරුන් තිදෙනෙක් සිටියද හුලා - සුධර්මා ආදර අන්දරයට විරුද්ධ වීමට ඔවුනටද නොහැකි විය. හුලාගේ දේශපාලන බලය හමුවේ ඔහුගේ දූවරුන් දෙදෙනා ද අසරණ වී සිටියහ. හුලා සුධර්මා බැලීමට එන විට එම නිවස අවට පොලිස් විශේෂ බලකාය යොදවන නිසා අසල්වාසීන්ට මහත් කරදරයක් සිදුවන බව පොලීසියට පැමිණිලි කලද හුලාගේ බලමහිමය හමුවේ එම පැමිණිලි වලට සාධාරණය ඉටු නොවීය. දූවරුන් දෙදෙනාට තම ප්‍රේම සම්බන්ධය ගැන සම්බන්ධ නොවන ලෙස තර්ජනය කල අතර, මේ සම්බන්ධව දූවරුන් දෙදෙනා ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පැමිණිලි කලද එම පැමිණිල්ලද හුලාගේ බලය හමුවේ කුණු කූඩයට විසිවිය.

## දිල්රුක්ෂි මහින්දට - ගෝඨාට පැමිණිලි කරයි

මහින්ද, බැසිල් සහ ගෝඨා සමග ඉතාම සමීප ඇසුරක් තිබූ දිල්රුක්ෂි හුලා - සුධර්මා ආදර අන්දරය හමුවේ අන්ත අසරණ විය. තරුණ දූවරුන් තිදෙනෙකු සමග අතරමං වීමට සූදානම් නොවූ දිල්රුක්ෂි අවසන තමාගේ පැරණි යහන් සගයන් වන මහින්දට සහ ගෝඨාට තමාට අත්

වී ඇති ඉරණම දන්වා සිටියේය. මහින්ද හමුවූ දිල්රුක්ෂි තම අසංවර සැමියාගේ ක්‍රියා කලාපය නිසා තමාට සහ දරුවන්ට සිදුවී ඇති අසාධාරණය පැහැදිලි කලාය. මින් අනතුරුව හුළුගල්ල කැඳවූ මහින්ද රාජපක්ෂ හමුදා නිලධාරීන්ට ඉදිකරනු ලබන නිවාස 15000 ව්‍යාපෘතියේ සැඟවුනු කොටස්කාරයා වූ ලක්ෂමන් ගේ ව්‍යාපාරික අයිතිය වහාම දිල්රුක්ෂිට පවරන ලෙසට නියෝග කලේය. මේ අනුව ලක්ෂමන්ට ලැබෙමින් තිබූ රුපියල් කෝටි ගණනක කොමිස් මුදල් දිල්රුක්ෂිට හිමි විය.

## ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානය වසා දැමීම සහ ලක්ෂමන් හුළුගල්ල පන්නා දැමීම

සුධර්මා නෙත්තිකුමාරගේ "බූරුපොල" (කැසිනෝ) වැටලූ පොලිස් නිලධාරීන් 23 දෙනා මාරු කිරීමේ අර්බුදය හමුවේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවේ ප්‍රතිරූපයට සිදුවූ කිව නොහැකි අවනම්බුව වසා ගැනීමට අන් මගක් නොවූයෙන් 2013 නොවැම්බර් 01 සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානය විසුරුවා හැරීමට මහින්ද රාජපක්ෂ නියෝග කරනු ලැබීය.

## හුලා වස බොයි

මාධ්‍ය මධයස්ථානය වසා දැමීමෙන් පසුව රැකියාව අහිමි වූ හුලා මානසික රෝගියකු බවට සමාජගත කිරීමට "හුලා" විසින්ම සංවිධානාත්මක ප්‍රචාරක වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කලේය. මෙහි පලමු අදියර වශයෙන් 2013 නොවැම්බර් 22 දා නිදි පෙති බී කොළඹ ලංකා හොස්පිට්ලයට ඇතුලත් කල බව වාර්තා විය. මෙම කරුණ පිළිබඳව මහින්ද රාජපක්ෂ හුලා ගෙන් විමසා සිටි විට ඔහු එය බොරුවක් බව පවසා ඇත. දෙවන වරට මහනුවර වැව පාරේ හෝටලයකදී නිදි පෙති බී 2014 ජනවාරි 26 දා රෝහල් ගත කල බව සියලු මාධ්‍ය වල වාර්තා පල විය. රාත්‍රී 1.30ට පමණ හෝටලයට ලැබුණු දුරකථන ඇමතුමකින් දැනගන්නට ලැබී ඇත්තේ හුළුගල්ල ඉතා අසාධ්‍ය තත්වයකින් හෝටල් කාමරයේ සිටින බවයි. හෝටල් සේවකයින් කාමරයේ දොර කඩා බලන විට හුළුගල්ල අසිහියෙන් පසු වී ඇත. ඇඳ අසල තබා තිබූ බෝතලයක් නම් හමුවී ඇත. හුළුගල්ල නිදි පෙති බී ලංකා හොස්පිට්ල් සිටින විට ඔහුගේ අනියම් බිරිඳ වන සුධර්මා නෙත්තිකුමාර ඔහුගේ ඇඳ අසල සිටි බවද වාර්තා විය.

හුලා මෙම සියලු උප්පරවැට්ටි කරන ලද්දේ රැකියාව අහිමි වීම නිසා තමනට ඇති වූ අවමානය වසා ගෙන නැවත රාජපක්ෂවරුන් අතර වැජඹීමට හා ඉහල ගනයේ තනතුරක් ලබා ගැනීමටය. ඔහුගේ මෙම බොළඳ උත්සාහයෙන් පරාජය වූ විට රාජපක්ෂවරුන්ට තර්ජනය කර ඔවුන්ගේ සියලු නීති විරෝධි ක්‍රියා හෙලි කරන බව ප්‍රකාශ කිරීම නිසා බියට පත් වූ මහින්ද හා ගෝඨා එක්ව හුලාට ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ නියෝජ්‍ය මහ කොමසාරිස් ධූරය ලබා දුනි.

වැස්සකටවත් විශ්ව විද්‍යාලයකට ගොඩ වැදී නැති ලක්ෂමන් විදේශ සේවයේ දෙවන ඉහලම තනතුර ලබා ගැනීමට තරම් පින් කර ඇත. මෙය ලක්ෂමන් ගේ පිනද නැතිනම් දිල්රුක්ෂි රාජපක්ෂවරුන් සමග යහන් ගත වීම නිසා ලැබුනු ප්‍රතිලාභයක්ද යන්න පාඨකයා විසින්ම තේරුම් ගත යුතු කරුණකි. 2015 ජනවාරි 08 සිදුවූ ආණ්ඩු පෙරලියෙන් පසු ලංකාවට පැමිණි හුලා දැනට මහින්ද රාජපක්ෂගේ පක්ෂ කාර්යාලයේ සේවය කරන බව වාර්තාවේ.

# පීබී ජයසුන්දර

මහින්ද රාජපක්ෂ වනචර දසකයේ සිටි ප්‍රබලම රාජපක්ෂ නිළධාරියකු වූ පුංචි බණ්ඩා ජයසුන්දර කුරුණෑගල දිස්ත්‍රික්කයේ උපන් ගැමියෙකී ආචාර්ය උපාධිධාරියෙකු වූ පී.බී. ශ්‍රි ලංකා මහ




දූෂිත ජයසුන්දර

බැංකුවේ නිලධාරියෙකු ලෙස සේවය කර මුදල් අමාත්‍යාංශයේ තනතුරු කිහිපයක් දරා මහින්ද රාජපක්ෂ යුගයේ මුදල් අමාත්‍යාංශ ලේකම් ධූරයකට පත් විය.

මහින්ද පාලන කාලයේ ඉහලම තලයේ දූෂිතයන් වූ ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග, ගාමිණී සෙනරත්, අජිත් නිවාඩ් කබ්රාල් ගණයේම දූෂිත නිලධාරියෙකු වූ පී.බී. ජයසුන්දර 2008 වර්ෂයේ දී ශ්‍රී වරාය අධිකාරියට අයත් ඉඩමක් පවරා දීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය මගින් එවකට අග විනිසුරු වූ අශෝක ද සිල්වා මහතා විසින් යලි කිසි දිනක රාජ්‍ය සේවයේ පත්වීමකට හිමිකම් නොමැතිව සේවයෙන් පහ කරන ලදි. ඊට අමතරව රුපියල් පන්ලක්ෂයක දඩ මුදලක් ගෙවීමට ද නියම කරන ලදි. මෙවැනි දූෂිත නිලධාරියෙකු මහින්ද රාජපක්ෂ 2010 නැවත ජනාධිපති පදවියට පත්වීමෙන් පසුව මුදල් අමාත්‍යාංශයේ ලේකම් ධූරයට පත් කර ගත්තේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අභිබවා යමිනී රාජපක්ෂ වනචර දසකයේ දි ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දු තුට්ටුවකටවත් මායිම් නොකල බව මෙවැනි ඒකාධිපති තීන්දු වලින් මනාව පැහැදිලි වේ.

## දූෂණ වගා කිරීම

මහින්ද රාජපක්ෂ යුගය ජනාධිපති ගේ සිට කාර්යාල කාර්ය සහායකයා දක්වා කොමිස් ගැසීම් අල්ලස් ගැනීම් ආදියෙන් මුලු රාජ්‍ය තන්ත්‍රයම දූෂණයෙන් නාස්තියෙන් අන්ත අගාධයකට රට ගෙන යමින් තිබූ යුගයකි. මෙම සියලු දූෂණ ක්‍රියාවන් නීත්‍යානුකූල හොරකම් බවට පත් කිරීමට අදාල සියලු අනපණත් මහින්දට සකසාදීමට පී.බී. ජයසුන්දර ගෙන් සිදුවූයේ ඉමහත් සේවයකි. මෙම සේවයට ගරු කිරීමක් වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් වරදකරු වී සේවයෙන් නෙරපා දමූ පී.බී. නැවත මුදල් අමාත්‍යාංශයේ ලේකම් ධූරයට පත් කරනු ලබයි. වගකිවයුතු රාජ්‍ය නිළධාරියෙක් ලෙස කටයුතු නොකොට රාජපක්ෂවරුන්මේ අණට කීකරු වී මුලු රාජ්‍ය සේවයම අපකීර්තියට පත් කල නිළධාරියෙක් වශයෙන් පී.බී. ජයසුන්දර ඉතිහාසයට එක්වන ඇත.

ලලිත් වීරතුංග, ගාමිණී සෙනරත්, අනූෂ පැල්පිට දූෂණයට පෙළඹූ පී.බී. - මහින්ද, ගෝඨා, බැසිල්, නාමල්, යෝෂිත ආදී දේශද්‍රෝහීන්ට මහජන මුදල් හිතු මනාපයට ගසා කෑමට ඉඩදී තමන්ද එම දූෂණ වලට උපකාර කොට කෝටි ගණන් මුදල් උපයා ගෙන ඇත.

## රණවිරු නිවාස ව්‍යාපෘතියෙන් කල ගසා කෑම්

තිස් අවුරුදු යුද්ධයකින් පසුව ද්‍රවිඩ කොටි ත්‍රස්තවාදින්ගෙන් රට මුදවා ගත් රණ විරුවන්ට කරන ලද උපහාරයක් වශයෙන් රණවිරු ගම්මාන ඉදිකොට ඔවුනට සහනදායී මිළකට නිවාස තනාදීමේ ව්‍යාපෘතියක් ආරම්භ කෙරිණ. මෙම නිවාස ව්‍යාපෘති තැනීමේ කොන්ත්‍රාත් මුදලට රුපියල් ලක්ෂ 5 වැඩිපුර දමා නිවාස 14000 ඉදිකිරීමෙන් මිලියන 7000ට වඩා කොමිස් මුදල් පී.බී. ජයසුන්දර ලබා ගත් බවට තොරතුරු ප්‍රසිද්ධ වී තිබුනි.

අජිත් නිවාඩ් කබ්රාල් සමග එකතු වී කරන ලද මුදල් වංචා පිළිබඳව පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාශය විමර්ශන කටයුතු කරන අතර, එම තොරතුරු අනුව රාජපක්ෂ මාෆියාවේ සිටි ගෝඨාභය, බැසිල්, නාමල්, ලලිත්, අනූෂ, ගාමිණී සෙනරත් ඇතුලු ජාතික ධනය සොරා කෑ බොහෝ පිරිස් සමග පී.බී. ජයසුන්දර ඉතාම සමීප සබඳතා පවත්වා ගෙන ඔවුනට උදව් උපකාර කල බවටත් කරුණු අනාවරණය වී ඇත.

ජෝන් කීල්ස් සමාගම ඉඩම් පැවරීමේ දී "පර්ත්" කමිටුවේ සභාපති වරයා වශයෙන් කටයුතු කල පී.බී. ජයසුන්දර මහා භාණ්ඩාගාරයට යැවීමට නියමිත මිලියන 1190 මුදලක් වංචා කර ඇති බවට කරුණු අනාවරණය වෙමින් පවතී.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පුද්ගලීකරණය කොට විකිනීමේ දී ශ්‍රී ලංකා රජයට රුපියල් බිලියන ගණනක පාඩුවක් කර ඇති බව වාසුදේව නානායක්කාර මහතා ගොනු කල පෙත්සම් විභාග කර බැලීමේ දී අනාවරණය විය. මෙම දූෂිත ගනුදෙනුව සම්බන්ධව සෘජුව මැදිහත් වී ඇත්තේ පී.බී. ජයසුන්දර මහතාය.

ලංකා පුත්‍ර බැංකුව මගින් රාජපක්ෂවාදීන්ට ලබා දී ඇති රුපියල් මිලියන 5000කට වඩා ණය මුදල් ආපසු ලබා ගැනීමට නොහැකි වී ඇත. නාමල්, ගෝඨා, බැසිල් ආදීන් ගේ අණ කිරීම් අනුව ලබා දී ඇති මෙම මුදල් කන්දරාව මහජනතාවගේ මුදල් වන බැවින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් ධූරය දරූ පී.බී. ජයසුන්දර මෙම දූෂණ වලට වගකිව යුතුය. මහජන මුදල් සොරා කෑ රාජපක්ෂ පරපුර දූන් අධිකරණය ඉදිරියට පැමිණවීමට යහපාලන ආණ්ඩුවට හැකියාව ලැබී ඇත. මොවුන් දූෂණයට පෙළඹ වූ අන්ත දූෂිත රජයේ උසස් නිලධාරියෙකු වූ පී.බී. ජයසුන්දර අධිකරණයට ඉදිරියට පමුණුවා ජනතා දේපල සොරා කෑමේ වරදට දඬුවම් ලබා දිය යුතුය.

# හිටපු අග විනිසුරු සරත් නන්ද සිල්වා

ලංකාවේ අධිකරණ ඉතිහාසයේ දක්නට ලැබෙන ඉතාමත්ම අප කීර්තිමත් නින්දා සහගත ක්‍රියාවන්හීයෙදී ලංකාවේ අධිකරණ පද්ධතිය අපවිත්‍ර කල අගවිනිසුරුවරයකු වශයෙන් සරත්නන්ද සිල්වා හැඳින්වීම නිවැරදිය.



*සරත් නන්ද සිල්වා: කපටි ආරක්ෂකයා*

ඹහින්ද රාජපක්ෂගේ අතිජාත මිත්‍රයකු වූ සරත් සිල්වා මහින්ද හා ශිරන්ති ගේ විවාහයේ කපුවා වශයෙන් ද හැඳින්වේ මහින්ද රාජපක්ෂ ශිරන්ති බැලීමට පලමු වරට ගොස් ඇත්තේ සරත් සිල්වා සමගය. චන්ද්‍රිකා කුමරාතුංග ජනපතිනිය සරත් සිල්වා අග විනිසුරු පදවියට පත් කරනු ලැබුවේ ඔහුට වඩා ජ්‍යෙෂ්ඨ ඉතාමත් කීර්තිමත් නීති විශාරදකයකු වූ මාක් ප්‍රනාන්දු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයාට විනිසුරු තනතුර අහිමි කරමිනි. එහෙත් පසු කාලයකදී මහින්ද සමග එකතු වී සරත් සිල්වා චන්ද්‍රිකාට එරෙහිව කටයුතු කලේය.

චරිතය අතින් මහින්දට දෙවැනි නොවූ සරත් සිල්වා තරුණ නීතිඥවරියන්, මහේස්ත්‍රාත්වරියන් ඔහුගේ කාම ආශාවන් සන්තර්පනය කිරීම සඳහා යොදවා ගත් අවස්ථා බොහෝමය. කෝට්ටේ පාර්ලිමේන්තු මාවතේ තරුණ නීතිඥවරියක සමග සන්ධ්‍යා කාලයේ දී අවිනීත ලෙස හැසිරෙමින් සිටියදී පොලිස් පරීක්ෂාවට ලක් වූ අවස්ථාවේ දී තමන් අගවිනිසුරුවරයා බව පොලීසියට ප්‍රකාශ කල බව එම පරීක්ෂණය සිදු කල පොලිස් නිළධාරීන් වාර්තා කර ඇත. මෙබඳු අවලම් ක්‍රියා පමණක් නොව ජයසේකර නම් ඉංජිනේරුවරයකු ගේ බිරිඳ සමග අයථා සම්බන්ධයක් පවත්වා ගෙන ගිය අතර, එම ඉංජිනේරුවරයා මොහුට විරුද්ධව නඩුවක් පැවරූ විට එම නඩුව විභාග කල මහේස්ත්‍රාත්වරයාට බලපෑම් කොට එම සිද්ධිය යට ගසා දැමීමට කටයුතු කලේය.

මහින්ද රාජපක්ෂ සුනාමි වලට ලැබුනු රුපියල් මිලියන 80ක මුදලක් වංචා සහගතව ඔහුගේ පෞද්ගලික ගිනුමකට බැර කර ගත් අවස්ථාවේ පාර්ලිමේන්තු මන්ත්‍රී කබීර් හෂීම් එයට විරුද්ධව

ශ්‍රේෂ්ඨිකරණයට පෙත්සමක් ඉදිරිපත් කල අවස්ථාවේ දී මහින්ද රාජපක්ෂට පක්ෂපාතීව විනිශ්චය ලබාදීම නිසා මහින්ද රාජපක්ෂට ජනපතිවීමේ අවස්ථාව හිමිවිය. ඒ අවස්ථාවේදී සරත් සිල්වා අග විනිසුරු වශයෙන් නීතිය සාධාරණ ලෙස ක්‍රියාත්මක කලේ නම් රාජපක්ෂ පරම්පරාවෙන් ලංකාවට සිදුවී ඇති ඉතා භයානක අවාසනාවන්ත තත්වය උග්‍ර නොවනු ඇත.

සරත් සිල්වා මහින්ද රාජපක්ෂට එරෙහිව පසුගිය කාලයේ දේශපාලන කටයුතු වල යෙදුනු අතර මහින්ද රාජපක්ෂ සුනාමි අරමුදල් වංචාවෙන් බේරා ඔහුට ජනාධිපතිවරණයට ඉදිරිපත්වීමට අවස්ථාව ලබාදීම ගැන ප්‍රසිද්ධියේ ජනතාව ගෙන් සමාව ඉල්ලා සිටියේය මෙවැනි අවලම්, නින්දිත, වංක පුද්ගලයකු විසින් රටේ අගවිනිසුරුවරයා වශයෙන් ලබා දී ඇති නඩු තීන්දුවල සාධාරණත්වය හා වලංගුභාවය පිළිබඳව නැවත නිරීක්ෂණයක් කිරීම අත්‍යවශ්‍යය කරුණකි.

"රාවය" පුවත්පතේ කර්තෘ වික්ටර් අයිවන් සරත් සිල්වාගේ අවලම්, නින්දිත ක්‍රියා පිළිබඳව බොහෝ කරුණු අනාවරණය කර ඇති බැවින් සරත් සිල්වා විසින් දෙන ලද නඩු තීන්දු නැවත විමර්ෂණය කිරීම අත්‍යවශ්‍යය කරුණකි.

2015 ජනාධිපතිවරණයේ දි පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන ගේ සහ රාජපක්ෂ සහ රාජපක්ෂ පවුලේ පැටිකිරිය නිර්දය ලෙස විවේචනය කල සරත් සිල්වා යහපාලන ආණ්ඩුවෙන් තමා බලාපොරොත්තු වූ තනතුරු කිසිවක් නොලැබීම නිසා අද නැවතත් මෛත්‍රී - රනිල් ආණ්ඩුවට එරෙහිව මහින්දගේ වේදිකාවල මහින්දගේ ගුණ ගයමින්සිටී. තමාගේ වාසියට කිසිඳු ප්‍රතිපත්තියක් නැතිව එක් එක් දේශපාලන නායකයන්ට ගොටු ඇල්ලීමට සරත් නන්ද සිලවා පත්වූයේ ඇයිද යන්න ප්‍රේහෙලිකාවකි.

# හඩ්සන් සමරසිංහ (හඩ්ඩා)

හඩ්සන් සමරසිංහ පිළිබඳව මෙම ග්‍රන්ථයේ සටහනක් නොතැබුවහොත් රාජපක්ෂ වනචර දසකයේ සිටි වසලයෙක් පිළිබඳව ජනතාවට කරුණු අනාවරණය කිරීමේ අවස්ථාව මග හැරීමක් වනු ඇති


හඩ්ඩා

ලංකාවේ මාධ්‍ය සමාජයේ "හඩ්ඩා" නමින් හඳුන්වන මෙම වසලයා උත්පත්තියෙන්ම ගෙන ආ පහත් ගතිගුණ ඔහුගේ අවසාන කාලය දක්වා පවත්වා ගෙන ආ පුද්ගලයෙකි.

මහනුවරට ආසන්න පිළිමතලාව ග්‍රාමයේ උපත ලබා කොළඹට සංක්‍රමණය වී කුඩාකල සිටම අගනුවර පංසල්වල ඇබිත්තයකු ලෙස ජීවිතය ආරම්භ කර ඇත. තතුදත් ආරංචි වලට අනුව ඇල්ලේ ගුණවංශ හිමියන් පංසල්වල ජීවිතයෙන් වැඩි කාලයක් ගත කර ඇත. අධ්‍යාපනය පිළිබඳව ලැබී ඇති තොරතුරු අනුව විදුලකර සරසවියේ උපාධියක් තිබෙන බව දක්වා ඇතත් සමකාලිනයන් පිළිබඳව කිසිදු තොරතුරක් නැත.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ නිවේදකයකු වශයෙන් වෘත්තීය දිවිය ආරම්භ කල මොහු එම සංස්ථාවේ සභාපති ධූරය දක්වා ගමන් කිරීමට හැකි වූයේ උත්පත්තියෙන්ම ලබා තිබූ හැකරකට නිසාය. ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ අග්‍රපුරෝහිතයකු වූ මොහු ජනතාව අතර "පුංචි ප්‍රේමදාස" යන නාමයක්ද ආරූඪ කර ගෙන තිබුනි. ප්‍රේමදාස මහතාගේ පිහිටෙන් දේශපාලනයට පිවිසි මොහු වරක් ජනාධිපති අපේක්ෂකයකු වශයෙන් ද ඉදිරිපත් විය.

එක්සත් ජාතික පක්ෂයෙන් සිය ආර්ථික දියුණුව ලබා ගත් මෙම කෙළෙහි ගුණ නොදත් අධමයා ජීවිතයේ අවසාන කාලය මහින්ද රාජපක්ෂගේ සට්ටැඹියකු බවට පත්විය. පෞද්ගලික ජීවිතය දෙස විමසා බලන විට මොහු විවාහ චෝදනාවකට ලක් වී ඇති පුද්ගලයෙකි. දෙවන විවාහයේ බිරිඳට ලැබුනු පුතා දැනට පේරාදෙණියේ ජීවත් වෙයි.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපති පදවියට පත් වුවද වසල ගති අත්හැරීමට නොහැකි වූ මොහු මහින්ද රාජපක්ෂ වනචර දසකයේ දී මහින්ද වෙනුවෙන් ඉතාමත් අශීලාචාර ලෙස රජයේ මාධ්‍ය ආයතනයක් වන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව වෛශ්‍ය වෘත්තියේ යෙදවූ මරාවාදියෙකු විය.

සමාජයේ ඉතා වැදගත් පුද්ගලයින්ට ඉතා වනචර අන්දමින් බැණ වදිමින් ගුවන්විදුලි වැඩ සටහන් මෙහෙය වීම මොහු ගේ පුරුද්දක් විය. මාදුළුවාවේ සෝභිත හිමියන්ට "සෝභිතයා" යනුවෙන් ඉතා අපහාසාත්මක ලෙස අමතමින් මහින්ද රාජපක්ෂ ගේ දේශපාලන ප්‍රචාරක කටයුතු ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් කරනු ලැබීය. මයික්‍රපෝනයක් ලැබුනු විට වඳුරාට දැලි පිහිය ලැබුනා සේ කිසිදු විපරමකින්, අවබෝධයකින් තොරව වාචාල කතා කිරීම මොහුගේ පුරුද්දක් විය. ලෝකයේ පිළිගත් මාධ්‍ය චාරිත්‍රවලට කිසිදු සැළකිල්ලක් නොදක් වූ හඩසන් මහින්ද රාජපක්ෂ ගේ අසූචි පවා සුවඳ බව පවසමින් දවසේ පැය 24 පුරාම රාජපක්ෂ ජුන්ටාව වර්ණනා කරමින් ජනතාව නොමග යැවීය.

අපවත් වී වදාල මාදුළුවාවේ සෝභිත ස්වාමීන් වහන්සේ හඩසන් ගැන කියූ වදනකින් හඩ්ඩා පිළිබඳ කෙටි විස්තරය අවසන් කරමු.

"යහපාලන ආණ්ඩුව වෙන මොනවා නොකෙරුවත් මේ මිනිහාගේ කට වැසීම පමණක් ප්‍රමාණවත් වේ."

හා... හා... බලාගෙනයි...



# 11

# ආගම තුලින් දේශපාලන බලය තහවුරු කර ගත් හැටි

මහින්ද රාජපක්ෂ ගේ දේශපාලන ප්‍රවර්ධන ව්‍යාපෘති ප්‍රධාන අංශ කිහිපයක් යටතේ ඉතාම මනා ලෙස සංවිධානය කර තිබුනි. විශේෂයෙන්ම මහින්ද සිංහල බෞද්ධ සමාජ කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන දේශපාලනඥයෙකි ශ්‍රීලනිප සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච මහා බලවේගය මත ගොඩ නැගුන පක්ෂයක් වශයෙන් අතීතයේ දී හැඳින්වුවද මහින්ද යටතේ එය වෙනස් ස්වරූපයකින් ක්‍රියාත්මක විය.

## මහානායක වරුන්ට බෙන්ස් රථ දන්දීම

ත්‍රෛනිකායික මහා නායක ස්වාමීන් වහන්සේලාට අවුරුදු පතා නවීන බෙන්ස් රථ රජයේ වියදමින් ලබාදී මහා නායක හිමිවරුන් මගින් බෞද්ධ සමාජයේ සහයෝගය ලබා ගැනීමට ඉතා සූක්ෂම ලෙස වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළේය. මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ පවුලේ උදවිය කරන ලද මිනීමැරුම් හා රජයේ දේපල අවභාවිත කිරීම පිළිබඳව මහජන උද්ඝෝෂණ ඇතිවීම වැලැක්වීම මෙම වැඩ පිලිවෙලේ යටි අරමුණ විය.

මහින්ද ශ්‍රී ලංකාවේ පහල වූ රාජ්‍ය නායකයින් අතර බෞද්ධ මහෝපාසක ලෙස නායක හිමිවරුන් ලවා ප්‍රකාශ කරවා ගෙන එමගින් බෞද්ධ ජනතාවගේ ඡන්ද ලබා ගැනීමට මුලු දිවයිනම තමාගේ අනුගාමික හිමිවරුන් පත්කර තිබුනී ඔවුනට ජනාධිපති සම්බන්ධීකරණ ලේකම් ආදි තනතුරු ප්‍රදානය කොට වැටුප් හා වාහන ලබා දී තිබුනි.

## භික්ෂූන් දේශපාලන ආවතේව කාරයින් කර ගැනීම

බෙලිඅත්ත ආසනයේ මහින්ද ගේ ආගමික සම්බන්ධීකරණ කටයුතු සඳහා පත් කර තිබූ ගැටමාන්නේ හිමියන්ට ජනාධිපති කාර්යාලය මගින් ලබාදී තිබූ මොන්ටේරෝ වාහනයට ගෙවූ මාසික කුලිය පමණක් රුපියල් 175,000/-කී මීට අමතරව සීමාවකින් තොරව ඉන්ධන හා රියදුරෙකුද ලබා දි තිබුනි.

අභයාරාම වාසී මුරුත්තෙට්ටුවේ ආනන්ද, මැදගොඩ අභයතිස්ස, කඹුරුගමුවේ වජිර, බෙංග මුවේ නාලක, ගලගොඩඅත්තේ ඥාණසාර, ඉත්තෑකන්දේ ධම්මාලංකාර, උඩුවේ ධම්මාලෝක ප්‍රධාන තෝරාගත් ස්වාමීන් වහන්සේලාට මහින්ද රාජපක්ෂ වරදාන▫ වරප්‍රසාද පමණක් නොව රජයේ සම්පත් යොදවා කෝටි ගණනින් වටිනා වාණිජ වටිනාකමකින් යුත් ගොඩනැගිලි රාශියක් ඉදි කර දී ඇත.

## මුරුත්තෙට්ටුවේ ආනන්ද

නාරාහේන්පිට අභයාරාමය බලහක්කාරයෙන් අල්ලා ගෙන සිටින බව එම විහාරස්ථානයේ නියම අයිතිය ඇති ස්වමීන් වහන්සේ නඩු පවරා ඇත. අභයාරාමය මහින්ද රාජපක්ෂ ගේ දේශපාලන සාකච්ඡා රැස්විම් පැවැත්වීමේ මධ්‍යස්ථානයක් වශයෙන් භාවිතා කරයි. මුරුත්තෙට්ටුවේ හිමියන් රුපියල් කෝටි 120ක් පමණ මහින්ද රාජපක්ෂ රජය විසින් වන්දි වශයෙන් ලබාදීමට කළගුණ

සැලකීමට මෙම ස්ථානය මහින්ද ගේ දේශපාලන ප්‍රවර්ධන කටයුතු සඳහා ඉඩ දී ඇති බව පැහැදිලි කරුණකි.

## මැදගොඩ අභයතිස්ස

මැදගොඩ අභයතිස්ස හිමියන්ටද මහින්ද හා ගෝඨාභය මහජන මුදල් කෝටි ගණනක් වැය කොට තෙමහල් ගොඩනැගිලි කිහිපයක් ඉදි කරදී ඇත. බෞද්ධ වෙහෙර විහාර දියුණු කිරීමේ මුවාවෙන් රාජපක්ෂ පරපුරට බැල මෙහෙවරකම් කරන තෝරා ගත් භික්ෂූන් කිහිප දෙනෙකුට මහජන මුදල් වැය කර ඇත.



වෙහෙර විහාර පූජාවක්

## ආගම් භේද ඇති කිරීම

මෑත කාලයේ සමාජයේ දැඩි කතාබහට භාජනය වූ ගලගොඩඅත්තේ ඥාණසාරද රාජපක්ෂවරුන් වෙනුවෙන් බුදුදහමට නිගා දෙමින් ක්‍රියාකල චීවරධාරියෙකි මොහු බීමතින් වාහනයක් පදවා ත්‍රීරෝද රියදුරෙකුට බරපතල තුවාල සිදුකල නිසා අධිකරණයෙන් දඬුවම් ලැබූවෙකි. මෙම චීවරධාරියා පසුගිය රාජපක්ෂ පාලන සමය තුලදී ගෝඨාභය රාජපක්ෂ ගේ අනුග්‍රහයෙන් බොදු බල සේනා සංවිධානය නමින් අන්ත ජාතිවාදී සංවිධානයක් පිහිටුවා ගෙන මෙරට මුස්ලිම් ජනතාවට හා අන්‍ය ආගමික පූජකවරුන්ට පහරදීම් මුස්ලිම් ව්‍යාපාරික ස්ථාන ගිනිබත් කරමින් සිංහල ජාතියටත්, බෞද්ධ ආගමටත් නිගා දෙමින් අන්ත මැරවරයකු ලෙස කටයුතු කලේය. අන්‍ය ආගමික පූජකවරුන්ට පමණක් නොව තමාගේ අනසක පිළිනොගන්නා බෞද්ධ භික්ෂූන් වහන්සේලා රාශියකටද පහරදීම් නිසා නඩු රාශියකට මුහුණ දීමට සිදුවී ඇත. ගෝඨාභයගේ රාජ උණ්ණය වැදීමෙන් උමතු වී ඇති මෙම චීවරධාරියා මෙරට සිංහල, මුස්ලිම් සමගිය බිඳ දැමීමට පසුගිය දස වසරක පමණ කාලය තුල සිදු කර ඇති හානිය අති මහත්ය. රණවිරුවන් වෙනුවෙන් පුහු ඝෝෂා පවත්වමින් බොරු වීරයකු වීමට අධිකරණයට කඩා පැන විනිසුරුවරුන්ට තර්ජනය කිරීම නිසා රිමාන්ඩ් බන්ධනාග ාරගතව ඇප පිට නිදහස් වී සිටියද අධිකරණය මගින් මෙම කරුණු විභාග කිරීමෙන් අනතුරුව නියත වශයෙන්ම සිර දඬුවම් විඳීමට සිදුවනු ඇත. විනිසුරු වරයකුට විවෘත අධිකරණයේ දී තර්ජනය කොට තමන් චීවරධාරීන් කිහිපදෙනෙක් සමග හෝමාගම උසාවියට කඩා වැදීම ලංකා ඉතිහාසයේ ප්‍රථම වරය සිදුවී සිදුවීමක් ලෙස සඳහන් කල හැකිය.

